سنهالي




# මින්හාජ්

## ඔබේ ගමන ඇරඹෙයි....

ඉස්ලාම් දහම තුළ තම නව ජීවිතය ආරම්භ කරන අය සඳහා වන ප්‍රායෝගික මාර්ගෝපදේශ පොතකි.

ලතීෆා නාසර් අල් සර්ද්

# මින්හාජ්

## ඔබේ ගමන ඇරඹෙයි....

ඉස්ලාම් දහම තුළ තම නව ජීවිතය ආරම්භ කරන
අය සඳහා වන ප්‍රායෝගික මාර්ගෝපදේශ පොතකි.


**Compiled by:**

**Latifa Nasser Al Saeed**

**Translated by:**

**Rimzan Ishak**

**Proofreader:**

**Sumaiya M. Feroze**



**2026**

# කර්තෘ පිළිබඳව

කතුවරිය ඉගැන්වීමේ ක්ෂේත්‍රයේ වසර 45 කට වැඩි පළපුරුද්දක් ඇති ප්‍රවීණ අධ්‍යාපනඥයක් සහ විෂයමාලා සංවර්ධකියකි. නවක මුස්ලිම්වරුන්ට සහ ඉංග්‍රීසි කතා කරන මුස්ලිම් ප්‍රජාවන්ට මග පෙන්වීම සහ අධ්‍යාපනය ලබා දීම සඳහා වසර 27 ක කාලයක් කැප කර ඇත්තේය. ඇය ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය හදාරා උපාධිය ලබා ඇති අතර අල්-අස්හර් විශ්ව විද්‍යාලයේ විද්වතුන් යටතේ ඉස්ලාමීය විද්‍යාවන් හැදෑරුවාය. ඇයගේ කාර්යය විවිධ මට්ටම්වල ඉගෙනුම් ලබන්නන් සඳහා පැහැදිලි, අව්‍යාජ සහ පහසුවෙන් තේරුම් ගත හැකි ඉස්ලාමීය අන්තර්ගතයන් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමයි.

කුරානය කියවීමට ඉගෙන ගන්න

පියවරෙන් පියවර වුදු කිරීම

සලාහ් ඉටු කරන ආකාරය

# පටුන

**හැඳින්වීම .................................................................... 7**
ඉස්ලාම් යනු කුමක්ද? ........................................................................ 8
අපගේ ජීවිතයේ අරමුණ ........................................................................ 9

**1 වන පරිච්ඡේදය - විශ්වාසය ..................................................... 11**

විශ්වාසයේ සාක්ෂිය: අෂ් - ෂහාදා ........................................................ 13

ලා ඉලාහ ඉල්ලල්ලාහ් - (අල්ලාහ් ﷻ හැර වෙනත් දෙවියෙකු නැත) යන්නෙහි අවශ්‍යතාවයන් .......... *13*
මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණෝය යනුවෙන් පිළිගැනීමේ අවශ්‍යතා ........................ 14

**2 වන පරිච්ඡේදය .................................................................. 15**

අල්ලාහ් ﷻ කෙරෙහි විශ්වාසය ........................................................ 16
දේවදූතයන් කෙරෙහි විශ්වාසය ........................................................ 20
අල්ලාහ්ගේ ﷻ ග්‍රන්ථ කෙරෙහි විශ්වාසය ........................................... 20
අල්ලාහ්ගේ දූතයින් කෙරෙහි විශ්වාසය ............................................... 21
අවසාන දිනය කෙරෙහි විශ්වාසය ...................................................... 22

**3 වන පරිච්ඡේදය - පවිත්‍රතාවය (තහාරා) ........................................ 25**

ඉස්ලාමයේ පවිත්‍රතාවය (තහාරා) යන්නෙහි තේරුම ................................... 25
භෞතික අපවිත්‍රතාවය (නජාසා) ........................................................ 25
චාරිත්‍රානුකූල අපවිත්‍රතාව (හදස්) ..................................................... 26
වුදූහි පියවර .......................................................................... *27*
වුදූහි මහිමය .......................................................................... 29

**4 වන පරිච්ඡේදය – නැමදුම (සලාතය) ............................................ 32**

ඉස්ලාමයේ සලාතයේ (යාඥාවේ) වැදගත්කම ............................................ 33
සලාතයේ ආනිසංසය ................................................................... 34
සලාතයේ කොන්දේසි ................................................................... 35
සලාතය ඉටු කිරීමේ පියවර ............................................................ *37*

සලාතයට කැඳවීම (අදාන්) .............................................................. 42

**5 වන පරිච්ඡේදය – සකාත් ............................................................ 48**

සකාත් යනු කුමක්ද? ..... 50
සකාත් වැදගත් වන්නේ ඇයි ? ..... 50
සකාතය සඳහා අනිවාර්ය වන වස්තූන් වර්ග ..... 51
සකාත් ලැබිය යුත්තන් ..... 53
**6 වන පරිච්ඡේදය - උපවාසය ..... 54**
උපවාසය යනු කුමක්ද? ..... 55
උපවාසයේ මහිමය ..... 55
උපවාසය බිදෙන කරුණු කුමක්ද? ..... 56
සකාත් අල්- ෆිත්ර් ..... 57
උපවාසය අවසන් කිරීමේ උත්සවය (ඊද්-උල්-ෆිත්ර්) ..... 58
**7 වන පරිච්ඡේදය - වන්දනා ගමන (හජ්) ..... 59**
හජ් : මක්කා වෙත යන වන්දනා ගමන- ..... 60
හජ් වන්දනාවේ ගුණධර්ම ..... 60
හජ් වන්දනාවේ අරමුණු ..... 61
පරිත්‍යාගයේ උත්සවය (ඊදුල් අද්හා) ..... 62
උම්රා ..... 63
8 වන පරිච්ඡේදය- **මුහම්මද් ﷺ තුමාණන්** - අවසාන දූතයාණන් ﷺ තුමාණන්ගේ කෙටි චරිතාපදානය ..65
නබි තුමාණන්ගේ උපත සහ මුල්අවධිය ..... 66
ඉස්ලාමයට පෙර මක්කම සමාජයේ තත්ත්වය ..... 66
එතුමාගේ දූත මෙහෙවර ..... 67
එතුමාගේ සංක්‍රමණය ..... 68
එතුමාණන් මදීනා ජීවිතයේදී මුහුණ දුන් අභියෝගයන් ..... 68
එතුමාගේ අභාවය ..... 69
**9 වන පරිච්ඡේදය - විශ්වාසයේ ක්‍රියාවන් ..... 70**
සදාචාරාත්මක චරිතය ..... 72
ඉස්ලාමීය ඇඳුම් පැළඳුම් කේතය ..... 82
ඉස්ලාමීය පවුල් සංකල්පය ..... 82
විවාහය ..... 84
ආහාර පාන ..... 92
මූල්‍ය ගනුදෙනු ..... 94
අල්කුර්ආනයේ පරිවර්තනය ..... 97
මූලාශ්‍ර ..... 102

# හැඳින්වීම

අර්ථවත් සාමකාමී සහ සදාකාලික සාර්ථකත්වය කරා යන ජීවිතයකට තැබූ ප්‍රබල පියවරක් වන ඉස්ලාමය වැළඳ ගැනීම පිළිබඳව අප ඔබ වෙත අවංක සුබපැතුම් පිරිනමන්නෙමු. සැබවින්ම ඉස්ලාම් දහමට ඇතුළු වීම යනු ඔබේ මැවුම්කරු හඳුනාගැනීම ඔබේ ආත්මය පෝෂණය කිරීම සහ දිව්‍යමය ප්‍රඥාවෙන් මඟ පෙන්වන මාවතක ගමන් කිරීමේ සුන්දර ගමනක ආරම්භයයි.

මුස්ලිම්වරයෙකු වීම යනු අවසානය නොව, ඇදහිල්ලෙන් වර්ධනය වීමටත්, සත්‍යය රැක ගැනීමටත් සහ ඉස්ලාමය උගන්වන උතුම් චරිත ලක්ෂණ තමා තුළ ගොඩනගා ගැනීමටත් ජීවිත කාලය පුරාම කරන කැපවීමක ආරම්භයයි. නව මුස්ලිම්වරයෙකු ලෙස, ඔබ දැන් ජාතිය, භාෂාව සහ ජාතිකත්වය ඉක්මවා ගිය ගෝලීය සහෝදරත්වයක කොටස්කරුවෙකි  ඔබ සැම එකම දෙවියන් අල්ලාහ් ﷻ කෙරෙහි ඇති විශ්වාසයෙන් සහ අනාගතවක්තෘ මුහම්මද් නබි ﷺ තුමාණන් හරහා මනුෂ්‍ය වර්ගයා වෙත එවන ලද අවසාන පණිවිඩයෙන් ඒකාබද්ධ වී ඇත්තෙමු.

ඔබේ විශ්වාසය ස්ථිරව තබා  ගෙන, විශ්වාසවන්තව අවංකව, නිහතමානීව සහ දයාන්විතව, ජීවත් වූ ධර්මිෂ්ඨයන්ගේ ආදර්ශය අනුගමනය කිරීමට උත්සාහ දරන ලෙසත් අපි ඔබව දිරිමත් කරන්නෙමු. ඔබගේ චරිතය, ක්‍රියාවන් සහ තේරීම් යනාදිය ඔබට දැන් ගැඹුරු අර්ථයක් පිළිබිඹු කරන අතර, ඉගෙනීමට සහ එය තවත් වැඩිදියුණු කර ගැනීමට ඔබ දරන සෑම උත්සාහයක්ම ඔබව අල්ලාහ්ගේ ﷻ දයාවට සහ ආශිර්වාදයට ඔබව සමීප කරවනු ඇත.

ඔබගේ නව ගමන සඳහා ප්‍රායෝගිකව සහ පහසුවෙන් අනුගමනය කළ හැකි පරිදි ඔබේ සහායකයකු ලෙස සේවය කිරීමට මෙම මාර්ගෝපදේශ පොත ඉතා සකසීරුවෙන් සකස් කර ඇත්තෙමු.

අල්ලාහ් ﷻ ඔබට ආශිර්වාද කරත්වා, ඔබට මඟ පෙන්වත්වා, දැනුමෙන් හා විශ්වාසයෙන් ඔබව වර්ධනය කරත්වා.

ඉස්ලාමය වෙත සාදරයෙන් පිළිගනිමු.
නිවසට සාදරයෙන් පිළිගනිමු.

# හැඳින්වීම



# හැඳින්වීම

## ශ්‍රේෂ්ඨතම ආශිර්වාදය: ඉස්ලාම්

දෘෂ්ටිය, ශ්‍රවණය, සෞඛ්‍යය සහ බුද්ධිය වැනි ගණන් කළ නොහැකි ආශිර්වාද රාශියක් අල්ලාහ් ﷻ අපට ලබා දී ඇත. කෙසේ වෙතත්, මේ සියල්ල අතරින්, මෙලොව සහ පරලොව යන දෙකෙහිම සදාකාලික සතුට සහ අභ්‍යන්තර ශාන්තිය සැබවින්ම උදා කර දෙන උතුම්ම දායාදය වන්නේ මුස්ලිම්වරයෙකු වීමේ භාග්‍යයයි. අල්ලාහ් ﷻ ඔහුගේ මහා කරුණාවෙන් අපව නොදැනුවත්කම නමැති අන්ධකාරයෙන් මුදවා විශ්වාසයේ ආලෝකය කරා මඟ පෙන්වා ඇත . එමෙන්ම ඔහුට කිසිදු හවුල්කරුවෙකු ආදේශ නොකර, සත්‍යය වෙත සහ ඔහුට පමණක් වන්දනාමාන කිරීමේ මාවත කරා අපව යොමු කළේය.

## ඉස්ලාම් යනු කුමක්ද ?

ඉස්ලාමය යනු 7 වන සියවසේදී අරාබිකරයෙන් ආරම්භ වූ ඒකදේවවාදී ආගමකි. ඉස්ලාම් යන වචනයේ තේරුම අල්ලාහ්ගේ (දෙවියන්) කැමැත්තට යටත් වීම හෝ අවනත වීම යන්නයි. මුස්ලිම්වරු එකම දෙවියෙකු විශ්වාස කරන අතර ඉබ්‍රාහිම් (ඒබ්‍රහම්), මූසා (මෝසෙස්) සහ ඊසා (ජේසුස්) ඇතුළු අනාගතවක්තෘවරුන්ගේ පෙළපතේ අවසාන පණිවිඩකරුවා ලෙස සැලකෙන මුහම්මද් ﷺ නබිතුමාගේ ඉගැන්වීම් අනුගමනය කරති.

ඉස්ලාමයේ ශුද්ධ වූ ග්‍රන්ථය අල්-කුර්ආනය වන අතර, එය මුස්ලිම්වරුන් විශ්වාස කරන්නේ අල්ලාහ් ﷻ' තම අනාගතවක්තෘ මුහම්මද් ﷺ තුමාට හෙළි දරව් කළ වාචික වචනය බවයි.

## අපගේ ජීවිතයේ අරමුණ

මිනිස් ජීවිතයේ ප්‍රධාන අරමුණ අල්ලාහ්ට නමස්කාර කිරීම බව අකුර්ආනය උගන්වයි. මම ජින්වරුන්ව හා මිනිසුන්ව, මාව නැමදුම් කිරීම පිණිස හැර නොමැව්වෙමි. (51:56)

කෙසේ වෙතත්, ඉස්ලාමයේ, නැමදුම (ඉබාදා") ක්‍රියාවලිය, සලාතය, උපවාසය, සකාතය හෝ ලෞකික සැප අත්හැරීම වැනි චාරිත්‍ර වාරිත්‍රවලට පමණක් සීමා නොවේ. ඒ වෙනුවට, එය අල්ලාහ්ගේ මග පෙන්වීමට අනුකූලව සමබර ජීවිතයක් ඇතුළත් පුළුල් සංකල්පයකි.

ඉස්ලාමය යනු විශ්වීය ආගමකි මන්ද එහි නබිතුමාණන් ලෝකයේ සියලුම ජනයා වෙත එවනු ලැබූ බැවිනි. එම නිසා ඉස්ලාමය සියලු මානව සම්ප්‍රදායන්ට ගරු කරන අතර නව මුස්ලිම්වරුන්ගේ සම්ප්‍රදායන් ඉස්ලාමීය ඉගැන්වීම්වලට පටහැනි නොවන්නේ නම් ඒවා වෙනස් කරන ලෙස බලකරන්නේ නැත.

## දෙවියන් සහ මිනිසා අතර අතරමැදියන් නැත

මිනිසුන් සහ දෙවියන් අතර අතරමැදියන් අවශ්‍ය වේ යන මතය ඉස්ලාම් දහම ප්‍රතික්ෂේප කරයි. ඇතැම් පුද්ගලයන්ගේ අතේ අධ්‍යාත්මික බලය පවරන සමහර ආගම් මෙන් නොව, සෑම පුද්ගලයෙකුටම අල්ලාහ් ﷻ වෙත සෘජුවම හැරවිය හැකි බව ඉස්ලාම් ධර්මය උගන්වයි. නැමදුම් ක්‍රියාවලිය, සමාව දීම සහ ගැලවීම වෙනත් කිසිවෙකු මත රඳා නොපවතී. අල්ලාහ් ﷻ තම සේවකයන්ගේ යාච්ඤාවලට සවන් දෙන අතර අතරමැදියන්ගේ අවශ්‍යතාවයකින් තොරව ඒවාට ප්‍රතිචාර දක්වයි. සමාව ලබා දෙන්නේ අල්ලාහ් ﷻ විසින් පමණක් වන අතර, ඔහුගේ කැමැත්තට බලපෑම් කිරීමට කිසිවෙකුට විශේෂ බලයක් නොමැත.

## ඉස්ලාම්: සමතුලිත ජීවන මාර්ගයක්

ඉස්ලාමය ජීවිතයට සමබර ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරයි, මෙලොව සහ පරලොව යන දෙකෙහිම සාර්ථකත්වය සඳහා උත්සාහ කිරීමට විශ්වාස වන්තයින්ව දිරිමත් කරයි. එය ජීවිතයේ අල්ලාහ්ගෙන් ﷻ විපාක උපයා ගැනීමට අවස්ථාවක් ලෙස සලකමින් වෙහෙස මහන්සි වී වැඩ කිරීම, කැපවීම සහ වගකීම යනාදිය සඳහා පොළඹවයි.

ඉස්ලාම් ධර්මය මානව සංවර්ධනය හා ශිෂ්ඨාචාරය දිරිමත් කරයි. අල්ලාහ් ﷻ මිනිසුන්ව නිර්මාණය කළේ පෘථිවියේ ජීවත් වීමට සහ එයින් ප්‍රයෝජන ගැනීමට බව අල්-කුර්ආනය උගන්වයි. ඉස්ලාම් දහම විද්‍යාත්මක විමර්ශනයට ද සහාය දක්වන අතර විශ්වාසය සහ විද්‍යාව අතර කිසිදු ගැටුමක් නොපෙනේ. එය දැනුමට විශාල වැදගත්කමක් ලබා දෙයි. මුහම්මද් නබිතුමාට පළමු හෙළිදරව්ව වූයේ කියවන්න යන අර්ථය ඇති ඉක්රා" යන්නයි, එය ඉගෙනීමේ වටිනාකම ඉස්මතු කරයි. සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් පෝෂණය කිරීම සඳහා, ආගම හෝ සංස්කෘතිය නොසලකා සියලු මිනිසුන් සමග

සහයෝගීතාවය සහ ධනාත්මක අන්තර්ක්‍රියා ඉස්ලාම් බලවත් උනන්දුවක් දක්වන්නේය. ඉස්ලාමය සාමය, දයාව, අනුකම්පාව, පුණ්‍ය කටයුතු, අවංකභාවය, යුක්තිය සහ සියලු මිනිසුන්ගේ යහපැවැත්ම වැනි මූලික වටිනාකම් උගන්වයි.

## අරාබි නියමයන්

| අරාබි පදය | අර්ථය | අරාබි පදය | අර්ථය |
|---|---|---|---|
| ඉබාදා | නමස්කාරය | ඉක්රා | කියවන්න |

## මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න

# 1 වන පරිච්ඡේදය

# විශ්වාසය

# තව්හීද්: ඒකදේවවාදය

## තව්හීද්හි අර්ථය : ඉස්ලාමයේ දෙවියන් වහන්සේගේ ඒකීයභාවය

තව්හීද් ( التوحيد) යනු ඉස්ලාම් ධර්මයේ අතිශයින්ම වැදගත් විශ්වාසයයි. එහි තේරුම අල්ලාහ් ඒකීය බවත් ඔහුට හවුල්කරුවන්, සමානයන් සහ ප්‍රතිවාදීන් නොමැති බවත් විශ්වාස කිරීමයි. මැවුම්කරු, හිමිකරු, පෝෂණය කරන්නා සහ සැපයුම්කරු අල්ලාහ් පමණි. වෙනත් වචන වලින් කිවහොත්, අල්ලාහ් ලෝකයේ සෑම දෙයක්ම නිර්මාණය කර, නඩත්තු කර, රැකබලා ගන්නාය. අපගේ සියලු නැමදුම් ක්‍රියාවන් සර්වබලධාරී අල්ලාහ් වෙතම යොමු කළ යුතුය, මන්ද අපගේ නැමදුම් ලැබීමට සුදුස්සා වන්නේ අල්ලාහ් පමණි. අනාගතවක්තෘවරුන් තම ජනතාවට ගෙන ආ සියලුම දිව්‍ය පණිවිඩවලින් ඉල්ලා සිටියේ අල්ලාහ්ට පමණක් නැමදුම් කරන ලෙසත්- ඔහුට කිසිවෙකු සම්බන්ධ නොකර, සියලු ව්‍යාජ දෙවිවරුන් ප්‍රතික්ෂේප කරන ලෙසත්ය.

## විශ්වාසයේ සාක්ෂිය: අෂ් - ෂහාදා

ෂහාදාව යනු ඉස්ලාමයේ විශ්වාසයේ මූලික ප්‍රකාශයයි. එය: අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්, ව අෂ්හදු අන්න මුහම්මදන් රසූල්-ලුල්ලාහ්

නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බවත්, මුහම්මද් ﷺ අල්ලාහ්ගේ දූතයා බවත් මම සාක්ෂි දරමි




## විශ්වාසයේ සාක්ෂියේ අර්ථය : අෂ් - ෂහාදා

ලා ඉලාහ ඉල්ලල්ලාහ් යන්නෙහි තේරුම

**නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැත**

මෙම ප්‍රකාශය අල්ලාහ් ﷻ හැර වෙනත් කිසිම දෙවියෙකුගේ පැවැත්ම ප්‍රතික්ෂේප කරන අතර නැමදීමට සුදුසු එකම සැබෑ දෙවියන් අල්ලාහ් ﷻ බව තහවුරු කරයි.

මුස්ලිම්වරුන් විශ්වාස කරන්නේ එකම සැබෑ දෙවියන් (අල්ලාහ් ﷻ) බවත්, පෘථිවිය, අහස සහ ජීවීන් යනාදි සියල්ලෙහි මැවුම්කරු ඔහුමය බවත්ය.

## ලා ඉලාහ ඉල්ලල්ලාහ් - (අල්ලාහ් ﷻ හැර වෙනත් දෙවියෙකු නැත) යන්නෙහි අවශ්‍යතාවයන් -

නිසි විශ්වාසයක් ඇති විශ්වාසවන්තයෙකු වීමට නම්, එය හුදෙක් දිවෙන් අල්ලාහ් ﷻ හැර වෙනත් දෙවියෙකු නැත යනුවෙන් පැවසීම පමණක් ප්‍රමාණවත් නොවේ. තව්හීද් (ඒක දේවවාදය) වැළඳගන්නා කෙනෙකු විසින් සපුරාලිය යුතු කොන්දේසි කිහිපයක් තිබේ:

1.අල්ලාහ් ﷻ හැර වෙනත් දෙවියෙකු නැත යන්නෙහි අර්ථය දැන ගැනීම සහ එය අවබෝධ කර ගැනීම.

2. ඕනෑම පිළිම වන්දනාවක්, ව්‍යාජ දෙවිවරුන් හෝ අල්ලාහ් ﷻ සමඟ හවුල්කරුවෙකු ලෙස සලකනු ලබන ඕනෑම දෙයකට නැමදීම ප්‍රතික්ෂේප කිරීම.

3. අල්ලාහ්ගේ ﷻ අණ කීකරු වීමෙන් සහ ඔහුගේ අභිමතය පරිදි ජීවත් වීමට උත්සාහ කිරීමෙන් අල්ලාහ්ට ප්‍රේම කිරීම සහ ඔහුට පක්ෂපාතී වීම.

## මුහම්මදුන් රසූල් අල්ලාහ් යන්නෙහි තේරුම මුහම්මද් අල්ලාහ්ගේ ﷻ දූතයාය යන්නයි.

මෙයින් අදහස් කරන්නේ මුහම්මද් (සල්) තුමාණන් අල්ලාහ් විසින් මනුෂ්‍ය වර්ගයාට මඟ පෙන්වීම සඳහා එවන ලද අවසාන දූතවරයා ලෙස මුස්ලිම්වරු විශ්වාස කරන බවයි. ඔහු අල්ලාහ්ගේ පණිවිඩය (අල්-කුර්ආනය) ගෙන හැර දැක්වූ අතර අල්ලාහ්ගේ අභිමතයට අනුව යහපත් ජීවිතයක් ගත කරන්නේ කෙසේදැයි ජනතාවට පෙන්වා දුන්නේය.

## මුහම්මද් ﷺ අල්ලාහ්ගේ දූතයාණෝය යනුවෙන් පිළිගැනීමේ අවශ්‍යතා

1.මුහම්මද් ﷺ තුමා අල්ලාහ්ගේ දූතයා ලෙස විශ්වාස කිරීම.

2.මුහම්මද් ﷺ නබිතුමාණන්ගේ අණට යටත්ව ඔහුට කීකරු වී, ඔහු තහනම් කළ දෙයින් වැළකී සිටීමෙන්, සහ ඔහුගේ චරිතය හා හැසිරීම අනුකරණය කිරීමට උත්සාහ දැරීම.

3. ඔහුට ආදරය කිරීම සහ අල්ලාහ්ගේ සාමය සහ ආශිර්වාදය ඔහුට සහ ඔහුගේ පවුලේ අයට ලැබේවා යනුවෙන් පවසමින් ඔහුට සලාම් යැවීම.

4. ආගමේ නවෝත්පාදනයක් නබිතුමාගේ ﷺ සුන්නාහ්වට (වචන සහ ක්‍රියාවන්ට) පටහැනි නැමදුම් ක්‍රියාවක් හඳුන්වා දීමෙන් වැළකී සිටීම.

## අරාබි නියමයන්

| අරාබි පදය | අර්ථය | අරාබි පදය | අර්ථය |
|---|---|---|---|
| තව්හීද් | ඒක දේවවාදය | ෂහාදා | විශ්වාසය පිළිබඳ සාක්ෂි |
| රසූල් | පණිවිඩකරු | | |

**මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න**

# 2 වන පරිච්ඡේදය

# විශ්වාසයේ කුළුණු හය (ඊමාන්)

## විශ්වාසයේ කුළුණු හය (ඊමාන්)

(ජිබ්රීල් දේවදූතයාගේ හදීසයෙන්):
ජිබ්රීල් දේවදූතයා නබිතුමාගෙන් ﷺ ඊමාන් ගැන පවසන ලෙස ඉල්ලා සිටි විට නබි ﷺ තුමා මෙසේ පැවසීය.
එය නම් අල්ලාහ් ﷻ , ඔහුගේ දේවදූතයන්, ඔහුගේ ග්‍රන්ථ , ඔහුගේ දූතයන්, අවසාන දිනය, දිව්‍යමය ඉරණම විශ්වාස කිරීම සහ එහි හොඳ සහ නරක යන දෙකම විශ්වාස කිරීමයි. (සහීහ් මුස්ලිම්)

## 1- අල්ලාහ් ﷻ කෙරෙහි විශ්වාසය


අල්ලාහ් ﷻ කෙරෙහි විශ්වාසය තැබීම යනු ඔහු සිටින බවට ස්ථිර විශ්වාසයක් සහ ඔහුගේ ස්වාමිත්වය, ඔහුගේ දිව්‍යමය නාමයන් සහ ඔහුගේ ගුණාංග සම්පූර්ණයෙන්ම පිළිගැනීමයි.

### අල්ලාහ්ගේ ﷻ පැවැත්ම පිළිබඳ විශ්වාසය
### ෆිත්රා (ස්වාභාවික ප්‍රණතිය)



අල්ලාහ්ගේ පැවැත්ම විශ්වාස කිරීම සෑම මනුෂ්‍යයෙකු තුළම ස්වභාවිකව තැන්පත් කර ඇති දෙයකි. සෑම පුද්ගලයෙකුම උසස් බලයක් හඳුනාගෙන එය සොයන අභ්‍යන්තර සහජ බුද්ධියක් (ෆිත්රා) සමග උපත ලබයි. මෙම විශ්වාසයට සාක්ෂි අවශ්‍ය නොවේ. එය අපගේ හදවත් තුළ ගැඹුරින් මුල් බැස ඇත.

දුෂ්කරතා හෝ අර්බුදකාරී අවස්ථාවලදී, මිනිසුන් ස්වභාවයෙන්ම උදව් සඳහා අල්ලාහ් ﷿ වෙත හැරේති. මෙය පෙන්නුම් කරන්නේ, සමහරු එය නොසලකා හැරීමට තීරණය කළත් අල්ලාහ්ව ﷿ විශ්වාස කිරීමට හා ඔහුට නැමදුම් කිරීමට ඇති ආශාව අප තුළ ගොඩනගා ඇති බවයි. පිළිතුරු ලද යාච්ඤාන් සහ විපත්තියෙන් ලැබුණු සහනයන් පිළිබඳ කථාවන් මගින් අල්ලාහ් ﷿ සිටින බවත් ඔහුට අවංකව අයැදින අයට ප්‍රතිචාර දක්වන බවත් සනාථ කරයි.



## අල්ලාහ්ගේ ﷻ ආධිපත්‍යය පිළිබඳ විශ්වාසය

අල්ලාහ්ගේ ආධිපත්‍යය විශ්වාස කිරීම යනු ඔහු ﷿ පමණක් සියල්ලේ මැවුම්කරු පෝෂකයා සහ පාලකයා බව පිළිගැනීමයි. ඔහු ﷿ ජීවය ලබා දෙයි මරණයට පත් කරයි සහ කිසිදු දුර්වලතාවයක් හෝ අවශ්‍යතාවයක් නොමැතිව සියලු දේ කෙරෙහි පූර්ණ බලය දරයි.

සත්‍ය මුස්ලිම්වරයෙකු විශ්වාස කරන්නේ, අල්ලාහ් ﷿ සියල්ලෙහිම නිර්මාතෘවරයා බවයි. මෙය අල්-කුර්ආනයේ මෙසේ සඳහන් වේ: අල්ලාහ් සියල්ලෙහිම නිර්මාතෘවරයාය.

- අල්-කුර්ආනයේ සඳහන් වන පරිදි අල්ලාහ් ﷿ සියල්ලෙහි මැවුම්කරු වේ:
  "සියලුම දේ මවන්නා අල්ලාහ්මය." (39:62.)
- මානව නිර්මාණශීලිත්වය නම් පවතින ද්‍රව්‍ය වලින් පමණක් ප්‍රතිනිර්මාණය කිරීම හෝ ගොඩනැංවීම පමණක් සිදු කරයි. එයට කිසිවක් නොමැතිව නිර්මාණය කිරීමට හෝ මරණයෙන් පසු ජීවිතය ප්‍රතිෂ්ඨාපනය කිරීමට නොහැකිය.
- ඔහු සියලු මැවීම්වල හිමිකරු සහ අධිපතියා වේ. අල්-කුර්ආනයේ මේ බව මෙසේ සඳහන් වේ.
  "අහස්, පොළොව හා ඒවායෙහි ඇතිදේ හි රාජ්‍යය අල්ලාහ්ටම අයත්ය" (5:120 ).
- සියලු ජීවීන් පෝෂණය කරන්නේ ඔහු පමණි. මේ බව මෙසේ සඳහන් වේ. "පොළොවෙහි ඇති කවර ප්‍රාණයකට වුවද එයට ආහාර ලබාදීමේ වගකීම අල්ලාහ් කෙරෙහිම ඇත." (11:6.).
- ඔහු විශ්වයේ සියලු කටයුතු පාලනය කර කළමනාකරණය කරයි, මේ බව මෙසේ සඳහන් වේ : "ඔහුම අහසෙහි සිට පොළොව දක්වා වූ කාර්යයන් පාලනය කරයි." (32:5.)
- සම්පත් මත යැපෙන සහ අසාර්ථක විය හැකි මිනිසුන් මෙන් නොව, අල්ලාහ්ගේ පාලනය නිරපේක්ෂ හා පරිපූර්ණයි. මැවීමේ සහ අණ කිරීමේ සෑම දෙයක්ම ඔහුට අයත් වේ,: මේ

**බව මෙසේ සඳහන් වේ. "මැවීමද, අණ කිරීමද ඔහුටම අයත් ඒවා වේ. සකල ලෝවැසියන්ගේ ස්වාමියා වූ අල්ලාහ් භාග්‍ය ඇත්තා වූයේය." (7:54)**



## නැමදීමට සුදුස්සා අල්ලාහ් ﷻ පමණක් බව විශ්වාස කිරීම

සලාතය, උපවාසය, සකාත්, හජ් සහ අයැදීම් වැනි ක්‍රියාවන් තුළින් අපගේ නැමදුම ලැබීමට සුදුසු එකම දෙවියන් අල්ලාහ්ය ﷻ. අපි අල්ලාහ්ගෙන් පමණක් උපකාර ඉල්ලා සිටිය යුතු අතර, අපි ඔහුට පමණක් බිය විය යුතු අතර, අපි ඔහුට පමණක් අපගේ භාරයන් කළ යුතු අතර ඔහු කෙරෙහි පූර්ණ විශ්වාසය තැබිය යුතුය. අපගේ සියලු කටයුතු සහ නැමදුම ඔහු වෙත පමණක් යොමු කළ යුතු අතර, ඔහු හැර වෙනත් කිසිවෙකුට නැමදුම් නොකළ යුතු බව කුර්ආනය පවසයි, **"ඔබලාගේ නැමදීමට සුදුස්සා, එකම නැමදීමට සුදුස්සා (වන අල්ලාහ්)ය (සැබැවින්ම) නැමදීමට සුදුස්සා ඔහු හැර වෙන කෙනෙකු නොමැත. ඔහු අසීමිත කරුණාවන්තයාය අසම දයාවන්තයාය."** (2: 163)

## අල්ලාහ්ගේ ﷻ නම් සහ ගුණාංග කෙරෙහි විශ්වාසය

අල්ලාහ්ගේ නම් සහ ගුණාංග කෙරෙහි විශ්වාසය යනු, අල්-කුර්ආනයෙහි හෝ නබිතුමාගේ සුන්නාවෙහි අල්ලාහ් විසින් තමන්ව හඳුන්වා දී ඇති සියලුම නම් සහ ගුණාංග සනාථ කිරීමයි. අල්ලාහ්ට ﷻ වඩාත් අලංකාර නම් සහ පරිපූර්ණ ගුණාංග ඇත. අල්ලාහ් ﷻ අල්-කුර්ආනයේ මෙසේ පවසයි: **"ඔහු මෙන් කිසි දෙයක් නොමැත. ඔහු සවන්දෙන්නාය බලන්නාය."** (42:11) අල්ලාහ්ගේ වඩාත් අලංකාර නම් කිහිපයක්: අසීමිත කරුණාවන්ත, අසීමිත දයාවන්ත, සර්ව බලසම්පන්න, මහා ප්‍රඥාවන්ත.

## බහු දේවවාදය: අල්ලාහ්ට ﷻ හවුල්කරුවන් තැබීම (ෂිර්ක්)

ෂිර්ක් යන්නෙන් අදහස් කරන්නේ අල්ලාහ්ට ﷻ ඔහුගේ ස්වාමිත්වයට, නැමදුමට හෝ ඔහුගේ නම් සහ ගුණාංගවලට හවුල්කරුවන් තැබීමයි. අල්ලාහ්ට ﷻ පමණක් නැමදුම් කිරීමට සුදුසු වන අතර, සියලුම නැමදුම් ක්‍රියාවන් ඔහු වෙත පමණක් යොමු කළ යුතුය. ෂිර්ක් යනු ඉස්ලාමයේ ඇති දරුණුතම පාපය ලෙස සැලකේ. අල්ලාහ් ﷻ අල්-කුර්ආනයේ මෙසේ පවසයි:

**"නියතව අල්ලාහ් තමාට සම කිරීම් කරනු ලැබීම සමා නොකරන්නේමය. එය හැර අනෙක් ඒවාට, ඔහු තමා සිතන අයට සමා කරන්නේය. "** (4:48)

## ෂිර්ක් වර්ග:

ෂිර්ක් සාමාන්‍යයෙන් ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදා ඇත:

### A. ප්‍රධාන ෂිර්ක්

මෙය අල්ලාහ් ﷻ. හැර වෙනත් අය වෙත නැමදුම් ක්‍රියාවන් යොමු කිරීම වේ. මෙවැනි ආකාරයේ ෂිර්ක්, පුද්ගලයෙකුව ඉස්ලාම් දහමෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කරයි. උදාහරණ:

- පිළිම, සොහොන් හෝ මිනිසුන්ට නැමදුම් කිරීම.
- අල්ලාහ් ﷻ හැර වෙනත් අයගෙන් යාඥා කිරීම හෝ උපකාර පැතීම.
- අල්ලාහ් ﷻ සතු දිව්‍යමය බලයන් අන් අයටත් ඇතැයි විශ්වාස කිරීම.
- අල්ලාහ් ﷻ හැර වෙනත් කිසිවෙකුට පූජා හෝ භාරයන් කිරීම.

### B. සුළු ෂිර්ක්

මෙය පුද්ගලයෙකුව ඉස්ලාම් දහමෙන් ඉවත් නොකරයි, නමුත් එය තවමත් බරපතල පාපයකි.
උදාහරණ:
- රියා (නැමදුම් ක්‍රියාවන් විදහා දැක්වීම): අන් අයට දැකීමට නැමදුම් කිරීම හෝ උපවාසය රැකීම.
- අල්ලාහ්ගේ කාර්යභාරය අමතක කරමින් "එය එසේ නොවන්නට, මම සාර්ථක නොවනු ඇත" වැනි දේ පැවසීම.

## 2- දේවදූතයන් කෙරෙහි විශ්වාසය

මලාඉකාවරුන් (දේවදූතයන්) යනු අදෘශ්‍යමාන ලෝකයට අයත් අයයි. ඔවුන් ආලෝකයෙන් නිර්මාණය කර ඇත්තේ අල්ලාහ්ගේ ﷻ අණට කීකරු වීමට වන අතර, ඔවුන් කිසි විටෙකත් ඔහුගේ නීති හෝ අණ උල්ලංඝනය නොකරන්නේය. මෙම අල්-කුර්ආනයේ වාක්‍යයන්හි මලක්වරුන්ගේ පිළිබඳ විස්තර දැක්වේ:

**"ඔවුහු අල්ලාහ් තමන්ට අණ කළ දේට වෙනස්කම් නොකරන්නෝය. තවද ඔවුහු තමන්ට අණ කරනු ලැබූ දේ කරන්නෝය." (66:6)**

**"එසේ නොව ඔවුහු ගෞරවනීය ගැත්තන් වෙති. වදනින් ඔවුහු ඔහුට ඉදිරියෙන් නොයන්නෝය. ඔවුහු ඔහුගේ අණයට අනුවම ක්‍රියා කරන්නෝය."** (21:26-27)

මලාඉකාවරුන් (දේවදූතයන්) සිටින බවත්, ඔවුන් අල්ලාහ්ගේ මැවීමක් බවත්, ඔවුන්ගෙන් සමහරෙකුට නම් ලබා දී ඇති බවත් විශ්වාස කිරීම මුස්ලිම්වරයෙකුගේ අනිවාර්ය වගකීමකි. මෙම නම් අතරින් සමහරක් වන්නේ අල්ලාහ්ගේ එළිදරව්ව ඔහුගේ දූතවරුන්ට දැනුම් දීමේ කාර්යය භාරව සිටින ජිබ්රීල් (ගේබ්‍රියෙල්) ය. අල්-කුර්ආනයෙහි සහ නබි මුහම්මද් ﷺ තුමාණන්ගේ ඉගැන්වීම්වල විස්තර කර ඇති දේවදූතයන්ගේ ගුණාංග ද මුස්ලිම්වරු විශ්වාස කරති.

## 3- අල්ලාහ්ගේ ﷻ ග්‍රන්ථ කෙරෙහි විශ්වාසය

මෙම කුළුණ (වගකීමට) සඳහා පහළ කරන ලද ධර්ම ග්‍රන්ථ විශ්වාස කිරීම අවශ්‍ය වේ, ඒවා අතර මූසා (මෝසෙස්) වෙත යවන ලද තව්රාතය, ඊසා (යේසුස්) වෙත යවන ලද ඉන්ජීලය( සුවිශේෂය), දාවූද් (ඩේවිඩ්) වෙත යවන ලද ගීතාවලිය (සබූර්), ඉබ්‍රාහිම් (ඒබ්‍රහම්) ගේ ශුද්ධ ලියවිලි සහ මුහම්මද් ﷺ තුමා වෙත යවන ලද අල් කුර්ආනය ඇතුළත් වේ. අල් කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

**"විශ්වාස කළවුනි අල්ලාහ්වද, ඔහුගේ දූතයාවද, ඔහු තම දූතයාට පහළ කළ මෙම වේදකයද, මෙයට පෙර ඔහු පහළ කළ වේදකයද විශ්වාස කරන්න."** (4:136)




මෙම ග්‍රන්ථ මිනිසුන්ගේ වචන නොව, අල්ලාහ්ගේ ﷻ මලක්වරුන් (දේවදූතයන්) විසින් ඔහුගේ දූතවරුන්ට පහළ කරන ලද අල්ලාහ්ගේ වදන් ය. මෙම ග්‍රන්ථවල අල්ලාහ්ගේ ﷻ පණිවිඩය එහි මිනිසුන්ට දුන් සියලුම අණපනත් සහ අවවාද අඩංගු විය. එපමනක් නොව, මෙලොව මෙන්ම පරලොවෙහි ද මිනිසුන් සඳහා සත්‍යය, ආලෝකය සහ මග පෙන්වීම ද ඒවායේ අඩංගු විය.

### පෙර පහළ කරන ලද ග්‍රන්ථවල අන්තර්ගතය පිළිබඳ අපගේ විශ්වාසය

මුස්ලිම්වරයෙකු විශ්වාස කරන්නේ, පෙර නබිවරුන්ට පහළ කරන ලද මුල් දිව්‍ය ග්‍රන්ථ නිර්මල වුවද, අද පවතින ඒවා වෙනස් කර ඇති නිසා, ඒවා තවදුරටත් මුල් එළිදරව්වේ සත්‍ය නිරූපණයක් නොවන බවයි. තවුරාතයේ සහ ඉන්ජීලයේ වත්මන් පිටපත්වල විවිධ මානව වෙනස් කිරීම් අඩංගු වී ඇති අතර, එය වැරදි විශ්වාසයන්, නොමග යවන කතා සහ අසත්‍ය ප්‍රකාශ ඇතුළත් කිරීමට හේතු වී ඇතැයි විශ්වාස කෙරේ.

මේ සියල්ල තිබියදීත්, මුස්ලිම්වරයෙකු මෙම ග්‍රන්ථ දැන් ඒවායේ මුල් පිටපත්වල නොතිබුණත්, ඒවාට ගරු කළ යුතුය. ඒවාට අපහාස කිරීම හෝ අපවිත්‍ර කිරීම නොකළ යුතුය, මන්ද ඒවායේ තවමත් විකෘති නොවූ අල්ලාහ්ගේ ﷻ වචන කිහිපයක් අඩංගු විය හැකි බැවිනි.

## 4- අල්ලාහ්ගේ දූතයින් කෙරෙහි විශ්වාසය

මුස්ලිම්වරයෙකු වශයෙන්, එවන ලද සියලුම දූතවරුන්ව විශ්වාස කිරීම අනිවාර්ය වේ. එවන ලද දූතවරුන් අතර අපට නම් වශයෙන් දන්වා ඇති අය මෙන්ම, නම් සඳහන් කර නැති අය ද වෙති.

**"(ඕ:නබි) අපි ඔබට පෙර බොහෝ දූතයින්ව යවා ඇත්තෙමු. ඔවුන්ගෙන් සමහරුන් ගැන අපි ඔබට පවසා ඇත්තෙමු. තවද අපි ඔවුන්ගෙන් සමහරුන් ගැන ඔබට නොපැවසුවෙමු."** (40:78)

අල්ලාහ් ﷻ විසින් තෝරාගත් නබිවරුන් සහ දූතවරුන්, අල්ලාහ් ﷻ හැර වෙනත් කිසිවෙකු ඔහුට හවුල් නොකර, ඔහුට පමණක් නැමදුම් කරන ලෙස මිනිසුන්ට ආරාධනා කිරීම සඳහා ඉතිහාසය පුරා සෑම ජාතියකටම යවා ඇත. ඔවුන් ප්‍රතික්ෂේප කරන්නන්ට නිරයේ දඬුවම ගැන අවවාද කිරීමටත්, විශ්වාස කරන්නන්ට ස්වර්ගයේ යහ විපාකය පිළිබඳ ශුභාරංචි දීමටත් අණ කර තිබුණි. අල්ලාහ් ﷻ , නබිවරුන් සහ දූතවරුන් තම ජාතීන්ට හොඳම ආදර්ශ ලෙස තෝරා ගත්තේය. අල්ලාහ් ﷻ ඔවුන්ට දැනුම, අවබෝධය, මඟ පෙන්වීම, ආශ්චර්යයන්, පාපවලින් ආරක්ෂා වීම සහ ගෞරවය ලබා දුන්නේය.

**"අල්ලාහ් මොවුන්ව යහමගෙහි යැව්වේය. එහෙයින් ඔබ මොවුන්ගේ මග පිළිපදින්න"** (6: 90)

මුහම්මද් ﷺ තුමාට, ඔහුට පෙර පැමිණි නබිවරුන්ට සහ දූතවරුන්ට වඩා වැඩි ආශිර්වාදයක් ලබා දෙන ලදී. විශාලතම ආශිර්වාදය වූයේ අවසාන ශුද්ධ ග්‍රන්ථය (අල්-කුර්ආනය) ලබා දීම සහ මනුෂ්‍ය වර්ගයා වෙත එවන ලද අවසාන දූතයා වීමයි.

මෙම කුළුණට, අල්ලාහ්ගේ දූතවරුන් වන ඉබ්‍රාහීම් (ආබ්‍රහම්), මූසා (මෝසෙස්), ඊසා (යේසුස්) සහ මුහම්මද් ඇතුළු අල්ලාහ්ගේ ﷻ සියලුම නබිවරුන්ව විශ්වාස කිරීම ඇතුළත් වේ. මෙම දූතවරුන් අල්ලාහ්ගෙන් ﷻ එළිදරව්ව ලබා ගෙන එය මිනිසුන්ට පිරිනමනු ලැබුවේය. සියලුම දූතවරුන්ට උපරිම ගෞරවය සහ ප්‍රශංසාව ලැබිය යුතුයි.

## ජේසුස් වහන්සේ (ඔහුට ශාන්තිය අත්වේවා) සම්බන්ධයෙන් මුස්ලිම්වරුන්ගේ විශ්වාසය

- මුස්ලිම්වරු විශ්වාස කරන්නේ යේසුස් (ඊසා), අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨතම දූතවරුන්ගෙන් කෙනෙකු වූ බවත්, ඉශ්රායෙල් දරුවන්ට ඔහුගේ පණිවිඩය ලබා දීම සඳහා අල්ලාහ් ﷻ විසින් ඔහුව තෝරා ගනු ලැබූ බවත්ය.
- ඔහු දිව්‍යමය ගුණාංග නොමැති මනුෂ්‍යයෙකි. මුස්ලිම්වරු ජේසුස් වහන්සේගේ කන්‍යා උපත අල්ලාහ්ගේ බලයේ ලකුණක් ලෙස සලකති.
- ජේසුස් වහන්සේ අල්ලාහ්ගේ ﷻ සේවකයෙකු සහ දූතයෙකු බව විශ්වාස කරන්නේ නම් මිස, මුස්ලිම්වරයෙකු සැබෑ විශ්වාසවන්තයෙකු ලෙස නොසැලකේ.
- අල්ලාහ් ﷻ විසින් ජේසුස් වහන්සේ අහසට ඔසවා ගත් බව මුස්ලිම්වරු විශ්වාස කරති.
- ජේසුස් වහන්සේව අල්-කුර්ආනයේ අල්ලාහ්ගේ ﷻ වචනය, අල්ලාහ්ගේ සේවකයෙක් සහ අල්ලාහ්ගේ ආත්මයක් ඇතුළු විවිධ නාමයන්ගෙන් හඳුන්වා ඇති අතර ඔහුට ඉහළ ගෞරවයක් හිමි වේ.

## 5- අවසාන දිනය කෙරෙහි විශ්වාසය

මෙම කුළුණ යනු අල්ලාහ් ﷻ මිනිසුන්ව ඔවුන්ගේ සොහොන්වලින් නැවත නැගිටුවන බවට ඇති ස්ථිර විශ්වාසයයි. පසුව ඔහු ඔවුන්ගේ ක්‍රියාවන් අනුව විනිශ්චය කරනු ඇත. ස්වර්ගයට යාමට සුදුසු අයව ස්වර්ගයට යවනු ලබන අතර, නිරයට යාමට සුදුසු අයව නිරයට යවනු ඇත. සෑම මිනිසෙකුම තම සොහොන්වලින් නැවත නැගිටුවනු ලබන අතර, ඔවුන්ගේ හොඳ සහ නරක ක්‍රියාවන් ඇතුළත් ඔවුන්ගේ ක්‍රියා පොත ඔවුන්ට දෙනු ඇත. ඔවුන් කළ පව් මෙන්ම ඔවුන්ට මග හැරුණු යහපත් ක්‍රියාවන් ගැනද ඔවුන් පසුතැවෙනු ඇත. අවසාන දිනය විශ්වාස කිරීම, මිනීවළේ දඬුවම සහ සැපත, නැවත නැගිටීම, පිළිබඳ විශ්වාසය ඔබේ ක්‍රියාවන් කිරා මැන බලන තරාදියේ විනිශ්චය සහ ස්වර්ගය හා නිරය කෙරෙහි ඇති විශ්වාසය ඇතුළත් වේ.

අවසාන දිනය පිළිබඳ විශ්වාසය යනු සර්වබලධාරී අල්ලාහ් ﷻ කෙරෙහි සහ ඔහුගේ නිරපේක්ෂ යුක්තිය කෙරෙහි ඇති විශ්වාසයේ ප්‍රතිඵලයකි.



## 6- දිව්‍ය නියමය (අල්-කද්ර්) කෙරෙහි විශ්වාසය

අල්-කදර් යනු අල්ලාහ්ගේ ﷻ දැනුමට අනුව සහ ඔහුගේ ප්‍රඥාවට අනුකූලව, සෑම නිර්මාණයකටම ඔහු විසින් නියම කරන ලද දෛවයයි. මෙම කුළුණ කෙරෙහි ඇති විශ්වාසය යනු, සිදුවන සෑම දෙයක්ම, හොඳ හෝ නරක, අල්ලාහ්ගේ ﷻ දිව්‍යමය නියමයට අනුව පමණක් සිදුවන බව විශ්වාස කිරීමයි. දෛවය පිළිබඳ විශ්වාසයට පහත කරුණු ඇතුළත් වේ:

- අල්ලාහ් ﷻ තම මැවීම් පිළිබඳ සියල්ල දන්නා බවට විශ්වාසය.
- ඔහුගේ පූර්ව දැනුමට අනුව, පවතින සෑම දෙයක්ම සංරක්ෂිත ලේඛනයේ (දෛවය පිළිබඳ පොතෙහි) සටහන් කර ඇති බවට ඇති විශ්වාසය.
- අල්ලාහ්ගේ ﷻ කැමැත්ත නිරපේක්ෂ බවත්, එය කිසිදු බලයකින් ව්‍යර්ථ කිරීමට හෝ අභියෝග කිරීමට නොහැකි බවත් විශ්වාස කිරීම.
- අල්ලාහ් සියල්ලෙහි නිර්මාතෘ බවත්, ඔහු එකම නිර්මාතෘ බවත්, පවතින සියල්ල ඔහු විසින් නිර්මාණය කර ඇති බවත් විශ්වාස කිරීම.
- දෛවය පිළිබඳ විශ්වාසය යනු මිනිසාට නිදහස් කැමැත්තක් නැති බව නොවේ. මිනිසාට නිදහස් කැමැත්ත, නිදහස් තේරීම සහ තමා කැමති පරිදි ක්‍රියා කිරීමේ හැකියාව ද ඇත.

අල් කුර්ආනය මෙසේ සඳහන් කරයි.:

**"එම දිනය සැබෑවක්ම වේ. එහෙයින්, කවරෙක් ප්‍රිය කරයිද ඔහු තම ස්වාමියා හමුවෙහි නැවතුම් තැනක් ලබාගත්තා වේ."** (78:39)

මිනිසාට ජීවිතයේ තේරීමක් තිබේ, තේරීම සමග වගකීම පැමිණේ, සෑම ආත්මයක්ම තමාගේම ක්‍රියාවන්ට වගකිව යුතුය.

අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

**لَا يُكَلِّفُ ٱللَّهُ نَفْسًا إِلَّا وُسْعَهَا ۚ لَهَا مَا كَسَبَتْ وَعَلَيْهَا مَا ٱكْتَسَبَتْ**

**"අල්ලාහ් කිසිම ආත්මාවක් එහි ශක්තියට වඩා දුෂ්කරතාවයට පත් නොකරන්නේය. එය උපයා ගත් කුසල් එයටම අයත්ය. එය උපයාගත් දෙයෙහි විපාකයද එයටම අයත්ය."**

(2:286)

## අරාබි නියමයන්

| අරාබි පදය | අර්ථය | අරාබි පදය | අර්ථය |
|---|---|---|---|
| අල් කද්ර් | දිව්‍යමය ආඥාව | ෂිර්ක් | බහු දේවවාදය |

**මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න**

# 3 වන පරිච්ඡේදය

# පවිත්‍රතාවය (තහාරා)

# පවිත්‍රතාවය (තහාරා)

## ඉස්ලාමයේ පවිත්‍රතාවය (තහරා) යන්නෙහි තේරුම

**තහාරා** යනු ඉස්ලාමයේ පාරිශුද්ධත්වය පිළිබඳ සංකල්පයයි. එය පව්, ඊර්ෂ්‍යාව, අහංකාරය සහ වෛරය වැනි දේවලින් අභ්‍යන්තරිකව පවිත්‍ර වීම මෙන්ම අපිරිසිදුකමෙන් සහ සියලු ආකාරයේ අපවිත්‍ර ද්‍රව්‍යවලින් බාහිරව පවිත්‍ර වීම ද අදහස් කරයි. අල්ලාහ් පිරිසිදුව සිටින්නන්ව ප්‍රිය කරයි.

අල්-කුර්ආනයේ සඳහන් වන පරිදි,

**"නියතව අල්ලාහ් සමාව අයදින්නන්ව ප්‍රිය කරයි. තවද පිරිසිදුවන්නයින්වද ප්‍රිය කරයි."** (2:222)

## ඉස්ලාමයේ වැසිකිළි ආචාරධර්ම

ඉස්ලාම් දහම වැසිකිළි භාවිතයේදී පිරිසිදුකම ගැන උගන්වයි. මෙහිදී අනුගමනය කළ යුතු ඇතැම් ආචාර ධර්ම මෙන්න:

- පහත සඳහන් දුආ කියමින්**, වම් පාදයෙන් ඇතුළු විය යුතුය:**
- **"බිස්මිල්ලාහ්. අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල්-කුබුසි වල්-කබාඉස්."**

  **(අල්ලාහ්ගේ නාමයෙන්. අල්ලාහ් මම ඔබගෙන් පිරිමි සහ ගැහැණු යක්ෂයන්ගෙන් ආරක්ෂාව පතමි.)**
- **ජලය (හෝ ටිෂු භාවිතා කර පසුව ජලය) භාවිතා කර** මුත්‍රා කිරීමෙන් හෝ මලපහ කිරීමෙන් පසු, ඔබේ පෞද්ගලික ප්‍රදේශය හොඳින් පිරිසිදු කිරීම. මෙම ක්‍රියාව **ඉස්තිංජා** ලෙස හැඳින්වේ. නැතහොත්, වැසිකිළි ටිෂු හෝ ගල් වැනි ඒ සඳහා සුදුසු ඕනෑම දෙයක් භාවිතා කර තුන් වරක් පිරිසිදු කරගන්න.
- **ඔබේ වම් අත භාවිතා කරන්න.** පිරිසිදු කිරීම සඳහා
- **කිබ්ලාව දෙසට මුහුණ ලා හෝ පිටුපස හරවා නොසිටින්න**. මුත්‍රා කිරීමේදී හෝ මලපහ කිරීමේදී,(හැකි නම්).
- **දකුණු පාදයෙන් පිටවෙන්න.** එවිට මෙසේ පැවසිය යුතුය:
  **ගුෆ්රානක** (මම ඔබගෙන් සමාව පතමි.)

## භෞතික අපවිත්‍රතාවය (නජාසා)

ඉස්ලාමීය නීතියේ පොදු නීතිය නම් සියලුම දේ පිරිසිදු ලෙස සැලකීමයි. අපිරිසිදු ලෙස සලකන දේවල් නම්:

- මිනිස් මුත්‍රා සහ මළපහ
- ශුක්‍රාණු සහ ඔසප් රුධිරය
- වමනය හෝ සැරව
- බල්ලන් (කෙල, මුත්‍රා සහ මළපහ)
- මියගිය සතුන්

ඔබට සලාතය ඉටු කිරීමට අවශ්‍ය නම්, ඔබ මුලින්ම ශරීරයෙන්, ඇඳුම්වලින් සහ සලාතය ඉටු කිරීමට අදහස් කරන ස්ථානයෙන් ඉහත සඳහන් කළ සියලුම භෞතික අපවිත්‍රතා ඉවත් කළ යුතුය.

## එය ඉවත් කරන්නේ කෙසේද:

ඔබේ ශරීරයේ, ඇඳුම්වල හෝ සලාතය කරන ස්ථානයේ නජාසා (අපිරිසිදුකම්) තිබේ නම්, බලපෑමට ලක්වූ ප්‍රදේශය පිරිසිදු වන තුරු ජලයෙන් සෝදන්න. එහෙත් බල්ලෙකුගේ භෞතික අපිරිසිදුකම් හත් වරක් සේදිය යුතු අතර, ඉන් එක් වරක් වැලි යොදා සේදිය යුතුය.

## චාරිත්‍රානුකූල අපවිත්‍රතාව (හදස්):

අදෘශ්‍යමාන අපවිත්‍ර තත්ත්වයක්. එය ඉවත් කරන තුරු මුස්ලිම්වරයෙකුට සලාතය ඉටුකිරීමට නොහැක. මෙම චාරිත්‍රානුකූල අපවිත්‍රත්වය අර්ධ වශයෙන් පවිත්‍ර කිරීම (වුදූ) හෝ පූර්ණ වශයෙන් පවිත්‍ර කිරීම (ඝුස්ල් / චාරිත්‍රානුකූල ස්නානය) මගින් ඉවත් කළ හැකිය. චාරිත්‍රානුකූල අපවිත්‍රතා වර්ග දෙකක් ඇත:

### A. සුළු අපවිත්‍රතාව (හදස් අස්ගර්):

මෙය වුදූ (අර්ධ ස්නානය ) බිඳ දමන අතර පහත සඳහන් දෑ ඊට ඇතුළත් වේ:

- වාතය හෝ මුත්‍රා පිටවීම
- මළපහ කිරීම
- තද නින්ද
- සිහිය නැතිවීම

**අත්‍යාවශ්‍යතාවය:** වුදූ (අර්ධ ස්නානය ) **සලාතය (යාඥාව) කිරීමට පෙර , අල්-කුර්ආනය ස්පර්ශ කිරීමට සහ කඃබාව වටා ගමන් කිරීමට (තවාෆ්) පෙර**

**ඔබගේ චාරිත්‍රානුකූල පවිත්‍රවීම්** (වුදූ සහ ගුස්ල්) සඳහා, වැසි, ළිං, දිය උල්පත්, **ගංගා, මුහුදු සහ දියවූ හිම හෝ හිම කැට** වැනි ස්වභාවික මූලාශ්‍රවලින් ලබාගත් පිරිසිදු, පැහැදිලි ජලය භාවිත කළ යුතුය.

**ප්‍රධාන මූලධර්මය:** ජලයේ ස්වාභාවික **සුවඳ, රසය** හෝ **වර්ණය** කිසිදු අපිරිසිදු ද්‍රව්‍යයකින් සැලකිය යුතු ලෙස වෙනස් වී නොමැති තාක් කල්, ජලය පිරිසිදු හා පිරිසිදු කිරීම සඳහා සුදුසු යැයි සැලකේ. මෙම ගුණාංගවලින් කිසිවක් වෙනස් වුවහොත්, එම ජලය පිරිසිදු කිරීම සඳහා සුදුසු නොවේ.

### B. ප්‍රධාන අපිරිසිදුකම (හදස් අක්බර්):

**අත්‍යාවශ්‍යතාවය:** ගුස්ල් (සම්පූර්ණ ස්නානය ) **නැමදුම් ක්‍රියාවන්හි යෙදීමට පෙර ඔබව පවිත්‍ර කර ගැනීම මෙය අවශ්‍ය වන්නේ පහත සඳහන් හේතූන් මතය :**

- **ලිංගික සංසර්ගය**
- **ඔසප් රුධිරය සහ ප්‍රසව රුධිර වහනය**
- **නෙතමනය: ශරීරයේ හෝ ඇඳුම්වල දියරමය ස්‍රාවයක් (තරල ස්‍රාවයක් ) දක්නට ලැබීම**

### ගුසල්: ප්‍රධාන අපිරිසිදුතාවයන් ඉවත් කිරීම සඳහා සම්පූර්ණ ස්නානය කිරීම (ජනබා)

**ගුසල් (සම්පූර්ණ ස්නානය )කිරීමට, පිරිසිදු වීම සහ නැමදුම් ක්‍රියාවන් සඳහා යන චේතනාව ඇතිව මුළු ශරීරයම වතුරෙන් සේදීම මුස්ලිම්වරයෙකුට ප්‍රමාණවත්ය. ජනාබා (ප්‍රධාන අපිරිසිදු තත්ත්වය) ඉවත් කිරීමට වඩාත් නිර්දේශිත ක්‍රමය වන්නේ, පළමුව වැසිකිළි ගිය පසු පිරිසිදු කරන ආකාරයට පුද්ගලික කොටස් පිරිසිදු කර, වුදූ ( අර්ධ ස්නානය ) සිදු කර, ඉන්පසු මුළු ශරීරයම හොඳින් සේදීමයි. මෙම ආකාරයට ගුසල් ස්නානය සිදු කළ විට, නැවත වුදූ කිරීමට අවශ්‍ය නොවේ.**

## වුදූ (අර්ධ ස්නානය ) කිරීමේ ආචාර විධි (පියවරයන්)

### වුදූ (අර්ධ ස්නානයහි ) පියවර :

1. චේතනාව (නියත්) හදවතේහි තැබීම

2. බිස්මිල්ලාහ් යනුවෙන් කීම

**ඉස්ලාමයේ ඔබගේ ක්‍රියාවන්හි ආත්මය නියියාහ් වේ.** එය ඔබගේ බාහිර ක්‍රියාවන් ඔබගේ අභ්‍යන්තර ඇදහිල්ලට සම්බන්ධ කරන අතර අල්ලාහ් ඉදිරියේ ඒවායේ වටිනාකම සහ විපාකය තීරණය කරයි. එය ඔබගේ ජීවිතයේ සෑම මොහොතක්ම අධ්‍යාත්මික නමස්කාර ක්‍රියාවන් සඳහා අවස්ථාවක් බවට පත් කරමින්, අල්ලාහ්ව සතුටු කිරීම කෙරෙහි පමණක් ඔබේ අරමුණ යොමු කිරීමට ඔබට උපකාරී වේ.



3. දෙඅත් මැණික් කටුව දක්වා ( තුන් වරක් ) සේදීම.



4. කටට වතුර දමා හොඳින් සෝදා හැරීම ( තුන් වරක් )



5. නාසයට වතුර උරමින් පසුව එය පිටතට දැමීම ( තුන් වරක් ).



6. මුහුණ සේදීම නළලේ කෙළවරේ සිට නිකට දක්වා ද, එක් කනක් අසල සිට අනෙක් කන දක්වා ද මුහුණේ සියලුම කොටස් ආවරණය වන පරිදි සේදීම ( තුන් වරක් )



7 දෑත් වැලමිට ද ඇතුළුව හොඳින් තුන් වරක් සේදීම දකුණු අතින් පටන් ගැනීම,



7. ඔබේ හිස සහ කන් ඇතුළුව එක් වරක් පිස දමන්න.



8. ඔබේ පාද වළලුකර දක්වා (3 වතාවක්) සෝදන්න, දකුණෙන් ආරම්භ කරන්න.

## වැදගත් ආචාර විධි:

- පියවර අනුපිළිවෙලට කරන්න..
- ජලය නාස්ති කිරීමෙන් වළකින්න.
- සන්සුන්ව සහ සිහිකල්පනාවෙන් වුදු කරන්න.

## වුදුහි මහිමය :

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ:

මුස්ලිම්වරයෙකු වුදූ කරන විට, ඔහුගේ පාපයන් ඔහුගේ මුහුණෙන්, අත්වලින් සහ පාදවලින් පිටවන ජලය සමඟ හෝ අවසාන ජල බිංදුවත් සමඟ ඉවත් වේ. (මුස්ලිම්)

## ඝන මේස් මත පිස දැමීම

**ඇත්තෙන්ම, ඉස්ලාමය එහි කරුණාව සහ ප්‍රායෝගිකත්වය තුළින් වුදු ( අර්ධ ස්නානය ) කිරීම සඳහා ඉතාමත් උපකාරී වන සහනයක් ලබා දී තිබෙනවා. මෙය විශේෂයෙන්ම සීතල කාලගුණයකදී හෝ ගමන් බිමන් යන අතරතුරදී බෙහෙවින් ප්‍රයෝජනවත් වෙනවා.**

**ඔබේ පාද සේදීම සඳහා මේස් හෝ සපත්තු ඉවත් කිරීම වෙනුවට, ඔබට තෙත් දෑතින් ඒවා මත පිස දැමිය හැකිය.**



**තයම්මුම්**



**පා මේස් මත පිරිමැදීම**

### මේස් මත පිරිමැදීම සඳහා අදාළ වන කොන්දේසි:

- සම්පූර්ණ වුදුවකින් පසු මේස් පැළඳිය යුතුය.
- මේස් පිරිසිදු, ඝනකමින් යුක්ත විය යුතු අතර ඒවා වළලුකර ඇතුළුව මුළු පාදයම ආවරණය වන පරිදි තිබිය යුතුය.
- පදිංචිකරුවන් සඳහා පැය 24 ක් සහ සංචාරකයින් සඳහා පැය 72 ක් පිසදැමීමට අවසර ඇත.

## තයම්මුම්: (වියළි පවිත්‍ර වීම)

වුදු හෝ ගුස්ල් කිරීම සඳහා ජලය නොමැති වූ අවස්ථාවකදී හෝ, රෝගී තත්ත්වයක් හේතුවෙන් මුස්ලිම්වරයෙකුට ජලය භාවිත කිරීමට නොහැකි වූ අවස්ථාවකදී, ඔහුට පිරිසිදු දූවිලි තැන්පත් වී ඇති ඇඳ ඇතිරිල්ලක් හෝ වස්ත්‍රයක්, පිරිසිදු පස හෝ වැලි හෝ ගලක් භාවිතා කළ හැකිය. මෙය තයම්මුම් ලෙස හැඳින්වේ.

## තයම්මුම් ඉටු කිරීමේ පියවර

- ඔබගේ හදවත තුළින් තයම්මුම් සිදු කිරීමේ චේතනාව (නියතය) තබන්න.
- බිස්මිල්ලාහ් යැයි පැවසීම අනුමත (සුන්නත්) කර ඇත.
- දෙඅත්ලම වැලි හෝ පිරිසිදු දූවිලි මත සැහැල්ලුවෙන් පහර දී, අනතුරුව අත්වල ඇති අතිරික්ත දූවිලි පිඹ දමන්න.
- ඔබේ දෑතින් මුහුණ පිරිමදින්න
- වම් අත්ල භාවිත කර දකුණු අතේ පිටුපස පිරිමදින්න. ඉන්පසු, දකුණු අත්ල භාවිත කර වම් අතේ පිටුපස පිරිමදින්න.

## අරාබි නියමයන්

| අරාබි පදය | අර්ථය | අරාබි පදය | අර්ථය |
|---|---|---|---|
| සලාත් | සලාතය | අත්තහාරා | පවිත්‍රතාවයන් |
| නජාසා | ශාරීරික අපවිත්‍රතාව | හදස් | චාරිත්‍රානුකූල අපවිත්‍ර තත්ත්වයන් |
| ගුස්ල් | සම්පූර්ණ පිරිසිදු කිරීම | ජනාබහ් | මහා අපවිත්‍ර තත්ත්වයන් |

**මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න**

# 4 වන පරිච්ඡේදය

# නැමදුම (සලාතය)

## ඉස්ලාමයේ කුළුණු පහ

**ඉස්ලාම් දහම මූලික කුළුණු පහක් මත ගොඩනැගී ඇත. මේවා සෑම මුස්ලිම්වරයෙකුටම අත්‍යවශ්‍ය වූ මූලික විශ්වාසයන් සහ වන්දනාමාන ක්‍රියාවන් වේ. ඒවා විශ්වාසයේ ක්‍රියාවන් සහ අධ්‍යාත්මිකත්වය සඳහා ශක්තිමත් පදනමක් සපයයි.**

නබි මුහම්මද් (සල්) තුමාණෝ මෙසේ පැවසූහ:

**ඉස්ලාම් දහම කුළුණු පහක් මත ගොඩනැගී ඇත: අල්ලාහ් හැර වෙන දෙවියෙකු නොමැති බවටත්, මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා බවටත් සාක්ෂි දීම, සලාතය (යාඥාව) ස්ථාපිත කිරීම, සකාත් (දානය) ගෙවීම, රමදාන් මාසයේ උපවාසය රැකීම, සහ හැකි නම් (කඃබාව) නම් වූ නිවස කරා හජ් (වන්දනාව) ඉටු කිරීමයි.**

(සහීහ් අල්-බුහාරි සහ සහීහ් මුස්ලිම්)

# සලාතය

## ඉස්ලාමයේ සලාතයේ (යාඥාවේ) වැදගත්කම

**සලාතය (යාඥාව) යනු ඉස්ලාම් දහමේ දෙවන කුළුණ වන අතර, එය ඉතා වැදගත් වන්දනාමාන ක්‍රියාවකි. එය සේවකයෙකු සහ ඔහුගේ පරමාධිපති අතර ඇති දෛනික සබඳතාවයි. යාඥාව තුළින් සිතට සාමය ලැබේ, ආත්මය පිරිසිදු වේ, සහ මුස්ලිම්වරයෙකුගේ ජීවිතය විනයගරුක හා සමබර වේ. එය නොමැතිව ඉස්ලාම් දහමට ස්ථාවරව පැවතිය නොහැක. මක්නිසාද යත්, ගමන් කරන විට හෝ පදිංචිව සිටින විට, යුධ හා සාම කාලවලදී, රෝගී හෝ නිරෝගී ඕනෑම තත්වයක් යටතේ එය ඉටු කරන ලෙස අල්ලාහ් විශ්වාසවන්තයින්ට අණ කළ බැවිනි.**

**සලාතය (යාඥාව) නොසලකා හැරීමෙන් කෙනෙකුගේ විශ්වාසය දුර්වල වී, විශ්වාසයේ හා පිළිවෙත්වල ක්‍රමික පරිහානියක් ඇති විය හැක. එය හුදෙක් ආගමික වතාවක් අතපසු කිරීමක් පමණක් නොව, මුස්ලිම්වරයෙකුගේ විශ්වාසය, සදාචාරය සහ ජීවිතයේ අරමුණ පෝෂණය කරන වැදගත් සම්බන්ධතාවක් දුර්වල වීමකි.**



## සලාතයේ ආනිසංසය

### 1- සත්‍ය විශ්වාසයේ  සලකුණක් ලෙස සලාතය

නබිතුමා මෙසේ පැවසීය: **මිනිසෙකු සහ ෂිර්ක් (බහු දේවවාදය) සහ කුෆ්ර් (අවිශ්වාසය) අතර ඇති සම්බන්ධය වන්නේ සලාතය අත්හැරීමයි.** (සහීහ් මුස්ලිම්, 82)

මෙය සලාතයේ ඇති වැදගත්කම ඉස්මතු කරයි.

### 2. සලාතය පව් මකා දමයි

ජලය ශරීරයෙන් අපිරිසිදු දේ ඉවත් කරනවා සේම සලාතය විශ්වාසවන්තයෙකුව පව් වලින් පිරිසිදු කරයි. නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසීය: **නුඹලාගෙන් කෙනෙකුගේ දොරකඩින් ගංගාවක් ගලා බසිනවා නම්, ඔහු දිනකට පස් වතාවක් එහි ස්නානය කළොත්, ඔහු මත කිසිදු අපිරිසිදුකමක් ඉතිරි වේද?** සහාබාහවරු මෙසේ පැවසූහ: **කිසිදු අපිරිසිදුකමක් ඉතිරි නොවනු ඇත.**

එවිට උන්වහන්සේ මෙසේ පැවසීය: **දිනපතා කරන පස් වේලාවේ සලාතය පිළිබඳ උපමාව එයයි. සැබවින්ම අල්ලාහ් ඒ තුළින් පව් මකා දමයි.** (සහීහ් අල්-බුහාරි)

### 3. සලාතය දුශ්චරිතය සහ නපුර වළක්වයි

**අල්ලාහ් ﷻ ශුද්ධ වූ අල්-කුර්ආනයේ මෙසේ පවසයි:**

**නියතව සලාතය ලැජ්ජාශීලී දේද, පිළිකුල් සහගත දේද වළක්වන්නේය. අල්ලාහ්ව සිහිකිරීම ඉමහත් දෙයක් වේ. අල්ලාහ් ඔබලා කරන දේ ගැන හොඳින් දනියි.** (29:45)

### 4. සලාතය සාමය සහ සන්සුන් බව ගෙනදෙයි

ජීවිතය දුෂ්කර වන විට, සලාතය හදවතට සහනයක් ගෙන දෙයි.

අල්ලාහ් පවසයි: **දැනගන්න, අල්ලාහ්ව සිහි කිරීම තුළින් සිත් සැණසුම ලබයි.** (13:28) තවද, නබිතුමා මෙසේ පවසති: "**අහෝ බිලාල්, සලාතය සඳහා ඉකාමා ඇරයුම කරන්න ඒ මගින් අපට සැනසීමක් ලබා දෙන්න.**" (සුනන් අබී දාවුද්, 4986)

## 5. සලාතය අල්ලාහ්ගේ ප්‍රේමය ගෙන දෙයි

අල්ලාහ් මෙසේ පවසයි: **මා විසින් ඔහුට අනිවාර්ය කළ දේට වඩා, මට වඩාත් ප්‍රිය කරන වෙනත් කිසිම දෙයකින් මා වෙත මාගේ ගැත්තා සමීප නොවන්නේය...** (සහීහ් අල්-බුහාරි, හදීස් කුද්සී)

දිනපතා පස් වරක් සලාතය ඉටු කිරීම මුස්ලිම්වරයෙකු අල්ලාහ් වෙත වඩාත් සමීප කරන අතර, ඔහුගේ ප්‍රේමය උපයා ගනී.

## 6. සලාතය විශ්වාසවන්තයාගේ ආලෝකයයි

නබිතුමා මෙසේ පැවසූහ:

"**සලාතය ආලෝකයකි (නූර්)**."

(සහීහ් මුස්ලිම්, 223)

මෙම ආලෝකය මෙලොවදී මෙන්ම විනිශ්චය දිනයේදීත් බැබළෙනු ඇත. එම දිනයේ අන්ධකාරයේදී විශ්වාසවන්තයාට උපකාර වනු ඇත.



## සලාතයේ කොන්දේසි:

1- **අනිවාර්යය**: බුද්ධිමත් සහ පරිණත (වැඩිවියට පත් වූ) සෑම මුස්ලිම් පිරිමියෙකුටම සහ කාන්තාවකටම සලාතය අනිවාර්ය වේ.

2- **චේතනාව:** කිසියම් නිශ්චිත සලාතයක් ඉටු කිරීමට සිත තුළ අභිප්‍රාය (නියාව) තැබීම.

3- **පාරිශුද්ධත්වය**: සුළු හෝ ප්‍රධාන අපිරිසිදුකම් වලින් තොර, චාරිත්‍රානුකූල පාරිශුද්ධත්වයේ (තහාරා) තත්වයක සිටීම.

4- **පවිත්‍රතාවය**: ශරීරයේ, ඇඳුම්වල සහ ස්ථානයේ පවිත්‍රතාවය අවුරා (පුද්ගලික කොටස්) ආවරණය කිරීම:

-පිරිමින් සඳහා: නාභියේ සිට දණහිස දක්වා.

-කාන්තාවන් සඳහා: මුහුණ සහ අත් හැර මුළු ශරීරයම.

6- **කිබ්ලාව** (කෑබා) දෙසට මුහුණලා සිටීම.

7- නියමිත **සලාතයේ වේලාවට පිවිසීම**: සලාතය සඳහා නියමිත වේලාව පැමිණ තිබීම.

**කිබ්ලා** යනු මක්කාවේ (සෞදි අරාබිය) පිහිටි කෑබාවේ දිශාවයි. මුස්ලිම්වරු සලාතය ඉටුකිරීමේදී මෙම දිශාවට මුහුණ ලන්නේ එය සලාතයේ වලංගුභාවය සඳහා මූලික කොන්දේසියක් වන අතර ඉස්ලාමයේ **එකමුතුකමේ** සහ **යටත් වීමේ** ප්‍රබල සංකේතයකි වන බැවිනි. කෙසේ වෙතත්, මුස්ලිම්වරු කාබාවට නමස්කාර

අනිවාර්ය සලාතයන් පහ, ඒවායේ රකාඅත් සහ වේලාවන්:

| සලාතය | රකාඅත් | වේලාව |
|---|---|---|
| **ෆජ්ර්** (අලුයම) | 2 | අහසේ පළමු ආලෝකය දිස් වූ මොහොතේ සිට සූර්ය උදාව දක්වා |
| **දුහර්** (මධ්‍යහන) | 4 | සූර්යයා මුදුන් වීමේ සිට (එය එහි උච්චතම ස්ථානයට පැමිණ මිනිත්තු 20 කට පමණ පසු) අසර් සලාතය සඳහා වේලාව දක්වා |
| **අසර්** (පස්වරුව) | 4 | අපර භාගයේ එනම් පස්වරුව වස්තුවක සෙවණැල්ල එහි දිගට සමාන වන වේලාවේ සිට මග්රිබ් සලාතයේ වේලාව දක්වා |
| **මග්රිබ්** (හිරු බැස යෑම) | 3 | හිරු බැස ගිය වෙලාවේ සිට ඉෂා සලාතය දක්වා කාලය |
| **ඉෂා** (රාත්‍රිය) | 4 | සන්ධ්‍යා ආලෝකය (හෝ හිරු එළියේ රතු පැහැය) ක්ෂිතිජයෙන් අතුරුදහන් වූ මොහොතේ සිට මධ්‍යම රාත්‍රිය දක්වා කාලය |

## සූරතුල්-ෆාතිහා: ආරම්භක පරිච්ඡේදය

**1- අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්** (සියළු ප්‍රශංසා විශ්වයේ මැවුම් කරුවා වන අල්ලාහ් සතුවේ.)
**2- අර්රහ්මානිර් රහීම්** ((ඔහු) අසීමිත කරුණාවන්තයාය අසම දයාවන්තයාය.)
**3- මාලිකි යව්මිද්දීන්** (විනිශ්චය දිනයෙහි අධිපති(ද ඔහුමය.))
**4- ඉය්යාක නඃබුදු වඉය්යාක නස්තඊන්** (ඔබම නමදිමු ඔබෙන් පමණක් උදව් පතමු.)
**5- ඉහ්දිනස් සිරාතල් මුස්තකීම්** (ඔබ අපව ඍජු මඟෙහි යවනු මැනව)

**6- සිරාතල්ලදීන අන්අම්ත අලයිහිම්** (එය ඔබ කවුරුන් කෙරෙහි ආශිංෂණය පිරිනැමුවෙහිද ඔවුන්ගේ මඟය.)
**7-ගයිරිල් මග්ලූබි අලෙයිහිම් වළද්දාල්ලීන් (**එය ඔබගේ කෝපයට ලක්වූවන්ගේද නොමඟ ගියවුන්ගේද මඟ නොවේ.)

## සලාතය ඉටු කිරීමේ පියවර:

### 1- සලාතය ඉටු කිරීමට පෙර, නිශ්චිත සලාතය ඉටු කිරීමේ චේතනාව (නියත්‍යාව) ඔබේ මනසේ තබා ගත යුතුය.

සිටගෙන ඔබේ නමස්කාරය ආරම්භක තක්බීර් සමඟින් පටන් ගන්න. ඒ සමඟම ඔබේ දෑත් උරහිස් මට්ටම දක්වා ඔසවන්න. තමාගේ නළල බිම ස්පර්ශ වන ස්ථානය දෙස බලමින්, **"අල්ලාහු අක්බර්"** (අල්ලාහ් ශ්‍රේෂ්ඨතමයාය) යැයි පවසන්න.





2- ඔබේ දකුණු අත වම් අත මත තබා දෙකම ඔබේ පපුව මත තබාගෙන **සූරත් අල්-ෆාතිහා** පාරායනය කරන්න. ඉන්පසු **තවත් සූරතයක්** හෝ වෙනත් කුර්ආන් වාක්‍ය කිහිපයක් පාරායනය කරන්න. සලාතයේ පළමු සහ දෙවන ඒකක (රකඅත්)හි මෙය කරන්න.

3- ඔබේ හිස සහ පිටුපස පහත් කර, ඒවා සෘජු කෝණයකින් කෙළින් තබාගෙන, ඔබේ දෑත් වල අත්ල දණහිස් මත තබමින්, හිස නමා **සුබ්හාන රබ්බියල් අලීම්** - (අති ශ්‍රේෂ්ඨ මගේ අධිපති ඉතාමත් පරිශුද්ධවන්තය) යනුවෙන් තුන් වරක් පවසා (රුකූ) කරන්න.





4- හිස නැමීමෙන් පසු කෙළින් සිටගන්න. ඔබේ දෑත් උරහිස් මට්ටම හෝ කන් මට්ටම දක්වා ඔසවා, **සමි අල්ලාහු ලි මන් හමිදා** (ප්‍රශංසා කරන අයට අල්ලාහ් සවන් දෙයි) යැයි පවසන්න. ඉන්පසුව **රබ්බනා ව ලකල්-හම්ද්** (අපගේ ස්වාමීනි, සියලු ප්‍රශංසා ඔබ වෙතම වේ) යැයි පවසන්න.

5- තක්බීර් කියා, පසුව සුජුද් කරන්න (දෙපා වල ඇඟිලි, දණහිස්, දෑත්, නළල සහ නාසය බිම තබා සුජුද් කරන්න), සුජුද් කරන විට තුන් වතාවක් මෙසේ කියන්න: සුබ්හාන රබ්බියල්-අ:ලා (මාගේ උත්තරීතර පරමාධිපති අල්ලාහ්ට මහිමය අත්වේවා. )





**6-** සුජූද් දෙක අතර හිඳගෙන මෙසේ කියන්න:
**රබ්බිග්ෆිර් ලී, වර්හම්නී** තේරුම: (අහෝ මාගේ පරමාධිපති, මට සමාව දී මට කරුණාව දක්වන්න. )



7- තක්බීර් (**අල්ලාහු අක්බ**ර්) කියමින් සුජූද් කරන ඉරියව්වෙන් නැගිට දෙවන රකඅතය ඉටු කිරීම සඳහා පියවර 2 සිට 6 දක්වා නැවත කරන්න

**8- දෙවන රකඅතෙහි දෙවන සුජූද් කිරීමෙන් පසු, වාඩි වී පළමු තෂහ්හුද් පාඨය මෙසේ කියවන්න:**



**අත්තහියියාතු ලිල්ලාහි, වස්සලවාතු වත්තය්යිබාතු , අස්සලාමු අලෙයික අය්යුහන් නබිය්යු වරහ්මතුල්ලාහි වබරකාතුහු, අස්සලාමු අලෙනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන්, අෂ්හදු අන්ලා ඉලාහා ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු**

(සියලු ප්‍රශංසා, සියලු යාඥාවන්, සහ යහපත් ක්‍රියාවන් අල්ලාහ් උදෙසාය. අහෝ නබිතුමනි, ඔබට සාමයත්, අල්ලාහ්ගේ කරුණාවත්, ඔහුගේ ආශිර්වාදයන්ද අත්වේවා. අපටත්, අල්ලාහ්ගේ සියලුම ධර්මිෂ්ඨ සේවකයන්ටත් සාමය අත්වේවා. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිවෙකු නොමැති බවත් මම සාක්ෂි පවසමි. තවද, මුහම්මද් (සල්) තුමාණන් අල්ලාහ්ගේ සේවකයා සහ අල්ලාහ්ගේ දූතයා බවත් මම සාක්ෂි පවසමි. )

**9-** සලාතය රකඅත් තුනකින් (මග්රිබ්) හෝ ඒකක හතරකින් (දුහර්, අස්ර්, ඉෂා") සමන්විත වන්නේ නම්, තක්බීර් කියමින් නැඟිට, තුන්වන රකඅත් සඳහා සිටගෙන, පෙර රකඅත් දෙකෙහි ඔබ කළ ආකාරයටම කරන්න. කෙසේ වෙතත්, තුන්වන සහ හතරවන රක්අතයන්හිදී, සූරත් අල්-ෆාතිහා පමණක් කියවිය යුතුයි, පළමු තෂහුද් සම්පූර්ණ කිරීමෙන් පසු අවසාන තෂහුද් කියවන්න.

**10 –** අවසාන රක්අතේ දෙවන සුජූද්යෙන් පසුව වාඩි වී සිටින ඉරියව්වකින් පළමු තෂහ්හුද් පාඨය පාරායනය කර, එයින් පසු අවසාන තෂහ්හුද් පාඨය පාරායනය කරන්න: **අල්ලාහුම්ම සල්ලි අ:ලා මුහම්මද්, ව අ:ලා ආලි මුහම්මද්, කමා සල්ලය්ත අ:ලා ඉබ්‍රාහීම් ව අ:ලා ආලි ඉබ්‍රාහීම්, ඉන්නක හමීදුම් මජීද්, ව බාරික් අ:ලා මුහම්මද්, ව අ:ලා ආලි මුහම්මද්, කමා බාරක්ත අ:ලා ඉබ්‍රාහීම ව අ:ලා ආලි ඉබ්‍රාහීම, ඉන්නක හමීදුම් මජීද්,** (අහෝ අල්ලාහ්, ඔබ ඉබ්‍රාහීම් තුමාට සහ ඉබ්‍රාහීම් තුමාගේ පවුලේ අයට ගෞරව කළාක් මෙන්, මුහම්මද් තුමාට සහ මුහම්මද් තුමාගේ පවුලේ අයට ගෞරව කරන්න. සැබවින්ම, ඔබ ප්‍රශංසනීය හා මහිමාන්විතය.අහෝ අල්ලාහ්, ඔබ ඉබ්‍රාහීම් තුමාට සහ ඉබ්‍රාහීම් තුමාගේ පවුලේ අයට ආශිර්වාද කළාක් මෙන්, මුහම්මද් තුමාට සහ මුහම්මද් තුමාගේ පවුලේ අයට ආශිර්වාද කරන්න. සැබවින්ම, ඔබ ප්‍රශංසනීය හා මහිමාන්විතය.)

සලාතය අවසන් කිරීම සඳහා, ඔබේ මුහුණ දකුණු පැත්තට හරවා අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහ් (ඔබට අල්ලාහ්ගේ සාමය හා දයාව ලැබේවා) යනුවෙන් පවසන්න. ඉන්පසු ඔබේ මුහුණ වම් පැත්තට හරවා නැවතත් එම පාඨයම කියන්න.



## සලාතයේ කුළුණු (අර්කාන්)

මේවා සලාතයේ **අත්‍යවශ්‍ය** අංගයන් වන අතර, සලාතය වලංගු වීමට නම් මේවා ඉටු කළ යුතුය. මේවායින් කිසිවක් **දැනුවත්ව හෝ නොදැනුවත්ව** අතපසු කළහොත්, සලාතය අවලංගු වන අතර එය නැවත ඉටු කළ යුතුය.

1. **සිටගෙන ඉටුකිරීම (කියාම්)**
   හැකියාව ඇති අයට අනිවාර්ය සලාතයේදී අනිවාර්ය වේ.
2. **ආරම්භක තක්බීරය**
3. **සූරා අල් ෆාතිහාව පාරායනය කිරීම (** සෑම රකාතයකදීම **)**
4. **අර් රුකූඋ (නැමීම)**
5. **රුකුවේ සිට නැගිටීම**
6. **නැගිට කෙළින් සිටීම** (රුකූඋ)
7. **ප්‍රණාමය කිරීම** (සුජූද්)
8. **සුජූද් දෙක අතර ඉඳ ගැනීම**
9. **අවසාන වාඩිවීම** (තෂහ්හුද්)
10. **තස්ලීමය**



## සලාතයේ අනිවාර්යය ක්‍රියාවන් (වාජිබාත්)

මෙම ක්‍රියාවන් ද සලාතයේ වැදගත් කොටස් වේ. නමුත් යමෙකු ඒවා **අමතක කළහොත්** (හිතාමතා නොවේ නම්), සලාතය වලංගු වන අතර, එම පුද්ගලයා අවසානයේදී **සුජූද් අල්-සහ්ව්** (අමතක වීමේ සුජූද්) කළ යුතුය.

1. **ආරම්භක තක්බීර් හැර අනෙකුත් සියලුම තක්බීරාත්.**
2. **සමිඅල්ලාහු ලි මන් හමිදා පැවසීම**
3. **රබ්බනා ව ලකල්-හම්ද් පැවසීම**
4. **රුකුහි සුබ්හාන රබ්බියල්-අදීම් පැවසීම**
5. **සුජූද් හි සුබ්හාන රබ්බියල්- අ:ලා පැවසීම**
6. **පළමු තෂහ්හුද් කියවීම**

## අමතක වීමේ සුජුද් දෙක (සුජුද් අල්-සහ්ව්)

මෙය සලාතය අවසානයේදී සිදුකරන සුජුද් දෙකක් වන අතර, සලාතය අතරතුර සිදුවූ ඇතැම් වැරදි සඳහා වන්දි ගෙවීම සඳහා විශේෂයෙන් සකස් කර ඇත.ඔබ නොදැනුවත්වම සලාතයට යමක් එක් කළා නම්, එයින් යමක් අඩු කළා නම්, හෝ එහි කොටසක් පිළිබඳ සැක කළා නම් පවා, ඔබේ සලාතය වලංගු සහ සම්පූර්ණ බව තහවුරු කිරීමට එය උපකාරී වේ.ඉබ්නු මස්ඌද් (රලි.) තුමාණන් වාර්තා කළේ, නබි (සල්) තුමාණන් මෙසේ පැවසූ බවයි: **යමෙක් තම සලාතයට යමක් එකතු කළහොත් හෝ එයින් යමක් අඩු කළහොත්, ඔහු සුජුද් දෙකක් කළ යුතුය.**
(සහීහ් බුහාරි සහ මුස්ලිම්)



## අමතක වීමේ සුජුද් දෙක ඉටුකරන්නේ කෙසේද ?

- **තස්ලීමයට පෙර:** අවසාන තෂහ්හුද්ට පසු, සුජුද් දෙකක් සිදු කරන්න, පසුව ඔබේ අවසාන තස්ලීම් දෙන්න.
  හෝ
- **තස්ලීමයට පසු:** සුපුරුදු පරිදි ඔබේ අවසාන තස්ලීම් දෙන්න, පසුව වහාම සුජුද් දෙකක් සිදු කරන්න, ඉන්පසු නැවත තස්ලීම් දෙන්න.
- කෙසේ වෙතත්, ඔබ සිටගෙන සිටීමෙන් පසු හෝ සලාතය කළ ස්ථානයෙන් ඉවත් වූ පසු හෝ එම මොහොතේදී සැකයක් ඇති වුවද, නැවත සුජුද් අල්-සහ්ව් කිරීමට අවශ්‍ය නොවන අතර, සලාතය වලංගු යැයි සැලකේ.

## සලාතය නිෂ්ඵලවන කරුණු

1- වුදූ නැතිවීම

2- සලාතයේ යෙදී සිටියදී කතා කිරීම, සිනාසීම, ආහාර ගැනීම හෝ පානය කිරීම

3- සලාතයේ කිසියම් කුළුණු හෝ අනිවාර්ය ක්‍රියාවක් හිතාමතාම අත්හැරියහොත්

# සලාතයට කැඳවීම (අදාන්)

එය මුස්ලිම්වරුන්ට අනිවාර්ය සලාතයන් ඉටු කිරීමට ආරාධනා කිරීම සඳහා දිනකට පස් වතාවක් නිවේදනය කරන ලද සලාතය සඳහා වන කැඳවීමයි. අදාන් හොඳින් ශබ්ද නඟා කියවිය යුතු අතර එමගින් මිනිසුන්ට එය ඇසී මස්ජිදයට පැමිණ සමූහ සලාතය ඉටු කිරීමට හැකිවේ.



## අදාන්

1. අල්ලාහු අක්බර් "අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයි" (හතර වතාවක්)

2. අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ් "නැමදීමට යෝගයවූ ස්වාමියා අල්ලාහ් හැර වෙන කිසිවෙකු නොමැති බවට මම සාක්ෂි දරමි" (දෙවරක්)

3. අෂ්හදු අන්න මුහම්මදර් රසූල්ලුල්ලාහ් "මුහම්මද් නබි ﷺ තුමා අල්ලාහ්ගේ රසූල්වරයා බවට මම සාක්ෂි දරමි" (දෙවරක්)

4. හය්ය අලල් සලාහ් "සලාතය සඳහා පැමිණෙන්න" (දෙවරක්)

5. හය්ය අලල් ෆලාහ් "ජය ලැබීමට පැමිණෙන්න" (දෙවරක්)

6. අල්ලාහු අක්බර් "අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයි" (දෙවරක්)

7. ලා ඉලාහ ඉල්ලල්ලාහ් "අල්ලාහ් හැර නැමදීමට සුදුසු දෙවියෙකු නැත " (එක් වරක්)

### සමූහ සලාතය

සමූහයක් ලෙස ඉටු කරන සලාතයට ලැබෙන විපාකය, තනිව ඉටු කරන සලාතයට වඩා විසිහත් ගුණයකින් උතුම්ය යනුවෙන් නබිතුමාණන් පැවසූහ

(බුහාරි 619 සහ මුස්ලිම් 650)



**මෙම සලාතය අවම වශයෙන් දෙදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් විසින් ස්ථාපිත කළ හැකි අතර, ඔවුන්ගෙන් එක් අයෙකු සලාතයේ නායකයා ලෙස (ඉමාම්) කටයුතු කරයි.**

- ඉමාම්වරයා කිබ්ලාව දෙසට මුහුණලා, පේළියේ ඉදිරියෙන් සිට ගනී.
- ඉමාම්වරයාට පිටුපසින් සලාතය ඉටු කරන අය, සලාතයේ සෑම ක්‍රියාවකදීම ඔහුව අනුගමනය කළ යුතුය.
- යම් පුද්ගලයෙකු, ඉමාම්වරයා රුකූඋ කළ පසු, සමූහ සලාතයට එකතු වුවහොත්, ඔහුට එම රකඅතය මග හැරී ඇත. ඔහු ඉමාම්වරයා අවසාන සලාම් දීමෙන් පසු මග හැරුණු රකආතය නැවත ඉටු කළ යුතුය.

## අදාන්හි සුන්නාහ්:

### A. අනිවාර්ය සලාතයන්ට අදාළ නිර්දේශිත ස්වේච්ඡා සලාතයන්:

| සලාතයන් | පෙර (සුන්නා රකාඅතයන්) | පසු (සුන්නා රකාඅතයන්) |
|---|---|---|
| **ෆජ්ර්** | **2** | **කිසිවක් නැත** |
| **දුහර්** | **2 (හෝ 4)** | 2 |
| **අසර්** | **කිසිවක් නැත** | **කිසිවක් නැත** |
| **මග්රිබ්** | **කිසිවක් නැත** | **2** |
| **ඉෂා** | **කිසිවක් නැත** | **2** |

### B. රාත්‍රී සලාතය සහ විතර්


රාත්‍රී සලාතයේ වේලාව ඉෂා සලාතයෙන් පසු ආරම්භ වී ෆජ්ර් සලාතය දක්වා වේ. රාත්‍රී සලාතය සඳහා අවම කාලය රකඅත් ගණන දෙකකි (යුගල වශයෙන් - දෙකින් දෙකට ඉටු

කරනු ලැබේ), සහ උපරිම වශයෙන් රකඅත් අටක් ඉටු කළ හැකි වන අතර, එයට අමතරව විතර් සලාතය ඉටු කළ යුතුය. විත්ර සලාතය යනු ඔත්තේ අංකිත සලාතයකි. විත්ර සලාතය සඳහා අවම රකඅත් ගණන එකකි, නමුත් තුනක් ඉටු කිරීම නිර්දේශ කෙරේ.

## සිකුරාදා සලාතය: ජුම්ආ සලාතය

අල්ලාහ් ﷻ මෙසේ පවසයි: **" විශ්වාස කළවුනි! සිකුරාදා දිනයෙහි සලාතය සඳහා අදාන් (ආරාධනා) කළ පසු අල්ලාහ්ව සිහි කිරීම කරා ඔබලා වේගවත්ව යන්න. තවද වෙළෙඳාමද හැර දමන්න. ඔබලා දන්නන්වේ නම් මෙයම ඔබලාට වඩාත් ශ්‍රේෂ්ඨවේ. "**

- සලාතුල් ජුම්මා යනු සෑම සිකුරාදා දිනකම දහවල් (ළුහර් වේලාව) පමණ පැවැත්වෙන සතිපතා පොදු සලාතයකි. එය මෙම දිනයේ දහවල්-ළුහර් සලාතය ප්‍රතිස්ථාපනය කරයි.
- මස්ජිදයේ සලාතුල් ජුම්ආවට සහභාගී වීම සඳහා වැඩිහිටි, සිහිබුද්ධිය ඇති, ස්ථිර පදිංචිකරුවෙකු සහ ශාරීරිකව හැකියාව ඇති සෑම මුස්ලිම් පුරුෂයෙකුටම **දැඩි වගකීමක් වේ (ෆර්ද්)** .



- ඉමාම් (සලාතයේ නායකයා) කොටස් දෙකකින් යුත් දේශනයක් පවත්වන අතර, පසුව ඒකක දෙකක් (රක්අත්) සමූහ සලාතය ඉටු කරයි. මෙම ඒකක දෙකකින් යුත් සලාතය ඔබගේ දෛනික ළුහර් සලාතය සම්පූර්ණ කරයි.
- වලංගු ජුම්මාවක් සඳහා අවම වශයෙන් පිරිමි පදිංචිකරුවන් 40 දෙනෙකු අවශ්‍ය වන අතර ඔවුන් සමූහ වශයෙන් ජුම්මා සලාතය ඉටු කිරීමට බැඳී සිටී.
- සලාතුල් ජුම්මා ඉටු කිරීමෙන් නිදහස් වන පුද්ගලයන් අතරට කාන්තාවන්, සංචාරකයින්, සහ දැඩි රෝගී තත්ත්වයන් හෝ ආබාධ සහිත පුද්ගලයින් ඇතුළත් වේ. ඔවුන් නියමිත වේලාවට ඔවුන්ගේ සාමාන්‍ය ළුහර් සලාතය ඉටු කළ යුතුය.

## සිකුරාදා: නිර්දේශිත පිළිවෙත් සහ ආචාර ධර්ම (සුන්නත් සහ අදබ්)

- **සිකුරාදා යනු මුස්ලිම්වරුන් සඳහා අතිමහත් වැදගත්කමක් සහ ආශිර්වාදයක් සහිත දිනයකි. මෙම දිනයේ අතිශයින් නිර්දේශිත ක්‍රියාවන් වන්නේ:**

- සම්පූර්ණ චාරිත්‍රානුකූල ස්නානය (ගුස්ල්) කිරීම
- ඔබේ හොඳම, පිරිසිදු ඇඳුම් ඇඳීම, සහ පිරිමින් සුවඳ විලවුන් ආලේප කිරීම
- සූරා අල්-කහ්ෆ් පාරායනය කරන්න.
- නබි මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ට සලාම් (ආශිර්වාද) යැවීම.
- සලාතුල් ජුම්මා (සිකුරාදා යාඥාව) සඳහා කලින් පැමිණීම
- ඉමාම්වරයාගේ දේශනාවට සම්පූර්ණ නිශ්ශබ්දතාවයකින් සහ අවධානයකින් යුතුව සවන් දීම.

## මගීන්ගේ සලාතය

**"ඔබලා පොළොවෙහි ගමන් කරන විට ප්‍රතික්ෂේප කළවුන් ඔබලාට පහර දෙන්නෝය යි. බිය වූයේ නම් ඔබලා සලාතය කෙටි කර ගැනීම ඔබලා කෙරෙහි වරදක් නැත.** (4:101)

සලාතයන් කෙටි කිරීම සහ එකතු කිරීම මඟින් සංචාරකයා ගමන් බිමන් වලදී විඳින දුෂ්කරතා ලිහිල් කිරීමට උපකාරී වේ. දින හතරකට වඩා අඩු කාලයක් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගමන් කරන විට, සංචාරකයෙකුට ඔහුගේ සලාතයන් කෙටි කළ හැකිය.

| කෙටි කරන සහ ඒකාබද්ධ කරන ලද රකාඅතයන් | කාලය |
|---|---|
| ෆජ්ර් (රකාඅතයන් 2) | **ෆජ්ර් වේලාව** |
| **දුහර් (රකාඅතයන් 2) සහ අසර් (රකාඅතයන් 2)** | ඒවායින් ඕනෑම එකක වේලාවට |
| මග්රිබ් **(රකාඅතයන් 3) සහ ඉෂා (රකාඅතයන් 2)** | **ඒවායින් ඕනෑම එකක වේලාවට** |

- ෆජ්ර් සලාතයේ සුන්නාව හැර අනිවාර්ය සලාතයන් සමඟ නිතිපතා ඉටු කරනු ලබන සුන්නත් සලාතයන් අත්හැරීමට සංචාරකයින්ට අවසර ඇත.
- සිකුරාදා ජුම්මා සලාතය අත්හැරීමට අවසර ඇත.
- උපවාසකරුවෙකුට තම උපවාසය අත්හැරීමට අවසර ඇත.

## රෝගීන්ගේ සලාතය

මුස්ලිම්වරයෙකු සිහිකල්පනාවෙන් සහ මානසිකව නිරෝගීව සිටින තාක් කල්, සියලු තත්වයන් යටතේ අනිවාර්ය යාඥාවන් ඉටු කිරීමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ඉස්ලාමය, මිනිසුන්ට ඇති විය හැකි විවිධ තත්වයන් සහ අවශ්‍යතා හඳුනා ගන්නා අතර, එම නිසා රෝගී අයට අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.

**රෝගීන්ගේ සලාතය සඳහා වූ සහන:**

- කෙනෙකුට සිටගෙන සිටීමට නොහැකි තරම් අසනීප නම්, ඔහුට වාඩි වී සිටියදී **සලාතය** ඉටු කිරීමට අවසර ඇත.

- ඔහුට වාඩි වීමට නොහැකි නම්, ඔහුට පැත්තකට ඇල වී වැතිර **සලාතය** ඉටු කළ හැකිය. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ: සිටගෙන **සලාතය** ඉටු කරන්න ඔබට එසේ කළ නොහැකි නම්, වාඩි වී **සලාතය** ඉටු කරන්න. ඔබට වාඩි වී **සලාතය** ඉටු කළ නොහැකි නම්, ඔබේ පැත්තට ඇල වී වැතිර **සලාතය** ඉටු කරන්න.

  (අල්-බුහාරි 1066)
- ඔහුට හිස නමා රුකූඋ හෝ බිම වැටී සුජූද් හෝ කළ නොහැකි නම්, ඔහු හැකි තරම් ඉදිරියට නැමිය යුතුය.
- බිම වාඩි වී සිටීමට නොහැකි නම්, ඔහුට පුටුවක් හෝ ඒ හා සමාන ආධාරකයක් භාවිතා කළ හැකිය.
- අසනීප තත්ත්වය නිසා රෝගියාට සෑම සලාතයක් සඳහාම වුදූ (ජලයෙන් පවිත්‍ර වීම) කිරීමට නොහැකි නම්, ඔවුන්ට සලාතය එකතු කිරීමට අවසර ඇත. උදාහරණයක් ලෙස, ඔහුට පහත සඳහන් දෑ ඒකාබද්ධ කළ හැකිය:

  දුහ්ර් සහ අස්ර් (දහවල් සහ සවස),

  මග්රිබ් සහ ඉෂා (සන්ධ්‍යා සහ රාත්‍රී)

අසනීප තත්ත්වය හේතුවෙන් රෝගී පුද්ගලයාට ජලය භාවිතා කිරීමට නොහැකි නම්, ඔහුට තයම්මුම් (වියළි පවිත්‍ර වීම) ඉටු කර පසුව ඔහුගේ යාඥාව ආරම්භ කළ හැකිය.

## අරාබි නියමයන්

| අරාබි වචනය | අර්ථය | අරාබි වචනය | අර්ථය |
|---|---|---|---|
| සකාත් | නියමිත කාලයකදී දෙන පුණ්‍ය දානය | සෞම් | රමදාන් මාසයේ උපවාස |
| හජ් | වන්දනා ගමන | කුෆ්ර් | අවිශ්වාසය |
| නූර් | ආලෝකය | අව්රා | ශරීරයේ ආවරණය කළ යුතු පෞද්ගලික කොටස් |
| කිබ්ලාහ් | කඃබාවේ දිශාව | රකාඅතයන් | සලාතයේ ඒකකය |
| ෆජ්ර් | අළුයම | දුහර් | දහවල් |
| අසර් | සවස | මග්රිබ් | සන්ධ්‍යා |
| ඉෂා | රාත්‍රී | රබ්බිග්ෆිර් ලී | අහෝ දෙවියනි, මට සමාවන්න |
| වර්හම්නී | සහ මට දයාව දක්වන්න | සුජූද් | බිම වැඳීම |
| රුකූඋ | හිස නැමීම | තස්ලීම් | සලාම් කීම |
| අදාන් | සලාතය සඳහා වන කැඳවීම | ඉමාම් | සලාතය මෙහෙයවන්නා |
| සුන්නත් | නබි මුහම්මද් තුමාගේ වදන් හෝ ක්‍රියාව | ජුම්මා | සිකුරාදා |
| ආදාබ් | ආචාර ධර්ම | | |

**මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න.**

# 5 වන පරිච්ඡේදය

# සකාත්

## සකාත් යනු කුමක්ද?

සකාත් යනු අවම **නිසාබ්** ( **සීමාවේ ප්‍රමාණය** ) ඉක්මවා ඇති කෙනෙකුගේ වස්තුව (ධනය) මත ගෙවිය යුතු විශේෂ පුණ්‍ය කටයුත්තකි. එය වාර්ෂිකව නිශ්චිත වේලාවක ඇතැම් නිශ්චිත පුද්ගලයන්ට ලබා දෙනු ලැබේ.

**සදකා** යනු සර්වබලධාරී අල්ලාහ් වෙත සමීප වීමේ අරමුණින් අසරණයින්ට ලබා දෙන සෑම දෙයක්ම වන්නේය, එය මුදල් හෝ ආහාර හෝ වෙනත් ඕනෑම දෙයක් වේවා. එය අනිවාර්ය සකාත් වලට පමණක් සීමා නොවන අතර, කරන සෑම යහපත් ක්‍රියාවක්ම ඇතුළත් වේ.

**නිසාබ් (අවම සීමාව):** සකාත් අනිවාර්ය වීමට නම්, මුස්ලිම්වරයෙකු සතුව තිබිය යුතු අවම ධන ප්‍රමාණය සඳහා වන නිශ්චිත ඉස්ලාමීය පදය එයයි.

## සකාත් වැදගත් වන්නේ ඇයි ?




**සකාත් යනු** ඉස්ලාමයේ තුන්වන කුළුණයි - අල්ලාහ් ﷻ (දෙවියන්) සියලුම මුස්ලිම්වරුන්ට ඉටු කිරීමට අණ කර ඇති මූලික නමස්කාර ක්‍රියාවකි. අල්ලාහ් ﷻ මුස්ලිම්වරුන්ට සකාත් නියම කර ඇත.

අල්-කුර්ආනයේ, අල්ලාහ් මෙසේ පවසයි: ***"සලාතය තහවුරු කර, සකාතයද දෙන්න. ඔබලා, ඔබලා වෙනුවෙන් පෙරටු කරන යහකම් කුමක් වුවත් (එලොවේදී) එ(හි ඵල)ය අල්ලාහ් හමුවෙහි ලබාගන්නෙහුය. නියතව අල්ලාහ් ඔබලා කරන දෙය බලන්නාය.."*** (2:110)

තවද, නබි මුහම්මද් ﷺ තුමා මෙසේ පැවසීය:

**ඉස්ලාමය පදනම් වී ඇත්තේ කරුණු පහක් මත ය: අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බවත්, මුහම්මද් තුමා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දීම, සලාතය ස්ථාපිත කිරීම, සකාත් ගෙවීම, හජ් ඉටු කිරීම සහ රමදාන් මාසයේ උපවාසය.**

**(බුහාරි සහ මුස්ලිම්)**

## සකාත් දීමේ ආශිර්වාදය සහ අරමුණු

සකාත් මගින් හදවත තණ්හාවෙන් පවිත්‍ර කරයි, සමාජ සමගිය ශක්තිමත් කරයි, අල්ලාහ්ට කරන සැබෑ වන්දනාව සහ කීකරුකම පිළිබිඹු කරයි, සහ සමාජය තුළ ධනය සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කරයි.

## සකාතය සඳහා අනිවාර්ය වන වස්තූන් වර්ග




**1- රන් සහ රිදී (කාන්තාවන් විසින් පැළඳ සිටින ආභරණ හැර).** ඒවායේ වටිනාකම නිසාබ් (අවම සීමාව) කරා ළඟා වී එක් පූර්ණ චන්ද්‍ර වර්ෂයක් පුරා තබාගෙන ඇත්නම් සකාත් ගෙවීම අනිවාර්ය වේ.

**නිසාබ්:**

රන්: ග්‍රෑම් 85

රිදී: 595

සකාත් අනුපාතය: මුළු ප්‍රමාණයෙන් 2.5

### 2- ව්‍යවහාර මුදල් (මුදල් , බැංකු නෝට්ටු, කාසි)

**නිසාබ්** ගණනය කරනු ලබන්නේ, ග්‍රෑම් 85 ක රන්වල වත්මන් වෙළඳපොළ වටිනාකම මත පදනම්වයි. එය සම්පූර්ණ චන්ද්‍ර වර්ෂයක් තබාගෙන තිබේ නම්, 2.5%ක් සකාත් ලෙස ගෙවිය යුතු වේ.

උදාහරණයක්:

a) ඔබ සතුව මුළු වසරක් පුරා ඉතිරි කිරීම් ලෙස කුවේට් දිනාර් 1000ක් තිබේ නම්, ඔබේ සකාත් වනුයේ:1000 x 2.5 ÷100 =25.

b) රන් ග්‍රෑම් 1ක් = $25 (ඩොලර් 25ක්), නම්:
$25 × 85 = $2125 → මෙය සකාත් අනිවාර්ය වන අවම මුදල වේ.

### 3- වාණිජ භාණ්ඩ

මෙයට, වෙළඳාම සඳහා ආයෝජනය කිරීමේ අරමුණින් හිමිකාරීත්වය දරන, වත්කම්, නිශ්චල දේපළ සහ වෙළඳ භාණ්ඩ හා ආහාර නිෂ්පාදන වැනි ද්‍රව්‍ය ඇතුළු සියලුම ආකාරයේ දේපළ අයත් වේ. වාණිජ වත්කම්වල වටිනාකම එවැනි වෙළඳ භාණ්ඩ සම්පූර්ණ චන්ද්‍ර වර්ෂයක් පුරා තබාගෙන තිබේ නම්, සකාත් ගෙවීමට නියමිත දිනට වෙළඳපොළ මිල ගණන් මත පදනම්ව ඒවායේ වටිනාකම තක්සේරු කළ යුතුය. මෙම වටිනාකම නිසාබ් (අවම සීමාව) කරා ළඟා වේ නම්, 2.5%ක් සකාත් ලෙස ගෙවිය යුතු වේ.



## 4- කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සකාත් නීති

අල්ලාහ් ﷻ කුර්ආනයේ මෙසේ පවසයි: **"විශ්වාස කළවුනි! ඔබලා උපයාගත් දේවලින්ද, අප ඔබලාට පොළොවෙන් පිට කර තිබෙන දේවලින්ද පිරිසිදු දෙයම (යහ මගෙහි) වියදම් කරන්න"** (2:267)

### සකාත්හි රීතිය:

- **විශේෂිත බෝග වර්ග සඳහා පමණක් අදාළ වේ..**

4- නිසාබ් (අවම ප්‍රමාණය) සපුරාලිය යුතුය.

5- ජල සම්පාදනය සඳහා වැය වන වෙහෙස සහ පිරිවැය අනුව ප්‍රතිශතය වෙනස් වේ..

### 5- පශු සම්පත්

සකාත් ගවයන්, ඔටුවන්, සහ බැටළුවන්/එළුවන් වැනි සතුන් සඳහා අනිවාර්ය වන්නේ නම්:

6- ඔවුන් නොමිලේ තණබිම් වල තණකොළ කෑමට යොදා තිබිය යුතුයි.
7- අයිතිකරු නිතිපතා ඔවුන්ට ආහාර සපයන්නේ නැත (ආහාර සඳහා විශාල වියදමක් නොමැත).
8- අයිතිකරු වසරේ වැඩි කාලයක් ආහාර සපයන්නේ නම්, සකාත් ගෙවීමට අවශ්‍ය නොවේ.



නිසාබ් සහ ඊට අදාළ නීති රීති පිළිබඳ වැඩිදුර විස්තර ඉස්ලාමීය නීති විද්‍යාවේ (ෆික්හ්) ග්‍රන්ථවලින් ලබා ගත හැක.

## සකාත් ලැබිය යුත්තන්

අල්-කුර්ආනයේ සඳහන් වන පරිදි සකාත් ලැබීමට සුදුසුකම් ලබන පුද්ගලයින් කාණ්ඩ අටක් ඉස්ලාම් දහම විසින් නිර්වචනය කර ඇත.: **" සකාත් නැමති යුතුකම වූ දානය දිළිඳුන්ටද, දුප්පතුන්ටද, එම කාර්යය සඳහා සේවය කරන්නන්ටද, (ඉස්ලාමය දෙසට) සිත් ඇදී සිටින්නන්ටද, වහලුන්ව නිදහස් කිරීමටද, ණයකරුවන්ටද, අල්ලාහ්ගේ මගෙහි (සටන් කරන්නන් ලෙස) සිටින්නන්ටද, මගියාටද අයත් වේ. (මෙය) අල්ලාහ්ගෙන් වූ වගකීමක් වේ. අල්ලාහ් හොඳින් දන්නාද අධික ඥානවන්තයාද වේ..** (9:60)

1. **දුප්පතුන්**
   අතිශය දරිද්‍රතාවයේ ජීවත් වන සහ ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගත නොහැකි අය.

2. **අගහිගකම් ඇති අය**
   දුප්පතුන්ට වඩා තරමක් යහපත් වුවත් ඔවුන්ගේ අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීමට තවමත් අරගල කරන අය.

3. **සකාත් එකතු කරන්නන්**
සකාත් එකතු කිරීම, කළමනාකරණය කිරීම සහ බෙදා හැරීම සඳහා පත් කරන ලද පුද්ගලයින්.

4- **වහල්භාවයෙන් නිදහස පතන අය**
වහලුන් හෝ සිරකරුවන්, ඔවුන්ගේ නිදහස දිනා ගැනීම සඳහා මූල්‍ය ආධාර අවශ්‍ය අය (අද කාලයේ එතරම් අදාළ නොවේ).

5 **ණයගැතියන්**
පෞද්ගලික හෝ මහජන ප්‍රතිලාභ සඳහා ණය වී එය ආපසු ගෙවිය නොහැකිව සිටින පුද්ගලයින්.

6- **අල්ලාහ්ගේ මාර්ගයේ සිටින්නන්**
ආගම ආරක්ෂා කිරීම හෝ ඉස්ලාමීය දැනුම ව්‍යාප්ත කිරීම වැනි අල්ලාහ්ගේ මාර්ගයේ වෙහෙසෙන අය.

7- **නවක මුස්ලිම්වරු**
මෑතකදී ඉස්ලාමය පිළිගත් හෝ එය වැළඳ ගැනීමට ආසන්න පුද්ගලයින්. (අරමුදල් විශ්වාසදායක ඉස්ලාමීය මධ්‍යස්ථාන හෝ සංවිධාන හරහා යයි.)

8 - **අතරමං වූ සංචාරකයින් (ابن السبيل):**
තම මව් රටේ ධනවත් වුවද ගමනක් අතරතුර මූල්‍ය ආධාර අවශ්‍ය වූ සංචාරකයින්.

## අරාබි නියමයන්

| අරාබි වචනය | අර්ථය | අරාබි වචනය | අර්ථය |
|---|---|---|---|
| සදකා | දානය / පුණ්‍යකර්මය | නිසාබ් | අවම සීමාව |

**මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න.**

# 6 වන පරිච්ඡේදය

# උපවාසය

## රමදාන්: ආශීර්වාදලත් උපවාස මාසය

රමදාන් මාසයේ උපවාසය ඉස්ලාමයේ සිව්වන කුළුණයි.

සර්වබලධාරී අල්ලාහ් මෙසේ පැවසීය: "විශ්වාස කළවුනි ඔබලා (අල්ලාහ්ට) බිය වී ක්‍රියා කිරීම පිණිස ඔබලාට පෙර සිටියවුන් කෙරෙහි නියම කරනු ලැබුවා සේ ඔබලා කෙරෙහිද උපවාසය නියම කර ඇත." (2:183)

රාමදාන් යනු ඉස්ලාමීය චන්ද්‍ර දින දර්ශනයේ නවවන මාසයයි.එය අල් කුර්ආනය ලයිලතුල් කද්ර් හෙවත් මහත් වූ බලයේ රාත්‍රිය ලෙස හඳුන්වන ශ්‍රේෂ්ඨ රාත්‍රියකදී පහළ කරන ලද මාසයයි.

**සුහුර්** යනු රාමදාන් මාසයේදී මුස්ලිම්වරුන් විසින් තම උපවාසය ආරම්භ කිරීමට පෙර අලුයම අනුභව කරනු ලබන ආහාර වේලයි. මෙය නබිතුමා විසින් මුස්ලිම්වරුන් දිරිමත් කරන ලද ආශිර්වාද ලත් ක්‍රියාවකි. යමෙක් එම දවසේ අල්ලාහ් වෙනුවෙන් උපවාස කිරීමට තම සිතෙහි නියයාව (චේතනාව) තබා ගත යුතුය. නබිතුමා පැවසුවේ: **සුහුර් ගන්න. මක්නිසාද යත්, නියත වශයෙන්ම එහි බරකාහ් (ආශිර්වාදය) ඇත. (සහීි අල්-බුහාරි, 1923)**

## උපවාසය යනු කුමක්ද ?



උපවාසය යනු අලුයම සිට හිරු බැස යන තෙක් ආහාර, පාන වර්ග සහ උපවාසය අවලංගු කරන සියල්ලෙන් වැළකී සිටීමට අවශ්‍ය වන නැමදුම් ක්‍රියාවලියකි. මෙය ආහාර පානවලින් වැළකී සිටීම පමණක් නොවේ එය අල්ලාහ් වෙත සමීප වීමට, ආත්ම දමනය පුහුණු වීමට සහ දුප්පත් අයට අනුකම්පාව දැක්වීමට කරන ආධ්‍යාත්මික ගමනකි.

## උපවාසයේ මහිමය

අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් පැවසූ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කළේය.

**මිනිසෙකු කරන සියලු නැමදුම් ඔහුට අයත් වේ උපවාසය හැර එය මටයි මම එයට විපාක දෙන්නෙමි යනුවෙන් අල්ලාහ් පැවසීය. උපවාසය පලිහකි. ඔබ අතරින් යමෙකු උපවාසිකයකුව සිටින විට ඔහු ලිංගික ක්‍රියාකාරකම්වල නිරත නොවිය යුතුය , හඬ නැගීම නොකළ යුතුය යමෙක් ඔහුට බැණ වදින්නේ නම් හෝ ඔහු සමග රණ්ඩු කරන්නේ නම් ඔහු මම උපවාසය රකිමි" පැවසිය යුතුය. මුහම්මද් තුමාගේ ජීවිතය කාගේ අතේ ද උන්වහන්සේගේ නාමයෙන් දිවුරමි උපවාසිකයාගේ කටින් පිටවන සෑම සුසුමක්ම අවසාන දිනයේදී කස්තූරි සුවඳට වඩා අල්ලාහ් හට මිහිරි වේ. උපවාසය රකින්නාට ප්‍රීතිමත් අවස්ථා දෙකක් තිබේ: එකක් ඔහු උපවාසයෙන් මිදෙන විට සතුටු වේ අනෙක ඔහු තම ස්වාමියා හමුවන විට ඔහු තම උපවාසය ගැන සතුටු වේ.ම (බුහාරි සහ මුස්ලිම්)**

1. **පෙර පව්වලට සමාව ලැබීම ::**
අල්ලාහ්ගේ විපාකය කෙරෙහි අවංක විශ්වාසයකින් හා බලාපොරොත්තුවෙන් රමදාන් මාසයේ උපවාසයේ යෙදෙන්නේ නම්, ඔවුන්ගේ පෙර පව් සියල්ල කමා කරනු ලබයි.

2. **පරලොව සතුට:**
විනිශ්චය දිනයේදී, විශේෂයෙන් අල්ලාහ් ﷻ හමුවන විට සහ උපවාසය අත්හරින විට උපවාසකරුවා මහත් ප්‍රීතියක් අත්විඳිනු ඇත..

3. **ස්වර්ගයේ විශේෂ දොරටුව:**
ස්වර්ගයේ අර්-රය්යාන් නම් දොරටුවක් ඇත. උපවාසයේ යෙදෙන අයට පමණක් ඒ තුළින් ඇතුළු වීමට අවසර ලැබෙන අතර, වෙනත් කිසිවෙකුට ඒ තුළින් ඇතුළු වීමට අවසර නොලැබේ.

4ෆ **අල්ලාහ්ගෙන් ﷻ ලැබෙන අද්විතීය විපාකය:**
උපවාසය යනු අල්ලාහ් ﷻ වෙනුවෙන්ම කරන ලද අද්විතීය වන්දනාමාන ක්‍රියාවකි. වෙනත් ක්‍රියාවන් මෙන් නොව, උන්වහන්සේම ﷻ ඒ සඳහා ඉමහත් විපාකයක් ලබා දෙනු ඇත.

## උපවාසය බිඳෙන කරුණු කුමක්ද ?

1- හිතාමතාම කෑම, බීම හෝ දුම් පානය කිරීම.

2- කෑමට හෝ බීමට සමාන වන ඕනෑම දෙයක්, එනම් (ශරීරයට අවශ්‍ය ඛනිජ ලවණ සපයන එන්නත් හෝ නාසයට දමන බිංදු වැනි දෑ (පාවිච්චි කිරීම).



3- හිතාමතාම වමනය කිරීම.

4- රුධිර පාරවිලයනය සිදු කිරීම.

5- කාන්තාවන්ට ඔසප් වීම හෝ දරු ප්‍රසූතියෙන් පසු ලේ ගැලීම.

6- අඹුසැමියන් ලිංගික සංසර්ගයේ යෙදීම.

## උපවාසයෙන් නිදහස් වන්නේ කවුද ?

1. **රෝගී පුද්ගලයන්**: උපවාසය ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය නරක අතට හරවන්නේ නම්, ඔවුන්ට එය මග හැරිය හැක. එහෙත්, රමදාන් මාසයෙන් පසුව මඟ හැරුණු දින පියවා ගත යුතුය.

2. **වයෝවෘද්ධ හෝ නිදන්ගත රෝගී අය**: ශාරීරිකව ඉතා දුර්වල අය හෝ සුවය ලැබීමේ බලාපොරොත්තුවක් නොමැති අයට උපවාසය මඟ හැරිය හැක. ඒ වෙනුවට, ඔවුන් මඟ හැරුණු සෑම දිනකටම එක් දිළිඳු පුද්ගලයෙකුට (කිලෝග්‍රෑම් 1.5ක් පමණ වූ ප්‍රධාන ආහාර ද්‍රව්‍ය) ලබා දිය යුතුය.

3. **සංචාරකයින්**: ගමනක යෙදෙන අයට (තාවකාලික වාසස්ථානයක දින හතරකට වඩා අඩුවෙන් රැඳී සිටින) ඔවුන්ගේ උපවාසය බිඳ දැමිය හැක. එහෙත්, රමදාන් මාසයෙන් පසුව මඟ හැරුණු උපවාසයන් වෙනුවෙන් පියවා ගත යුතුය.

4. **ඔසප් වීම හෝ දරු ප්‍රසූතියෙන් පසු ලේ ගැලීම ඇති කාන්තාවන්**: මෙම කාලවලදී ඔවුන්ට උපවාසයේ යෙදීමට අවසර නැත. ඔවුන් රමදාන් මාසයෙන් පසුව මඟ හැරුණු උපවාසයන් පියවා ගත යුතුය. මෙම කාලය තුළ කරන ඕනෑම උපවාසයක් වලංගු නොවන බව සැලකේ.

5. **ගර්භනී සහ කිරි දෙන කාන්තාවන්**: තමන්ට හෝ තම දරුවාට හානියක් සිදුවනු ඇතැයි බියක් ඇත්නම්, ඔවුන්ට උපවාසය කල් දැමිය හැක. ඔවුන් රමදාන් මාසයෙන් පසුව මඟ හැරුණු දින ගණන පියවා ගත යුතුය.

## සකාත් අල්- ෆිත්ර්

**සකාත් අල්- ෆිත්ර** යනු ඊද් උත්සවයට දිනක් හෝ දෙකකට පෙර සිට ඊද් යාඥාවේ වේලාව දක්වා ගෙවනු ලබන දානයකි. සකාත් අල්- ෆිත්ර ප්‍රමාණය රටේ සාමාන්‍ය ආහාර ද්‍රව්‍යවලින් එක් සා" එකක් වන අතර එය සහල්, තිරිඟු, හෝ රට ඉඳි වැනි ඕනෑම දෙයක් විය හැකිය. එක් සා" එකක් යනු දළ වශයෙන් කිලෝග්‍රෑම් 3 කට (3 kg ) සමාන වේ.

# උපවාසය අවසන් කිරීමේ උත්සවය (ඊද්-උල්-ෆිත්ර්)



ඉස්ලාම් දහමෙහි ඊද් යනු ප්‍රීතියේ හා සැමරුමේ දිනයකි. එය උපවාසයේ මාසය වන රමදාන් අවසන් වීම සනිටුහන් කරන අතර, මුස්ලිම්වරුන්ට ඔවුන්ගේ සම්පූර්ණ කරන ලද භක්තිය සහ අල්ලාහ්ගෙන් ලැබුණු ආශිර්වාද ගැන ප්‍රීති වීමට කාලයකි.ඊද් දිනයේදී, මුස්ලිම්වරු ඊද් යාඥාව පවත්වන අතර, ඔවුන්ගේ හොඳම සහ අලංකාරම ඇඳුම් අඳිති. ඊද් යනු පවුල් සහ ප්‍රජා බැඳීම් ශක්තිමත් කරන කාලයකි. මෙම අවස්ථාවේදී මුස්ලිම්වරු තම ඥාතීන්, මිතුරන් සහ අසල්වැසියන් බැහැදැකීමට යති.

# ඊදුල් ෆිතර් සලාතය

එය ඒකක (රක්අත්) දෙකකින් යුත් සමූහ සුන්නාහ් සලාතයකි, එය හිරු උදාවෙන් පසු මුස්ලිම් පල්ලියක හෝ විශාල විවෘත එළිමහන් ස්ථානයක පවත්වනු ලැබේ. මෙම සලාතය සාමාන්‍ය සලාතයන්ට වඩා තරමක් වෙනස් වේ.

පළමු රක්අතේදී, ඉමාම් ආරම්භක තක්බීර (අල්ලාහු අක්බර්) කියමින් සලාතය ආරම්භ කරයි, පසුව මෙම තක්බීර තවත් හත් වතාවක් පුනරාවර්තනය කරයි, ඒ සෑම එකක් අතර කෙටියෙන් විරාමයක් තබයි. දෙවන රක්අතය ආරම්භ වන්නේ පස් වතාවක් තක්බීර කියමිනි. සලාතයෙන් පසු, ඉමාම් කුත්බා (දේශනාව) පවත්වයි.

## අරාබි නියමයන්

| අරාබි වචනය | අර්ථය | අරාබි වචනය | අර්ථය |
|---|---|---|---|
| ලෛලතුල්-කද්ර් | බලගතු රාත්‍රිය | සුහුර් | පාන්දර ආහාර වේල |
| ඊදුල් ෆිතර් | උපවාසය අවසන් කිරීමේ උත්සවය | කුත්බා | දේශනාව |


**මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න.**

# 7 වන පරිච්ඡේදය

# වන්දනා ගමන (හජ්)


# හජ් (මක්කා වෙත යන වන්දනා ගමන)

හජ් යනු ඉස්ලාමයේ පස්වන කුළුණයි. මක්කාවේ අල්ලාහ්ගේ නිවස වෙත ගමන් කිරීමට ශාරීරිකව හා මූල්‍යමය වශයෙන් හැකියාව ඇති මුස්ලිම්වරුන්ට එය ජීවිතයේ එක් වරක් පමණක් කළ යුතු යුතුකමකි. එය ඉස්ලාමීය දින දර්ශනයේ 12 වන මාසය වන දුල්-හිජ්ජා මාසයේ සිදු කෙරේ.



අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: **මිනිසුන්ගෙන් එයට ගොස් ඒමට හැකියාව ඇත්තන් කෙරෙහි අල්ලාහ් වෙනුවෙන් එම නිවෙස හජ් කිරීම වගකීමක් වේ. කවරෙක් ප්‍රතික්ෂේප කරයිද නියතව අල්ලාහ් ලෝවැසියන් කෙරෙන් අවශ්‍යතා නොමැත්තාය.** (3:97)

**මුහම්මද් ﷺ නබිතුමා මෙසේ පැවසුහ: කවුරුන් හෝ හජ් ඉටු කර කිසිදු අසභ්‍ය ක්‍රියාවක් හෝ වරදක් නොකළහොත්, ඔහු අලුතින් උපන් දරුවෙකු මෙන් (පව් වලින් තොරව) ආපසු පැමිණෙන්නේය. (සහීහ් අල්-බුහාරි සහ මුස්ලිම්)**



## හජ් වන්දනාවේ ගුණධර්ම

1. හජ් යනු සමාව දීමේ කාලයකි..
අල්ලාහ්ගේ දූතයාණෝ ﷺ පැවසූ බව අබූ හුරෙයිරා පැවසීය: **අල්ලාහ්ගේ තෘප්තිය සඳහා හජ් ඉටු කරමින් සියලු අශිෂ්ට ක්‍රියා සහ පාපයන්ගෙන් වැළකී සිටින තැනැත්තා තම මව ඔහුව ප්‍රසූත කළ දින මෙන් සියලු පාපයන්ගෙන් නිදහස් වී ඔහු ආපසු පැමිණෙන්නේය.** (බුහාරි සහ මුස්ලිම්)

2. අපායේ (ගින්නෙන්) ගැලවීමට මාර්ගයක්.
ආයිෂා (රළියල්ලාහු අන්හු) තුමිය අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ පැවසූ බව වාර්තා කළාය: **"අරෆා දිනයට වඩා අල්ලාහ් අපායෙන් වැඩි වහලුන් පිරිසක් නිදහස් කරන වෙනත් දිනයක් නොමැත. ඔහු (අල්ලාහ්) දේවදූතයන් වෙතට ළං වී, ඔවුන් ගැන ප්‍රශංසා කරමින් මෙසේ අසයි: මොවුන්ට අවශ්‍ය කුමක්ද? "** (සහීහ් මුස්ලිම් 1348)

3. හජ් වන්දනාවේ විපාකය ස්වර්ගයයි.

අල්ලාහ් විසින් පිළිගන්නා ලද හජ් වන්දනාව ජන්නා (ස්වර්ගය) වෙත මඟ පාදයි.

අල්ලාහ්ගේ දූතයාණන් ﷺ තුමාණෝ මෙසේ පැවසූහ: **(උම්රාහ්) වන්දනාව ඉටු කිරීම යනු (එය සහ ඊට පෙර උම්රාහ් අතර) සිදු කරන ලද පව් සඳහා වන කමාවකි. තවද, හජ් මබ්රූර් (අල්ලාහ් විසින් පිළිගන්නා ලද හජ්) හි ප්‍රතිඵලය ස්වර්ගය (ජන්නාහ්) මිස අන් කිසිවක් නොවේ.** (බුහාරි 1773)



4. දුල්-හිජ්ජා මාසයේ 9 වන දිනය (අරෆා දිනය) ඉස්ලාම් ආගමේ වැදගත් දිනයන්ගෙන් එකකි. එය හජ් වන්දනාවේ ප්‍රධාන දිනයයි. එය සමාව දීමේ, දයාවේ සහ අයැදීම (දුවා) පිළිගැනීමේ දිනයයි.

## හජ් වන්දනාවේ අරමුණු

**1- එක්සත්කමේ සහ සමානාත්මතාවයේ සංකේතයක්**

වර්ගය, ජාතිය හෝ තරාතිරම නොසලකා, ලොව පුරා සිටින මුස්ලිම්වරුන් හජ් වන්දනාව මඟින් එක්සත් කරයි. සියලුම වන්දනාකරුවන් සරල සුදු ඇඳුම් (ඉහ්රාම්) අඳින්නේ, අල්ලාහ් ඉදිරියේ ඇති සමානාත්මතාවය සංකේතවත් කරමිනි.

**2- ආධ්‍යාත්මික අලුත් කිරීමේ ගමනක්**

හජ් යනු ගැඹුරු පසුතැවීම, මෙනෙහි කිරීම සහ විශ්වාසය අලුත් කර ගැනීම සඳහා වූ කාලයකි. එය සමාව අයැදීමට, අතීත වැරදි නිවැරදි කර ගැනීමට සහ පව්වලින් පිරිසිදු වී අලුත උපන් බිළිඳකු මෙන් නිවසට පැමිණීමට අවස්ථාවක් සලසයි.

**3- අනාගත වක්තෘවරුන්ගේ අඩිපාරේ යෑම**

හජ් චාරිත්‍ර වාරිත්‍ර මඟින් අනාගතවක්තෘ ඉබ්‍රාහීම් ﷺ (අබ්‍රහම්), ඔහුගේ භාර්යාව වූ හාජරා සහ ඔවුන්ගේ පුත් ඉස්මායිල් ﷺ යන අයගේ උරුමය නැවත පණ ගන්වන අතර, ඒවා අනාගතවක්තෘ මුහම්මද් (සල්) තුමා විසින් උගන්වන ලද ආකාරයටම ක්‍රියාත්මක වේ. එය මුස්ලිම්වරුන්ට ඒකදේවවාදයේ (තව්හීද්) දිගු සම්ප්‍රදාය සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවය සිහිපත් කර දෙයි.

**4- කීකරුකම සහ යටත් වීම නිරූපණය කිරීම**

හජ් වන්දනාවේ චාරිත්‍ර වාරිත්‍ර, එනම් තවාෆ් (කඃබාව වටා ප්‍රදක්ෂිණා කිරීම) , ස❑ඊ (සෆා සහ මර්වා කඳු අතර දිවීම) , සහ අරෆාහි රැඳී සිටීම, යනු අල්ලාහ්ගේ අණට සම්පූර්ණයෙන් යටත් වීම ප්‍රකාශ කිරීමකි.

**5- විනිශ්චය දිනයේ පෙර දැක්මක්**

සරල සුදු ඇඳුමින් සැරසුණු මිලියන ගණනක් ජනතාව සියල්ලෝම අල්ලාහ් ඉදිරියේ යාඥා කරමින් සහ සිටගෙන සිටීම නැවත නැගිටීමේ දිනයේ දර්ශනය පිළිබිඹු කරයි. මෙය වන්දනාකරුවන්ට වගවීම සහ මරණින් මතු ජීවිතය සිහිපත් කර දෙයි.

**6. ඉවසීම සහ විනය පුහුණු කිරීම**

හජ් වන්දනාව මගින් පුද්ගලයෙකුගේ ඉවසීම, නිහතමානී බව, විඳදරාගැනීම සහ ආත්ම දමනය පරීක්ෂා කරයි. එමෙන්ම එය සදාචාරාත්මක ගුණාංග සහ ආධ්‍යාත්මික ශක්තිය ගොඩනංවයි.

සටහන: හජ් වන්දනාව ඉටු කිරීමට අපේක්ෂා කරන තැනැත්තා, එය පිළිබඳව සවිස්තරාත්මකව ඉගෙන ගත යුතුය.

## පරිත්‍යාගයේ උත්සවය (ඊදුල් අද්හා)

**දුල්-හිජ්ජා චන්ද්‍ර මාසයේ දහවන දිනයේදී මුස්ලිම්වරු ඊදුල් අද්හා සමරති. එය වසරේ ශ්‍රේෂ්ඨතම දිනවලින් එකකි. එය අනාගතවක්තෘ ආබ්‍රහම්ගේ පරම විශ්වාසය සහ අල්ලාහ්ගේ ﷻ කැමැත්තට යටත් වීම ගෞරවයට පාත්‍ර කරයි. එය අල්ලාහ් ﷻ උදෙසා කරන පරාර්ථකාමීත්වය, භක්තිය සහ පරිත්‍යාගයේ වටිනාකම මුස්ලිම්වරුන්ට උගන්වයි. ලොව පුරා සිටින මුස්ලිම්වරු එම දිනය සමරන්නේ මෙලෙසිනි:**

1. ඊද් යාඥාව ඉටු කිරීම
2. සංකේතාත්මක ක්‍රියාවක් ලෙස සතෙකු (බැටළුවෙකු, එළුවෙකු, ගවයෙකු හෝ ඔටුවෙකු) බිලි පූජා කිරීම
3. මස් බෙදා හැරීම


⅓ පවුලේ අයට ⅓ ඥාතීන් හා අසල්වාසීන් ⅓ දුප්පතුන් සහ අසරණ වූවන් සඳහා

## ඊදුල් අල්හා සලාතය

එය මුස්ලිම් පල්ලියක හෝ විශාල විවෘත අවකාශයක හිරු උදාවෙන් පසු සිදු කරනු ලබන ඒකක දෙකක (රක්අත්) සමූහ සුන්නාහ් සලාතයකි. මෙම සලාතය නිතිපතා සලාතයන්ට වඩා තරමක් වෙනස් වේ.

පළමු රකඅතෙහි, ඉමාම් ආරම්භක තක්බීර් (අල්ලාහු අක්බර්) කියමින් සලාතය ආරම්භ කරයි, පසුව මෙම තක්බීර් තවත් හත් වතාවක් පුනරුච්චාරණය කරයි, ඒ සෑම එකක් අතරම කෙටියෙන්

විරාමයක් තබයි. දෙවන රකඅතය ආරම්භ වන්නේ පස් වතාවක් තක්බීර් කියමිනි. සලාතයෙන් පසු,ඉමාම් කුත්බා (දේශනාව) පවත්වයි.



## උම්රා

**උම්රා යනු මුස්ලිම්වරුන් විසින් වන්දනාමාන කිරීමේ සහ භක්තියේ ක්‍රියාවක් ලෙස මක්කාවේ පිහිටි කඃබා වෙත සිදු කරනු ලබන කුඩා වන්දනා ගමනකි. ජීවිතයේ එක් වරක් හැකි අය සඳහා අනිවාර්ය වන හජ් වන්දනාවට වඩා වෙනස්වන අතර, උම්රා අනිවාර්ය නොවන නමුත් ඉතා ප්‍රශංසනීය ආරධනාවකි. හජ්ට වඩා අඩු ආචාර විධි ඇතුළත් වන අතර, සාමාන්‍යයෙන් පැය කිහිපයක් තුළ ඉටු කළ හැක.**

### උම්රා ඉටු කළ හැකි කාලය

**උම්රා වසරේ ඕනෑම කාලයක ඉටු කළ හැක. නමුත් හජ් කාලය වන දුල්-හිජ්ජා මාසයේ 8 සිට 13 දක්වා දිනවලදී, හජ් යාත්‍රිකයින්ට ප්‍රමුඛතාවය ලබා දෙන බැවින් උම්රා ඉටු කිරීමට අවසර නොලැබේ.**

## උම්රා හි ප්‍රධාන චාරිත්‍ර:

**ඉහ්රාම්**

- **මීකාත් නම් නියමිත ස්ථානයකදී අධ්‍යාත්මික පවිත්‍රතාවයේ තත්ත්වයට පත්වීම..**
- **විශේෂ ඇඳුම් කට්ටලය: පුරුෂයන් සඳහා: මැහුම් රහිත සුදු රෙදි කඩවල් දෙකක්. කාන්තාවන් සඳහා: ශරීරය මැනවින් වැසෙන පරිදි සංවරශීලී ඇඳුමක්.**

තවාෆ්

- **කඃබාව වටා වාමාවර්තව (ඔරලෝසු කටු කැරකෙන දිශාවට ප්‍රතිවිරුද්ධ දිශාවට) හත් වතාවක් ගමන් කිරීම..**

**මීකාත්** යනු මක්කාව වටා නම් කරන ලද සීමාවකි. හජ් හෝ උම්රා වන්දනාකරුවන් එම සීමාව පසු කිරීමට පෙර ❑ඉහ්රාම්❑ නමැති ශුද්ධ වූ තත්ත්වයට පත්විය යුතුය. මෙහිදී ඔබ මානසිකව සූදානම් වී, ඔබේ වන්දනා ගමන සඳහා පැහැදිලි චේතනාවක් ඇති කරගත යුතුය. ඉහ්රාම් තත්ත්වයට පත් නොවී මෙම සීමාවන් පසු කිරීම යනු ඔබ ඔබේ වන්දනා ගමන නිවැරදිව ආරම්භ කර නොමැති බවයි.

## සඊ

- සෆා සහ මර්වා කඳු අතර වාර 7ක් ගමන් කිරීම.

## හල්ක් (මුඩු කිරීම) හෝ තක්සීර් (කෙටි කිරීම)

පුරුෂයන් සඳහා: හිසකෙස් සම්පූර්ණයෙන්ම මුඩු කිරීම හෝ කෙටි කිරීම. කාන්තාවන් සඳහා: හිසකෙස්වලින් ඉතා සුළු කොටසක් (අඟලක් පමණ) කපා කෙටි කිරීම.

## උම්රාගේ ගුණාත්මකභාවය

නබී ﷺ තුමා මෙසේ පැවසීය:

**එක් උම්රා වන්දනාවක සිට ඊළඟ උම්රා වන්දනාව දක්වා කාලය තුළ සිදු වූ පාපයන්ට සමාව ලැබේ. එමෙන්ම පිළිගත් හජ් වන්දනාවකට (හජ් මබ්රූර්) ස්වර්ගය හැර වෙනත් කිසිදු ප්‍රතිඵලයක් හිමි නොවේ. (බුහාරි සහ මුස්ලිම්)**

### අරාබි නියමයන්

| අරාබි වචනය | අර්ථය | අරාබි වචනය | අර්ථය |
|---|---|---|---|
| ජන්නහ් | ස්වර්ගය | දුආ | ප්‍රාර්ථනා |
| තවාෆ් | කඃබාව වටා ගමන් කිරීම | ඊදුල්-අද්හා | කැපකිරීමේ උත්සවයම |
| උම්රා | හජ් කාලය නොවන වෙනත් කාලයකදී කඃබාව වන්දනා කිරීම. | සඊ | සෆා සහ මර්වා කඳු අතර වාර 7ක් ගමන් කිරීම. |
| හල්ක් | මුඩු කිරීම | තක්සීර් | කෙටි කිරීම |

මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න.

# 8 වන පරිච්ඡේදය

## මුහම්මද් ﷺ තුමාණන්:

### අවසාන දූතයාණන් ﷺ තුමාණන්ගේ කෙටි චරිතාපදානය

## නබි තුමාණන්ගේ උපත සහ මුල් අවධිය

මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ක්‍රිස්තු වර්ෂ 571 දී පමණ මක්කාවේදී උපත ලැබූහ. එතුමාණන් උපත ලැබීමට පෙර පියා අභාවප්‍රාප්ත වූ අතර, ඉතා කුඩා අවධියේදීම මවද අභාවප්‍රාප්ත වූවාය. එතුමාණන් මුලින්ම තම සීයා වූ අබ්දුල් මුත්තලිබ් විසින්ද, පසුව බාප්පා වූ අබූ තාලිබ් විසින්ද ඇති දැඩි කරන ලදී.
මුහම්මද් ﷺ තුමාණන් කුරෙයිෂ් ගෝත්‍රයේ උදාර පවුලකට අයත් වූවෙකි. එතුමාණන් තම මුල් ජීවිතයේදී එඬේරෙකු ලෙස සේවය කළ අතර, වයස අවුරුදු 25 දී ඉතා ගෞරවාන්විත ව්‍යාපාරික කාන්තාවක වූ ඛදීජා (රළියල්ලාහු අන්හා) තුමිය වෙනුවෙන් වෙළෙන්දෙකු ලෙස සිරියාව බලා ගියහ. මුහම්මද් තුමාණන් තමන් අතරේ සත්‍යවාදී (අල්-අමීන්) සහ විශ්වාසවන්ත (අස්-සාදික්) තැනැත්තෙකු ලෙස ප්‍රසිද්ධව සිටියහ.

## කදීජා සමග නබිතුමාගේ විවාහය

මුහම්මද් නබිතුමාගේ විශිෂ්ට චරිතය සහ උදාර ගතිගුණ කෙරෙහි ආකර්ෂණය වූ කදීජා තුමිය, එතුමාට විවාහ යෝජනාවක් ඉදිරිපත් කළාය. ඉබ්‍රාහිම් හැර නබිතුමාගේ අනෙකුත් සියලුම දරුවන්ගේ මව වූයේ කදීජා තුමියයි. එම දරුවන් වන්නේ: අල් කාසිම් සයිනාබ් රුකයියා උම්මි කුල්තුම් ෆාතිමා අබ්දුල්ලාහ් එතුමාගේ සියලුම පිරිමි දරුවන් කුඩා අවධියේදීම අභාවප්‍රාප්ත විය.

## ඉස්ලාමයට පෙර මක්කම සමාජයේ තත්ත්වය

මක්කානු සමාජය පුරා පැතිරුණු බහුදේවවාදයකින් සනිටුහන් වූ අතර, ජනයා කඃබා දෙවොල වටා තැන්පත් කර තිබූ අතිවිශාල පිළිම සංඛ්‍යාවකට වන්දනාමාන කළහ. සමාජීය සහ දේශපාලනික ජීවිතය තුළ ගෝත්‍රිකවාදය ප්‍රධාන භූමිකාවක් ඉටු කළ අතර, එහිදී යුක්තියට සහ සදාචාරයට වඩා තමන්ගේ ගෝත්‍රය කෙරෙහි දක්වන පක්ෂපාතීත්වය ඉහළින්ම සැලකූහ. මෙම ගෝත්‍රික ක්‍රමය හේතුවෙන් නිරන්තර එදිරිවාදිකම් සහ දරුණු ලේ වැගිරෙන ගැටුම් ඇති විය. අසාධාරණය සාමාන්‍ය දෙයක් වූ අතර, කාන්තාවන් සහ දුප්පතුන් නිතරම මර්දනයට ලක් විය. බලවතුන් විසින් දුර්වලයන්ව සූරාකන ලදී. සදාචාරාත්මක වටිනාකම් පිරිහී තිබූ අතර, මක්කානු සමාජය ආත්මීය මෙන්ම සමාජීය ප්‍රතිසංස්කරණයක දැඩි අවශ්‍යතාවයකින් පසුවිය.

## මෙහෙවරට පෙර අනාගතවක්තෘවරයාගේ ජීවිතය

ඉස්ලාම් දහමේ ව්‍යාප්තියට පෙර, මුහම්මද් නබිතුමා හනීෆ්වරයෙකු ලෙස හඳුන්වනු ලැබූ ඉබ්‍රාහිම් නබිතුමාගේ පිරිසිදු ඒකදේවවාදී දහම අනුගමනය කළේය. එතුමා අල්ලාහ් දෙවියන්ට කිසිදු හවුල්කරුවෙකු සම්බන්ධ නොකර (අද්වෛතව) වන්දනාමාන කළ අතර, සියලු ආකාරයේ පිළිම වන්දනාවන් සහ මිථ්‍යා දෘෂ්ටික චාරිත්‍ර වාරිත්‍ර ප්‍රතික්ෂේප කළේය.



## එතුමාගේ දූත මෙහෙවර

එතුමාට වයස අවුරුදු හතළිහක් වන විට, මුහම්මද් නබිතුමා නූර් කන්දේ (ජබල් අල්-නූර්) පිහිටි හිරා ගුහාවෙහි හුදෙකලාව කාලය ගත කිරීමට පුරුදුව සිටියේය. එතුමා සිය කාලයෙන් වැඩි කොටසක් වෙන් කළේ සැබෑ වූ ඒකීය දෙවියන් වන්දනා කිරීමටත්, අල්ලාහ් දෙවියන්ගේ ශ්‍රේෂ්ඨත්වය සහ තමා අවට ඇති විශ්වය පිළිබඳව ගැඹුරින් මෙනෙහි කිරීමටත්ය. රමළාන් මාසය තුළදී, නබිතුමාට නබිත්වය (දේව දූත මෙහෙවර) පිළිබඳ ගෞරවය හිමි විය. ජිබ්රීල් දේව දූතයා එතුමා ඉදිරියේ පෙනී සිට දෙවියන්ගේ වදන් මෙසේ පවසා සිටියේය: **ඕ:නබි සියල්ල මැවූ ඔබගේ ස්වාමියාගේ නාමය මගින් ඔබ කියවන්න ඔහු මිනිසාව (ගර්භාෂ සිවියෙහි) ඇලී සිටිය හැකි දෙයකින් මැව්වේය. ඔබ කියවන්න ඔබගේ ස්වාමියා වඩාත් කීර්තිමත්කෙනාය. ඔහුම පෑන මගින් ඉගැන්වූයේය. ඔහු මිනිසා නොදන්නා දේ ඔහුට ඉගැන්වූයේය.** (96:1–5)

මෙම දේව පණිවිඩ ලැබීම එතුමාගේ අභාවය දක්වාම අඛණ්ඩව සිදු විය. මුහම්මද් නබිතුමා කෙරෙහි ප්‍රථමයෙන්ම විශ්වාසය තබා එතුමාට සහයෝගය දැක්වූයේ එතුමාගේ බිරිඳ (ඛදීජා තුමිය) සහ එතුමාගේ සමීපතම මිතුරන්ය.

## ඉස්ලාම් දහම ප්‍රසිද්ධියේ දේශනා කිරීම

**වසර තුනක් රහසිගතව දහම දේශනා කිරීමෙන් පසුව, අල්ලාහ්ගේ දූතයාණන් වහන්සේ වසර දහයක් පුරා ප්‍රසිද්ධියේ ඉස්ලාම් දහම දේශනා කළහ. මක්කාවේ සිටි බොහෝ පිරිසක් එතුමාව**

**නොසලකා හැරීමට හෝ එතුමාට සමච්චල් කිරීමට පෙළඹුණහ. කෙසේ වෙතත්, එතුමා පිළිම වන්දනාව සහ බහුදේවවාදය හෙළා දුටු විට, මක්කාවේ බොහෝ ගෝත්‍රික නායකයින් මුහම්මද් නබි තුමා සහ එතුමාගේ පණිවිඩය තමන්ට තර්ජනයක් ලෙස දැකීමට පටන් ගත්හ.**

**එසේ වුවද, දේව දූතයාණන් වහන්සේ හජ් වන්දනා සමයේදී විවිධ ගෝත්‍රවලින් පැමිණි වන්දනාකරුවන් හමුවී ඔවුන්ට නව දහම වැළඳගන්නා ලෙස ඇරයුම් කළහ. එහිදී මදීනාවෙන් පැමිණි වන්දනාකරුවෝ ඉස්ලාමය පිළිගත්හ. අවසානයේදී නබිතුමාගේ අනුගාමිකයන්ට මක්කාවේ සිට සැතපුම් 260ක් උතුරින් පිහිටි මදීනා නගරයට සංක්‍රමණය වීමට බල කෙරුණු අතර, ඉන් කෙටි කලකට පසු බොහෝ මුස්ලිම්වරු මදීනාව බලා සංක්‍රමණය වීමට පටන් ගත්හ.**

## එතුමාගේ සංක්‍රමණය

වයස අවුරුදු 53 දී, එනම් ක්‍රිස්තු වර්ෂ 622 දී, අල්ලාහ්ගේ දූතයාණන් වහන්සේ මදීනාවට සංක්‍රමණය වූහ. මෙම සංක්‍රමණය ඉස්ලාමීය දින දර්ශනයේ ආරම්භය සනිටුහන් කරයි. මදීනාවේදී නබිතුමා වසර දහයක් ගත කළ අතර, එහිදී ජනයාට ඉස්ලාම් දහමට ආරාධනා කිරීම සහ සලාතය , සකාත් සහ අනෙකුත් ඉස්ලාමීය වත්පිළිවෙත් ඉටු කරන ලෙස නියෝග කළහ. එතුමා මුස්ලිම් ප්‍රජාව ගොඩනැගීම ආරම්භ කළ අතර ක්‍රමයෙන් පිළිගැනීම සහ වැඩි අනුගාමිකයින් පිරිසක් දිනා ගත්තේය. මුහම්මද් නබි ﷺ තුමා ඉස්ලාමීය ශිෂ්ටාචාරයේ පදනම දැමුවේ මෙලෙසිනි.



## එතුමාණන් මදීනා ජීවිතයේදී මුහුණ දුන් අභියෝගයන්

මක්කාවේ කුරෙෂ් ගෝත්‍රයෙන් සහ අනෙකුත් යුදෙව් ගෝත්‍රවලින් එල්ල වූ වර්ධනය වෙමින් පැවති තර්ජන සහ ආක්‍රමණ හේතුවෙන්, මුස්ලිම්වරුන්ට තම මර්දකයින්ට එරෙහිව සටන් කිරීම සඳහා අල්ලාහ් දෙවියන් විසින් අවසර ලබා දෙන ලදී. ඉස්ලාමයේ පණිවිඩය විනාශ කිරීම සඳහා විවිධ ගෝත්‍ර උත්සාහ කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ ගැටුම් සහ යුද්ධ ඇති විය. කෙසේ වෙතත්, අල්ලාහ් දෙවියන් සිය දූතයාණන් වහන්සේ සමඟ පෙනී සිටි අතර, අවසානයේදී සියලු විරුද්ධවාදිකම් මැඩපවත්වා ඉස්ලාම් දහම ජයග්‍රහණය කරවීමටත් එය ඉහළට ඔසවා තැබීමටත් කටයුතු කළේය.

# එතුමාගේ අභාවය

මක්කාව සමඟ පැවති ගැටුම් අවසානයේ සමථයකට පත්වීමෙන් පසුව, මුහම්මද් නබිතුමා සිය ප්‍රථම වන්දනා ගමන (හජ් වන්දනාව) සිදු කළේය. එතුමා සිය අවසන් දේශනය අරෆාත් කන්දේදී පවත්වන ලදී. මදීනාවට ආපසු පැමිණි පසු, එතුමා දින කිහිපයක් රෝගාතුරව සිටියේය. ක්‍රිස්තු වර්ෂ 632 ජුනි මාසයේදී, වයස අවුරුදු 63 දී එතුමා අභාවප්‍රාප්ත වූ අතර මදීනාවේ පිහිටි අල් නබවි මස්ජිදයේ එතුමාව භූමදානය කරන ලදී.




# 5 වන පරිච්ඡේදය

# විශ්වාසයේ ක්‍රියාවන්

# ඉස්ලාම් සහ දෛනික හැසිරීම

සදාචාරාත්මක චරිතය
ඉස්ලාමීය ඇඳුම් පැළඳුම් කේතය
ඉස්ලාමීය පවුල් සංකල්පය
විවාහය
ආහාර පාන
මූල්‍ය ගනුදෙනු


الله

# සදාචාරාත්මක චරිතය

## ඉස්ලාමයේ යහපත් සදාචාරයේ වැදගත්කම

**යහපත් සදාචාරය යනු ඉස්ලාමයේ වෙන් කළ නොහැකි කොටසක් ලෙස සැලකේ. ඒවා හුදෙක් කැමැත්ත මත තෝරාගත හැකි දේවල් නොවන අතර, ආගමේ හදවත බඳුය. පුද්ගලයෙකුගේ ඊමානය සහ අල්ලාහ් ﷻ කෙරෙහි ඇති සමීපත්වය පිළිබිඹු වන්නේ ඔහුගේ යහපත් චරිතයෙනි.**

**ඉස්ලාමය හුදෙක් ආගමික වතාවත්වලදී පමණක් නොව එදිනෙදා ජීවිතයේ සෑම ගනුදෙනුවකදීම යහපත් චරිතය සහ සදාචාරාත්මක හැසිරීම් වල වැදගත්කම අවධාරණය කරයි. කරුණාව අවංකකම අනුකම්පාව සහ ගෞරවය වැනි ලක්ෂණ මුස්ලිම්වරයෙකුගේ ජීවිතයේ අත්‍යවශ්‍ය අංග බව ඉස්ලාමීය ඉගැන්වීම් පෙන්වා දෙයි.**

**යහපත් චරිතයක වැදගත්කම පෙන්වීමට කුර්ආන් වාක්‍ය සහ නබි වදන් රාශියක් ඇත. ඒ අතරින් මුහම්මද් නබි ﷺ තුමාණන්ගේ මෙම ප්‍රකාශය ප්‍රධාන වේ:**

**මා එවනු ලැබුවේ උතුම් සදාචාරාත්මක ගුණධර්ම සම්පූර්ණ කිරීමටයි. (සුනන් අල්-බයිහකී 21301 )**

**තවත් දේශනාවල සඳහන් වන්නේ, ඇදහිලිවන්තයන් අතරින් ශ්‍රේෂ්ඨතම පුද්ගලයා වන්නේ හොඳම සදාචාරය ඇත්තා බවත්, විනිශ්චය දිනයේදී ක්‍රියාවන් මනිනු ලබන තරාදියේ යහපත් චරිතය ඉතා බරින් වැඩි වන බවත්ය.**

**යහපත් චරිතය පවත්වා ගන්නා අයට විශාල පලවිපාක පොරොන්දු වී ඇත. නබි ﷺ තුමාණන් මෙසේ පැවසූහ:**
**විනිශ්චය දිනයේදී ක්‍රියා මනින තරාදිය මත තබන කිසිදු ක්‍රියාවක්, යහපත් චරිතයට වඩා බර නොවනු ඇත. සැබවින්ම, යහපත් චරිතය ඇති පුද්ගලයා අතිරේක උපවාස (නෝම්බි) සහ යාඥා (සලාතය) වල නිරත වූවෙකුගේ මට්ටමටම සමීප වනු ඇත. (සුනන් අත්-තිර්මිදි 2003)**

**ඉස්ලාමයේ උතුම් චරිතය (සදාචාරය) යනු හුදෙක් මිනිසුන් අතර පමණක් නොව, මිනිසුන්, සතුන් සහ පරිසරය අතර ද සාමය සහ සමගිය ඇති කිරීම සඳහා නිර්මාණය කර ඇති දිව්‍යමය පද්ධතියකි.**

### ඉස්ලාමීය සාරධර්ම: මිනිසුන් කෙරෙහි දක්වන ආචාර ධර්ම

මිනිසුන් සමඟ ගනුදෙනු කිරීමේදී උතුම් ගුණාංගවලින් යුක්තව කටයුතු කිරීම පිළිබඳව ඉස්ලාමය විශාල අවධාරනයක් ලබා දෙයි. කරුණාවන්ත ලෙස කතා කිරීමටත්, සාධාරණ වීමටත්, කේලාම් කීමෙන්, වෛරයෙන් සහ ඊර්ෂ්‍යාවෙන් වැළකී සිටීමටත්, අන් අයට අභිමානයෙන් හා දයාවෙන් සැලකීමටත් මුස්ලිම්වරුන්ට උපදෙස් දෙනු ලැබේ.

අබූ හුරෙයිරා තුමා විසින් වාර්තා කරන ලද පරිදි, අල්ලාහ්ගේ දූතයාණන් (සල්) මෙසේ පැවසූහ:

**සැබෑ මුස්ලිම්වරයෙකු යනු ඔහුගේ දිවෙන් සහ අතින් (ක්‍රියාවන්ගෙන්) මිනිසුන් ආරක්ෂා වී සිටින පුද්ගලයාය. සැබෑ විශ්වාසවන්තයෙකු (මු:මින්වරයෙකු) යනු මිනිසුන්ගේ ජීවිත සහ දේපළ ඔහුගෙන් සුරක්ෂිතව පවතින පුද්ගලයාය.** (සුනන් අන්-නසායි 4995)

මෙම මූලධර්ම සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවන්ගේ සහ ගෞරවනීය සමාජයන්ගේ පදනම වේ.



## සතුන් කෙරෙහි දක්වන දයාව

ඉස්ලාමීය ආචාර ධර්ම පද්ධතියට සතුන් කෙරෙහි දක්වන සැලකිල්ල ද ඇතුළත් වේ. නබි ﷺ තුමාණන් සතුන්ට වධහිංසා පමුණුවීමට එරෙහිව අනතුරු ඇඟවූ අතර, ඔවුන් කෙරෙහි දයාව දැක්වීමේ වැදගත්කම අවධාරණය කළහ.ආහාර හෝ ජලය ලබා නොදී බළලෙකු සිරකර තැබූ කාන්තාවකට දඬුවම් ලැබුණු පුවතක් සහ දැඩි පිපාසයෙන් සිටි බල්ලෙකුට ජලය ලබා දුන් මිනිසෙකුට අල්ලාහ් දෙවියන් සමාව දුන් පුවතක් එතුමා විසින් දේශනා කර ඇත.මෙම උදාහරණ මගින් අවධාරණය කෙරෙන්නේ සතුන් යනු හුදෙක් දේපළක් පමණක් නොව, අයිතිවාසිකම් සහ හැඟීම් සහිත ජීවීන් බවයි. සුරතල් සතුන්, ගොවිපළ සතුන් හෝ වන සතුන් වේවා, ඔවුන්ට ආහාර ලබා දීමටත්, රැකබලා ගැනීමටත් සහ මෘදු ලෙස සැලකීමටත් මුස්ලිම්වරුන්ව උනන්දු කරනු ලැබේ.

## පරිසරය කෙරෙහි පවතින වගකීම

පරිසරය යනු අල්ලාහ් දෙවියන් විසින් පවරන ලද පූජනීය භාරකාරත්වයක් (අමානාහ්) බව



ඉස්ලාමය උගන්වයි. මිනිසුන් යනු පෘථිවියේ අයිතිකරුවන් නොව, එහි රැකවරණය උදෙසා පත් කරන ලද නියෝජිතයන් (කලීෆාවරුන්) වේ. භූමිය මත දූෂණය සහ විනාශය පැතිරවීමට එරෙහිව ශුද්ධ වූ අල්-කුර්ආනය අනතුරු අඟවයි. ගස් සිටුවීම, ආගමික වතාවත් සඳහා පිරිසිදු වීමේදී (වුළු කිරීමේදී) පවා ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම සහ පිරිසිදුකම පවත්වා ගැනීම පිළිබඳව නබි තුමාණන් උනන්දු කළහ. ඉස්ලාමයේ පරිසර ආරක්ෂණය යනු නූතන සංකල්පයක් නොව, එය එම දහමේ සදාචාරාත්මක ඉගැන්වීම් තුළ ගැඹුරින් මුල් බැස ඇති කරුණකි.

### නබි තුමාණන්ගේ චරිතය සහ සදාචාරාත්මක විශිෂ්ටත්වය පිළිබඳ කෙටි දැක්මක්

**මුහම්මද් නබි ﷺ තුමාණන් මුළු මහත් මැවිල්ලටම කරුණාවක් ලෙසත්, උතුම් ගුණාංගවලින් පිරිපුන් ආදර්ශමත් චරිතයක් ලෙසත් එවනු ලැබූහ. අල්ලාහ් ﷻ දෙවියන් ශුද්ධ වූ අල්-කුර්ආනයෙහි එතුමාණන් ගැන මෙසේ විස්තර කර ඇත:**

**නියතව ඔබ මහඟු යහගුණය මත සිටිහිය. (68:4)**

තම වචනයෙන් හා ක්‍රියාවෙන් නබි ﷺ තුමාණන් අවධාරණය කළේ, ආචාර ධර්ම සහ යහපත් හැසිරීම් (අක්ලාක්) යනු දහමේ අත්‍යවශ්‍ය අංගයක් බවයි. යහපත් ගුණාංග මගින් සැබෑ විශ්වාසය පිළිඹිබු වන බවත්, එය පුද්ගලයන් සහ ප්‍රජාවන් අතර පවතින සබඳතා ශක්තිමත් කරන බවත් එතුමා ඉගැන්වූහ.

**මුහම්මද් නබි තුමාණන් විසින් මුස්ලිම්වරුන්ට අනුගමනය කරන ලෙස අවධාරණය කළ ප්‍රධාන සදාචාරාත්මක ගුණාංග කිහිපයක් පහත දැක්වේ:**

**1. සත්‍යගරුක බව (සිද්ක්)**

නබි තුමාණන් තමන්ට දේව පණිවිඩ ලැබීමට පෙර පවා සැමවිටම සත්‍යය කතා කළ අතර, එබැවින් එතුමා අල්-අමීන් (විශ්වාසවන්තයා) ලෙස ප්‍රසිද්ධව සිටියේය. එතුමා මෙසේ පැවසූහ: **සත්‍යගරුක බව ධාර්මිකත්වයට මග පෙන්වයි, ධාර්මිකත්වය ස්වර්ගයට මග පෙන්වයි. (බුහාරි සහ මුස්ලිම්).** විහිළුවට පවා බොරු කීමෙන් වළකින ලෙස එතුමා අනතුරු ඇඟවූ අතර, අවංකකම මගින් සමාජය තුළ විශ්වාසය සහ අඛණ්ඩතාව ගොඩනැගෙන බව ඉගැන්වූහ.

**2.** **ඉවසීම (සබර්)**

ඉවසීම යනු ඉස්ලාමයේ ඉහළින්ම අගය කරන ගුණාංගයකි. මක්කාවේදී එල්ල වූ පීඩාවල සිට පෞද්ගලික අභිමිපීම් දක්වා විශාල දුක්කම්කටොලු හමුවේ නබි තුමාණන් මහත් ඉවසීමෙන් කටයුතු කළහ. එතුමා මෙසේ පැවසූහ: **යමෙක් ඉවසීමෙන් සිටීමට උත්සාහ කරන්නේද, අල්ලාහ් ඔහුට ඉවසීම ලබා දෙයි. ඉවසීමට වඩා උතුම් හා පුළුල් ත්‍යාගයක් කිසිවෙකුට ලබා දී නොමැත. (බුහාරි).**
දේව වන්දනාවේදී, දුෂ්කරතාවලදී සහ අන් අය සමග ගනුදෙනු කිරීමේදී ඉවසීමෙන් කටයුතු කිරීමට එතුමා උනන්දු කළහ.

**3.** **කාරුණිකත්වය සහ දයාව (රහ්මා)**

නබි ﷺ තුමාණන් දරුවන්, සතුන්, දිළිඳුන් සහ තම සතුරන් කෙරෙහි පවා අතිශයින් දයානුකම්පිත වූහ. එතුමා මෙසේ පැවසූහ: **මිනිසුන්ට දයාව නොදක්වන්නාට අල්ලාහ් දයාව දක්වන්නේ නැත**. (මුස්ලිම්). කථාවේදී සහ හැසිරීමේදී මෘදු වන ලෙසත්, කිසිවිටකත් රළු හෝ කුරිරු නොවන ලෙසත් එතුමා මුස්ලිම්වරුන්ට උපදෙස් දුන්හ.

**4.** **යටහත් පහත් බව (තවාදු)**

මුළු දේශයකම නායකයා වුවද, නබි ﷺ තුමාණන් ඉතා සරල ජීවිතයක් ගත කළ අතර කිසිවිටකත් තමා අන් අයට වඩා උසස් යැයි සිතුවේ නැත. එතුමා මෙසේ පැවසූහ:
**යමෙක් අල්ලාහ් වෙනුවෙන් නිහතමානී වන්නේද, අල්ලාහ් ඔහුගේ තත්ත්වය උසස් කරන්නේය.** (මුස්ලිම්). එතුමා අන් අයට සේවය කළේය, තමාගේ ඇඳුම් තමාම මසා ගත්තේය, සහ කිසිදු වෙනසකින් තොරව දිළිඳුන් අතර වාඩි වී කාලය ගත කළේය.



### 5-සමාව දීම (අෆුව්)

නබි මුහම්මද් (සල්) තුමාණන් තමන්ට පෞද්ගලිකව වැරදි කළ බොහෝ දෙනෙකුට සමාව දුන්හ. තමන්ට ගල් පහර දුන් තායිෆ් නගරයේ වැසියන්ට උන්වහන්සේ සමාව දුන් අතර, ජයග්‍රාහී ලෙස නැවත මක්කාවට පැමිණි විට එහි වැසියන්ටද පොදු සමාව ලබා දුන්හ. උන්වහන්සේ මෙසේ පැවසූහ: **දයාවන්ත වන්න, සමාව දෙන්න. අල්ලාහ් ඔබට සමාව දෙනවාට ඔබ කැමති නැද්ද? (තිර්මිදි)** සමාව දීම සමාජය තුළ සාමය සහ සුවපත් වීම ඇති කිරීමට මග පාදයි.

### 6. යුක්තිය ( අදල් )

නබි මුහම්මද් ﷺ තුමාණන් තම සමීපතම සගයන් හෝ පවුලේ සාමාජිකයන් සම්බන්ධ වූ අවස්ථාවලදී පවා යුක්තිය ඉහළින්ම අගය කළහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: **ඔබේ සහෝදරයාට උදව් කරන්න, ඔහු පීඩකයෙකු හෝ පීඩිතයෙකු වුවද. පීඩකයාට උදව් කරන්නේ කෙසේදැයි විමසූ විට, ඔහු පිළිතුරු දුන්නේ, ඔහුගේ පීඩණයෙන් ඔහුව වැළැක්වීමෙන් (බුහාරි)** ඔහු කිසි විටෙකත් පෞද්ගලික හැඟීම් සාධාරණ විනිශ්චයට බලපෑම් කිරීමට ඉඩ දුන්නේ නැත.

### 7. විනීතභාවය / ලැජ්ජාශීලීකම (හයා)

ඉස්ලාමයේ විනීතභාවය යන්න කථාවට, ඇඳුමට සහ හැසිරීමට අදාළ වේ. නබි මුහම්මද් ﷺ තුමාණන් මෙසේ පැවසූහ: **සෑම ආගමකටම ආවේණික ලක්ෂණයක් ඇත, ඉස්ලාමයේ සුවිශේෂී ලක්ෂණය වන්නේ විනීතභාවයයි. (ඉබ්නු මාජා)** විනීතභාවය යනු පුද්ගලයෙකු ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව හැසිරෙන ආකාරය තීරණය කරන ඊමාන්හි එක් ශාඛාවක් බව උන්වහන්සේ ඉගැන්වූහ.

### 8. ත්‍යාගශීලීභාවය (කරම්)

නබි මුහම්මද් ﷺ තුමාණන් මිනිසුන් අතර අතිශයින්ම ත්‍යාගශීලී පුද්ගලයෙකු වූහ උන්වහන්සේ දන් දීම, අන් අයට ආහාර ලබා දීම සහ කිසිවෙකු හිස් අතින් හරවා නොයැවීම සිදු කළහ. උන්වහන්සේ මෙසේ ඉගැන්වූහ: **යටි අතට වඩා උඩු අත උතුම් වේ. උඩු අත යනු දෙන්නාගේ අතයි, යටි අත යනු ලබන්නාගේ අතයි**. (බුහාරි)

## ඉස්ලාමයේ මහා පාපයන් තහනම් කිරීම

ඉස්ලාමය යහපත් ගතිගුණ සහ ගුණවත් ක්‍රියා දිරිමත් කරන්නා සේම, දුරාචාර සහ අයහපත් ක්‍රියාවන් සමාන ලෙසම තහනම් කරයි. අල්ලාහ් ﷻ අප්‍රසාදයට පත්වන සියලු දේවලින් වැළකී සිටින ලෙස අල්-කුර්ආනය සහ සුන්නාහ්ව (නබි මුහම්මද් ﷺ තුමාණන්ගේ ඉගැන්වීම් සහ ක්‍රියාකාරකම්) මගින් මුස්ලිම්වරුන්ට අණ කර ඇත.

### මහා පාපයන්

නබි මුහම්මද් (සල්) තුමාණන් මෙසේ පැවසූහ: **විනාශකාරී මහා පාපයන් හතෙන් වැළකී සිටින්න. එවිට ජනයා, අල්ලාහ්ගේ දූතයාණෙනි, ඒ මොනවාද? යි විමසූහ. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: අල්ලාහ්ට සහකරුවන් තැබීම අල්ලාහ් හැර වෙනත් දේවලට වැඳුම් පිදුම් කිරීම. සාධාරණ හේතුවක් නොමැතිව, අල්ලාහ් විසින් තහනම් කර ඇති මිනිස් ජීවිතයක් ඝාතනය කිරීම. හූනියම්/ගුරුකම් කිරීම පොලී ගනුදෙනු කිරීම හෝ ඒවා පරිභෝජනය කිරීම. අනාථ දරුවන්ගේ දේපළ අයුතු ලෙස පරිභෝජනය කිරීම. යුද පිටියෙන් පලා යාම: සටනක් ආරම්භ වූ විට සතුරාට පිටුපා පලා යාම.**

**පතිවෘත්තාව රකින ස්ත්‍රීන්ට අපහාස කිරීම කිසිදු වැරදි ක්‍රියාවක් ගැන නොසිතන, යහපත් විශ්වාසවන්ත කාන්තාවන්ට කාමුක චෝදනා එල්ල කිරීම. (මූලාශ්‍රය: බුහාරි)**

ඉස්ලාමය භක්තිය මෙන්ම සමාජ වගකීම යන දෙකම අවධාරණය කරයි. මෙම පාපයන් පුද්ගලයෙකු අල්ලාහ් සමඟ පවත්වන සබඳතාවයට මෙන්ම සමස්ත සමාජයටම අහිතකර ලෙස බලපායි.

**1- ෂිර්ක් (බහුදේවවාදය: අල්ලාහ්ට සහකරුවන් තැබීම)**

මෙය ඉස්ලාමයේ ඇති බරපතලම පාපයයි. මෙයින් අදහස් කරන්නේ අල්ලාහ් හැර වෙනත් අයෙකුට වැඳුම් පිදුම් කිරීම හෝ අල්ලාහ් ﷻ සමඟ තවත් අයෙකු විශ්වාස කිරීමයි. මෙය ඉස්ලාමයේ මූලික පදනම වන තව්හීද් (ඒකදේවවාදය) විනාශ කර දමයි.

**2- අසාධාරණ ලෙස මරා දැමීම:**

නිර්දෝෂී ජීවිතයක් බිලිගැනීම බරපතල අපරාධයකි. ඉස්ලාමය මිනිස් ජීවිතය ශුද්ධ වූවක් ලෙස සලකන අතර, ජීවිතයක් ලබා ගැනීම යුක්ති සහගත වන්නේ ඉතා සුවිශේෂී නෛතික අවස්ථාවලදී (උදාහරණයක් ලෙස මරණ දඬුවම වැනි) පමණි. අල්ලාහ් ﷻ අල්-කුර්ආනයේ මෙසේ සඳහන් කරයි. **නියතව කවරෙක් ඝාතනයක් වෙනුවෙන් හෝ පොළොවෙහි කලහ ඇති කළ හේතුව නිසා හෝ හැර තවත් ආත්මාවක් ඝාතනය කරයිද ඔහු මිනිසුන් සියලු දෙනාවම ඝාතනය කළ කෙනා සේ වන්නේය** (5:32)

**3- සියදිවි නසාගැනීම**

සියදිවි නසාගැනීම යනු චේතනාන්විතව තමාගේම ජීවිතය නැති කර ගැනීමේ ක්‍රියාවයි. ජීවිතය යනු දෙවියන් වහන්සේගෙන් ලැබුණු පූජනීය තෑග්ගක් බැවින් ඉස්ලාමය තුළ සියදිවි නසාගැනීම තහනම් කර ඇත. අල්ලාහ් දෙවිඳාණන් අපව මවා අපට ජීවිතය ලබා දුන් අතර, එය නැවත ලබා ගැනීමට අයිතිය ඇත්තේ උන්වහන්සේට පමණි. සියදිවි නසාගැනීමෙන් අල්ලාහ්ගේ මහා දයාව කෙරෙහි ඇති බලාපොරොත්තු සුන්වීම පෙන්නුම් කරයි. අල්ලාහ් අල්-කුර්ආනයේ මෙසේ සඳහන් කරයි. **තවද, ඔබලාව ඔබලාම නොනසා ගන්න. නියතව අල්ලාහ් ඔබලා සමඟ අසම දයාවන්තයා ලෙස සිටියි.** (4:29)

**4- හූනියම් හෝ මන්ත්‍ර (සිහ්ර්) පුහුණු කිරීම**

ඉස්ලාම් දහමට අනුව මන්ත්‍ර ගුරුකම් හෝ හූනියම් කිරීම සපුරා තහනම් (හරාම්) වේ. මෙය ජින්වරුන් හෝ ෂෙයිතාන්වරුන් කැඳවා අන් අයට හානි කිරීම හෝ නපුරු අරමුණු ඉටුකර ගැනීම සඳහා කරනු ලබන රහසිගත ක්‍රියාවකි. මිනිසුන් අතර භේද ඇති කිරීම, ඔවුන්ව නොමඟ යැවීම හෝ දූෂණය පැතිරවීම වැනි තහනම් උපක්‍රම මෙහිදී භාවිතා වේ. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

**"...ෂෙයිතාන්වරුන් ප්‍රතික්ෂේප කර, මිනිසුන්ට හූනියමද, ඉගැන්වූහ."** (2:102)

අල්ලාහ්ගේ දූතයාණෝ ﷺ මෙසේ පැවසූහ: **කවරෙකු හෝ මන්ත්‍රකරුවෙකු හෝ පේන කියන්නෙකු වෙත ගොස්, ඔහු පවසන දේ විශ්වාස කරන්නේ නම්, ඔහු මුහම්මද් ﷺ වෙත පහළ කරන ලද දහම ප්‍රතික්ෂේප කළ අයෙකු බවට පත්වේ.** (අහ්මද් වාර්තා කර ඇත)

හූනියම් හෝ මන්ත්‍රයන්හි නිරත වන්නන්ගේ සලාතය හෝ උපවාසය පිළිගනු නොලැබේ. එමෙන්ම මතු ලොවෙහි (ආකිරාවෙහි) ඔවුන්ට කිසිදු පලයක් හිමි නොවේ. එවැනි පුද්ගලයින් අල්-කුර්ආනය කෙරෙහි ඇති විශ්වාසය අත්හැර ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන්නන් බවට පත්වෙති. අදෘශ්‍යමාන දේ (අනාගතය හෝ සැඟවුණු දේ) දන්නේ අල්ලාහ් ﷻ පමණී. තමන් අදෘශ්‍යමාන දේ දන්නා බව පවසන පේනකරුවන් බොරුකාරයන් සහ වංචාකාරයන්ය. මුස්ලිම්වරුන් යමක් ඉල්ලා සිටින්නේ නම්, ඔවුන් එය ඉල්ලා සිටිය යුත්තේ අල්ලාහ්ගෙන් පමණී. තමන්ට යහපතක් හෝ අයහපතක් කිරීමට මෙන්ම තමන්ව පෝෂණය කිරීමට හැකි එකම තැනැත්තා අල්ලාහ් ﷻ පමණක් බව ඔවුන් විශ්වාස කළ යුතුය. මන්ද උන්වහන්සේ සර්වබලධාරී වන බැවිනි.

යම් හෙයකින් මුස්ලිම්වරුන්ට මන්ත්‍රකාරයෙකුගෙන් හානියක් සිදුවුවහොත්, ඔවුන් මන්ත්‍රකාරයින්ට යටත් නොවිය යුතු අතර, අල්-කුර්ආනය භාවිතා කිරීමෙන්, අල්ලාහ්ගෙන් ﷻ රැකවරණය පැතීමෙන් සහ ප්‍රාර්ථනා කිරීමෙන් මෙම හානිය ඉවත් කිරීමට උත්සාහ කළ යුතුය, එය කිසිවිටෙකත් ප්‍රසිද්ධ ෂෙයික්වරයෙකු විසින් ලබා දුන් මන්ත්‍ර සහ සුරතාන්ත මගින් නොකළ යුතුය. මුස්ලිම්වරුන් නපුරු මැවීම් වලින් අල්ලාහ්ගෙන් ﷻ රැකවරණය පැතිය යුතුය. ඔවුන් දිනපතා තුන් වරක් සූරත් අල්-ෆලක් සහ සූරත් අන්-නාස් යන පරිච්ඡේද කියවිය යුතුය, එවිට අල්ලාහ් ﷻ ජින්වරුන්ගේ නපුරෙන් සහ ජනතාවගේ නපුරෙන් ඔවුන්ව ගලවා ගනු ඇත.



Allah has permitted trade and has forbidden interest

**5- රිබා (පොලිය) අනුභව කිරීම හෝ ලබා ගැනීම**


මූල්‍ය ගනුදෙනුවලදී පොලිය ලබා ගැනීම හෝ ලබා දීම ඉස්ලාමීය දහමට අනුව තහනම් කර ඇත. මන්දයත් එමගින් අන් අයගේ ධනය අසාධාරණ ලෙස හෝ නීති විරෝධී ලෙස අත්පත් කර ගැනීම සිදුවන බැවිනි. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

විශ්වාස කළවුනි ඔබලා අල්ලාහ්ට බිය වන්න. ඔබලා විශ්වාසවන්තයින් නම් පොලියෙහි ඉතිරිව තිබෙන දේ අත්හැර දමන්න. ඔබලා (එසේ) නොකළේ නම් අල්ලාහ්ගෙන්ද ඔහුගේ දූතයාගෙන්ද යුද්ධය ප්‍රකාශ කරනු ලැබීය යි දැනගන්න. ඔබලා (පොලිය අතහැර සමාව ඉල්ලා) හැරුණේ නම් ඔබලාගේ සම්පත්හි මුල ධනය ඔබලාට අයත් වේ. (මෙමගින්) ඔබලා අපරාධ කරන්නේද නැත අපරාධ කරවනු ලබන්නේද නැත. (2:278-279)

**6-** අනාථ දරුවන්ගේ ධනය අනුභව කිරීම:

අනාථ දරුවන් සහ ඔවුන්ගේ ධනය පිළිබඳ ඉස්ලාමීය දැක්ම

අනාථ දරුවන් රැකබලා ගැනීම, ඔවුන්ව ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සුරැකීම කෙරෙහි ඉස්ලාමය දැඩි අවධානයක් යොමු කරයි විශේෂයෙන්ම ඔවුන් සමාජයේ සිටින වඩාත් අසරණ පුද්ගලයන් අතර වන බැවිනි. මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවසූහ: මම සහ අනාථ දරුවෙකු රැකබලා ගන්නා පුද්ගලයා ස්වර්ගයෙහි මෙලෙස සිටින්නෙමු, යැයි පවසා එතුමාණන් තම ඇඟිලි දෙකක් (දබරැඟිල්ල සහ මැදඟිල්ල) එකිනෙකට සමීප කර පෙන්වූහ. (සහීහ් අල්-බුහාරි)




## අනාථ දරුවන්ගේ ධනය පිළිබඳ ඉස්ලාමීය නීති

**ධනය අයුතු ලෙස පරිභෝජනය කිරීම තහනම් කිරීම: අනාථ දරුවෙකුගේ ධනය අසාධාරණ ලෙස හෝ බලහත්කාරයෙන් ලබා ගැනීම ඉස්ලාමයේ මහා පාපයක් ලෙස සැලකේ.** අල්ලාහ් අල් කුර්ආනයේ

මෙසේ සඳහන් කරයි: නියතව කවරහු අනාථ දරුවන්ගේ සම්පත් අසාධාරණව අනුභව කරත්ද, ඔවුහු තමන්ගේ උදරයන්හි ගින්නම අනුභව කරති. ඔවුහු පුළුස්සා දවන නිරයෙහි ඇතුළුවන්නෝය. (4:10)

**පරිණතභාවයට පත්වන තෙක් ඔවුන්ගේ ධනය අවංකව කළමනාකරණය කිරීම**
යම් පුද්ගලයෙකු අනාථ දරුවෙකුගේ ධනය පිළිබඳ වගකීම දරන්නේ නම් (භාරකරුවෙකු ලෙස), ඔහු එම දේපළ ආරක්ෂා කළ යුතුය. එය බුද්ධිමත් ලෙස ආයෝජනය කළ යුතු අතර කිසිසේත්ම අවභාවිත නොකළ යුතුය. අනාථ දරුවා වැඩී, තීරණ ගැනීමට තරම් පරිණත වූ විට, ඔහුගේ සියලු දේපළ හා මුදල් සම්පූර්ණයෙන්ම ඔහුට ආපසු ලබා දිය යුතුය.
අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

**අනාථ දරුවන්ව විවාහ අවධියට පැමිණෙන තෙක් පරීක්ෂා කර බලන්න. ඔබලා ඔවුන් හමුවෙහි (පාලනය කිරීමේ) දක්ෂතාවය වටහාගත්තේ නම් ඔවුන්ගේ සම්පත් ඔවුනට භාර දෙන්න.** (4:6)

**7- සටන් බිමෙන් පලා යාම:**
මුස්ලිම්වරුන් තම ආගම සහ මව්බිම ආරක්ෂා කිරීම සඳහා නිරත වන යුක්තිසහගත සටනකදී, කිසිදු උපායමාර්ගික හේතුවක් නොමැතිව හුදෙක් බිය නිසා සටන් බිමෙන් පසුබැසීම හෝ පලා යාම බියගුලුකමක් මෙන්ම මුස්ලිම් ප්‍රජාවට කරනු ලබන ද්‍රෝහිකමක් ලෙස සැලකේ.

**8- පතිවෘත්තාව රකින සැදැහැවත් කාන්තාවන්ට අපහාස කිරීම:**
යහපත් ගුණගරුක කාන්තාවන්ට දුරාචාරයේ නියැලෙන බවට අසත්‍ය චෝදනා (අභූත චෝදනා) නැගීම ඉතා බරපතල වරදකි. එය ඔවුන්ගේ ගෞරවයට, කීර්තිනාමයට සහ සමාජ තත්ත්වයට දැඩි හානියක් පමුණුවයි.

**9- බොරු කීම**
බොරු කීම යනු හිතාමතාම අසත්‍යය පැවසීම හෝ සත්‍යය සැඟවීමයි. මෙය ඉස්ලාමයේ මහා පාපයක් ලෙස සැලකේ. නබිතුමාණන් ﷺ මෙසේ පැවසූහ: සත්‍යවාදීභාවය යහපත්කමට මග පෙන්වයි, යහපත්කම ස්වර්ගයට මග පෙන්වයි... බොරු කීම දුෂ්ටකමට මග පෙන්වයි, දුෂ්ටකම නිරයට මග පෙන්වයි.ම (සහීහ් අල්-බුහාරි සහ මුස්ලිම්)

බොරු කීමේ වඩාත්ම දරුණුතම ආකාරය වන්නේ අල්ලාහ් ﷻ සම්බන්ධයෙන් බොරු කීමයි. එනම් ඇතැම් අය පවසන්නාක් මෙන් අල්ලාහ්ට ﷻ පුත්‍රයෙකු බිරිඳක හෝ හවුල්කරුවෙකු සිටින බව පැවසීමයි. බොරු කීම යනු කුහකයෙකුගේ ලක්ෂණවලින් එකකි. නබිතුමාණන් ﷺ මෙසේ පැවසූහ:
**කුහකයෙකුගේ ලක්ෂණ තුනකි: ඔහු කතා කරන විට බොරු කියයි ඔහු පොරොන්දුවක් වූ විට එය කඩ කරයි සහ ඔහු කෙරෙහි විශ්වාසය තැබූ විට ඔහු එම විශ්වාසය කඩ කරයි.. (සහීහ් අල්-බුහාරි සහ මුස්ලිම්)**

නිවැරදි නිර්දෝෂී පුද්ගලයෙකු අපරාධයක් කළ බවට සාක්ෂි දීම ❑අසත්‍ය සාක්ෂි දීම❑ ලෙස හැඳින්වෙන අතර මෙය ඉස්ලාමයේ මහා විනාශකාරී පාපයන්ගෙන් එකකි. බොරු කීම අනෙකුත් පාපයන් කරා යන දොරටුවකි. එය දෙවියන්ගේ කෝපයට හේතු වන අතර නිරයට ඇතුළු වීමට මග පාදයි.

**10-** Zසිනා **(අනාචාරය සහ පරදාර සේවනය)**

Zසිනා යනු නීති විරෝධී ලිංගික සංසර්ගයයි. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි **තවද, ඔබලා ලිංගික අපචාරයට සමීප නොවන්න. නියතව එය ලැජ්ජාශීලී දෙයක් ලෙසද නපුරු මඟක් ලෙසද ඇත.** (17:32)

අනාචාරයෙන් (zසිනා) මිනිසුන්ව ආරක්ෂා කිරීම සඳහා වූ ඉස්ලාමීය නීති රීති:

1 - කාන්තාවක් විනීතව සිටීමත්, ඇයගේ මුහුණ සහ මැණික් කටුව දක්වා වූ අත් දෙක හැර සිරුරේ සෙසු කොටස් වැසෙන පරිදි දිගු ඇඳුම් ඇඳීමත්, මහ්රම් නොවන (විවාහ විය හැකි) පිරිමින් ඉදිරියේ තම අලංකාරය ප්‍රදර්ශනය නොකිරීමත් ඉස්ලාමය විසින් අනිවාර්ය කර ඇත. මෙය මීළඟ කරුණෙහි ඇති (කුර්ආන්) වැකිවල සඳහන් වේ.

2 - මිනිසුන්ට තම බැල්ම පහත හෙළන ලෙසත්, අකැප (තහනම්) දේවල් දෙස බැලීමෙන් වැළකී සිටින ලෙසත් අණ කර ඇත. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: **ඔවුන් තමන්ගේ බැලීම් පහත් කරගත යුතු යැයිද තමන්ගේ පතිවත රැකගත යුතු යැයිද (නබි) ඔබ විශ්වාසවන්ත පිරිමින්ට පවසන්න, මෙය ඔවුනට වඩාත් පිරිසිදු වේ. නියතව ඔවුන් කරන දේ ගැන අල්ලාහ් හොඳින් දන්නාය. (ඕ:නබි, ඔබ විශ්වාසවන්ත ගැහැණුන් හමුවෙහි ඔවුන් තමන්ගේ බැලුම් පහත් කරගත යුතු යැයිද, තමන්ගේ පතිවත රැකගත යුතු යැයිද, ඔවුන්ගේ අලංකාරයෙහි පිටතට පෙනෙන දේ හැර ඔවුන් වෙන කිසිවක් හෙළි නොකළ යුතු යැයිදම , තමන්ගේ හිස් වැසුම් වස්ත්‍රය තමන්ගේ පියයුරු මත දමාගන්නා ලෙසද ඔවුනට පවසන්න, තවද, ඔවුන් තමන්ගේ අලංකාරය තමන්ගේ ස්වාමි පුරුෂයින් හෝ තමන්ගේ පියවරුන් හෝ තමන්ගේ ස්වාමි පුරුෂයින්ගේ පියවරුන් හෝ තමන්ගේ පිරිමි දරුවන් හෝ තමන්ගේ ස්වාමි පුරුෂයින්ගේ පිරිමි දරුවන් හෝ තමන්ගේ සහෝදරයින් හෝ තමන්ගේ සහෝදරයින්ගේ පිරිමි දරුවන් හෝ තමන්ගේ සහෝදරියන්ගේ පිරිමි දරුවන් හෝ තමන්ගේ ගැහැණුන් හෝ තමන්ගේ වහලුන් හෝ ගැහැණුන් කෙරෙහි ඇල්මක් නැති (ඔවුනට) සමීපව ජීවත් වන (මහලු) පිරිමින් හෝ ගැහැණුන්ගේ රහස් ස්ථාන ගැන අවබෝධ නොකරගත් කුඩා ළමුන් යනාදීන් හමුවෙහි හැර අනෙක් අය හමුවෙහි හෙළි නොකළ යුතුය. තමන් වසාගෙන සිටින තමන්ගේ අලංකාරය දන්වනු ලැබීම පිණිස තමන්ගේ පාදවලින් තට්ටු කිරීමද නොකළ යුතුය. විශ්වාසවන්තයිනි, ඔබලා ජය ලැබීම පිණිස ඔබලා සියලුදෙනාම අල්ලාහ්ගෙන්ම පාපවලට සමාව අයදින්න.** (24:30-31)

**3.** ඉස්ලාමය විසින් මහ්රම් (සමීප ලේ ඥාතීන් හෝ අඹුසැමියන්) නොවන පිරිමියෙකු සහ කාන්තාවක රහසිගතව හෝ පෞද්ගලිකව තනිව සිටීම තහනම් කරයි. එමෙන්ම, මහ්රම් නොවන පිරිමින් සහ කාන්තාවන් අතර සිදුවන අනවශ්‍ය ඇසුර හෝ සම්බන්ධතා ද දුරු කරයි.

**4.** ඉස්ලාමය තරුණ තරුණියන්ට නීත්‍යානුකූල (ඉස්ලාමීය) ආකාරයෙන් විවාහ වීමට දැඩි ලෙස දිරිමත් කරන අතර, විවාහ ක්‍රියාවලිය සරල සහ පහසුවෙන් සිදු කළ හැකි දෙයක් බවට පත් කර ඇත. මෙය මුස්ලිම්වරුන් අනාචාරය නැමති පාපයට වැටීමෙන් වළක්වා ගැනීමට උපකාරී වේ.

විවාහ වීමට අපේක්ෂා කරන ඕනෑම අයෙකුට මුස්ලිම් විනිසුරුවරයෙකු වෙත යොමු විය හැකි අතර, ඔහු ඉස්ලාමීය නීතියට අනුකූලව ඔවුන් සඳහා වලංගු විවාහ සහතිකයක් නිකුත් කරනු ලබයි.

**11**- **සොරකම**

සොරකම යනු යමෙකුගේ දේපළක්, කිසිදු අයිතියක් හෝ අවසරයක් නොමැතිව රහසිගතව ලබාගැනීමේ ක්‍රියාවයි. මුහම්මද් නබිතුමාණන් ﷺ මෙසේ පැවසුහ: **සොරෙකු සොරකම් කරන විට, ඔහු එම සොරකම කරන මොහොතේ විශ්වාසවන්තයෙකු (මු:මින්වරයෙකු) නොවේ.** (මූලාශ්‍රය: මුස්ලිම්)

**12- දෙමාපියන්ට අකීකරු වීම**

**දෙමාපියන්ට අකීකරු වීම ඉස්ලාමයේ වඩාත් බරපතල පාපයන් අතරට ශ්‍රේණිගත කර ඇති අතර, එය බොහෝ විට ෂිර්ක් (අල්ලාහ්ට හවුල්කරුවන් තැබීම) සමඟ එකට සඳහන් වේ. දෙමාපියන්ට ගෞරව කිරීමේ වැදගත්කම කුර්ආනය අවධාරණය කරන අතර ඔවුන්ට අයුතු ලෙස සැලකීමට එරෙහිව අනතුරු අඟවයි. මුහම්මද් නබිතුමාණන් ﷺ ද දෙමාපියන්ට අකීකරු වීමේ බරපතලකම අවධාරණය කළහ. මෙලොව ජීවිතයේදී, එය විවිධ දුෂ්කරතා සහ අවාසනාවන් ගෙන දෙන බව විශ්වාස කෙරෙන අතර මරණින් මතු ජීවිතයේදී දඬුවම් ලැබීමට ද හේතු විය හැක.**

**බරපතල පාපයන් සඳහා අවංක පසුතැවිල්ල (තව්බා) අවශ්‍ය වන අතර, වෙනත් අයෙකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත්නම් බොහෝ විට ඒ සඳහා වන්දි ගෙවීම හෝ අදාළ පාඩුව පියවීම  සිදු කළ යුතුය.**

## ඉස්ලාමයේ ඇඳුම් පැළඳුම් කේතය

**1. ඉස්ලාමයේ ඇඳුම් පැළඳුම්වල අරමුණ**

ඉස්ලාමයේ ඇඳුම් පැළඳුම් යනු සිරුර වැසීමට පමණක් නොව, තවත් වැදගත් අරමුණු කිහිපයක් සඳහා ද භාවිතා වන්නකි. ඒවාට පහත දෑ ඇතුළත් වේ:

**- විනීතභාවය ආරක්ෂා කිරීම**: මෙහි මූලික අරමුණ වන්නේ ඉස්ලාමයේ මූලික වටිනාකමක් වන හයා ( විනීතභාවය) රැක ගැනීමයි.

**- ගෞරවයේ සංකේතයක්:** ඇඳුම් පැළඳුම් යනු මනුෂ්‍ය වර්ගයාට ගෞරවය ලබා දෙන මාධ්‍යයකි. අල්ලාහ් දෙවියන් කුර්ආනයේ මෙසේ පවසයි:
**ආදම්ගේ දරුවෙනි ඔබලාගේ රහසාංග වසන වස්ත්‍රද, අලංකාරයද අපි පහළ කර ඇත්තෙමු.** (7:26)

**- ආරක්ෂාව:** ඇඳුම් පැළඳුම් මගින් ශරීරය භෞතික හානිවලින් සහ අවට පරිසරයෙන් ආරක්ෂා කරයි.

**- අනන්‍යතාවය සහ ගෞරවය**: මුස්ලිම්වරයෙකුගේ ඇඳුම් පැළඳුම් ඔවුන්ගේ අනන්‍යතාවය පිළිබිඹු කරන අතර එය ප්‍රජාව තුළ ගෞරවය සහ ආත්ම අභිමානය ප්‍රවර්ධනය කරයි.



## 2. ඉස්ලාමයේ පිරිමින් සඳහා ඇඳුම් පැළඳුම් කේතය

- **අව්රාත් ආවරණය කිරීම:** පිරිමියෙකු තම ශරීරයේ පෙක❑යේ සිට දණහිස දක්වා ප්‍රදේශය අනිවාර්යයෙන්ම ආවරණය කළ යුතුය.
- **ලිහිල් සහ විනීත බව:** ඇඳුම් ශරීරයට තද නොවිය යුතු අතර ඒවා විනිවිද පෙනෙන සුළු නොවිය යුතුය.
- **අනුකරණයෙන් වැළකී සිටීම**: පිරිමින් කාන්තාවන්ව හෝ ආගමික සන්දර්භයක් තුළ වෙනත් ආගමිකයන්ව අනුකරණය කරමින් ඇඳුම් නොඇඳිය යුතුය.

- **රන් සහ සේද තහනම් කිරීම:** පිරිමින් සඳහා පිරිසිදු රන් හෝ සේද ඇඳුම් ඇඳීම තහනම් වේ. මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පවසා ඇත: **රන් සහ සේද මගේ උම්මතයේ (අනුගාමිකයින්ගේ) කාන්තාවන්ට අවසර දී ඇති අතර පිරිමින්ට තහනම් කර ඇත.** (අබූ දාවූද් සහ අන්-නසායි)

- **පිළිවෙල සහ පිරිසිදුකම:** ඉස්ලාමය පිරිමින්ට පිරිසිදුව හා පිළිවෙලකට ඇඳුම් ඇඳීමට දිරිගන්වයි.

## 3. ඉස්ලාමයේ කාන්තාවන් සඳහා වූ ඇඳුම් පැළඳුම් නීති

- **මුහුණ සහ දෑත් හැර මුළු ශරීරයම වැසීම**: කාන්තාවක් ලිහිල්, විනිවිද නොපෙනෙන ඇඳුම් වලින් තම මුළු ශරීරයම ආවරණය කළ යුතුය. මුහුණ සහ මැණික් කටුව දක්වා දෑත් පමණක් නිරාවරණය කර තැබිය හැකිය.

**- හිජාබය (හිස ආවරණය කිරීම):** මහ්රම් නොවන (විවාහ විය හැකි සමීප නොවන) පිරිමින් ඉදිරියේ කාන්තාවන් තම කොණ්ඩය සහ බෙල්ල ආවරණය කළ යුතුය.
**- ලිහිල් සහ ශරීරය ඉස්මතු නොවන ඇඳුම්:** ඇඳුම් ශරීරයේ හැඩය නිරූපණය නොවන පරිදි ලිහිල් විය යුතු අතර අනවශ්‍ය ලෙස අවධානය යොමු කරගන්නා සුළු නොවිය යුතුය.
**- ප්‍රසිද්ධියේ සුවඳ විලවුන් භාවිතයෙන් වැළකී සිටීම:** කාන්තාවන් නිවසින් බැහැරට යන විට ප්‍රබල සුවඳ විලවුන් භාවිත කිරීමෙන් වැළකී සිටිය යුතුය.

-අනුකරණයෙන් වැළකී සිටීම: කාන්තාවන් පිරිමි ඇඳුම් ඇඳීමෙන් හෝ වෙනත් ආගමික සන්නාම සහිත ඇඳුම් ඇඳීමෙන් වැළකී සිටිය යුතුය. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

**විශ්වාසවන්ත ගැහැණුන් හමුවෙහි ඔවුන් තමන්ගේ බැල්ම පහත් කරගත යුතු යැයිද තමන්ගේ පතිවත රැකගත යුතු යැයිද ඔවුන්ගේ අලංකාරයෙහි පිටතට පෙනෙන දේ හැර ඔවුන් වෙන කිසිවක් හෙළි නොකළ යුතු යැයිද තමන්ගේ හිස් වැසුම් වස්ත්‍රය තමන්ගේ පියයුරු මත දමාගන්නා ලෙසද ඔවුනට පවසන්න** (24:31)

**4. ඉස්ලාමයේ තහනම් කර ඇති ඇඳුම් පැළඳුම්**
**- විනිවිද පෙනෙන හෝ තද ඇඳුම්:** ශරීරය විනිවිද පෙනෙන හෝ ශරීරයට ඉතා තද ඇඳුම් ඇඳීම පිරිමි සහ ගැහැණු දෙපාර්ශවයටම තහනම් වේ.
**- ප්‍රතිවිරුද්ධ ලිංගිකයන් අනුකරණය කිරීම:** පිරිමින් කාන්තාවන් මෙන්ද කාන්තාවන් පිරිමින් මෙන්ද ඇඳුම් ඇඳීම සපුරා තහනම් වේ.
**- උඩගුකම පෙන්වන ඇඳුම්:** අන් අයට වඩා උසස් යැයි පෙන්වීමට ආඩම්බරයට හෝ පුරසාරම් දෙඩීමට අඳින ඇඳුම් ඉස්ලාමය තුළ හෙළා දැක ඇත.
**- නුසුදුසු සංකේත සහිත ඇඳුම්:** ඉස්ලාමීය ඉගැන්වීම්වලට පටහැනි රූප සටන් පාඨ හෝ සංකේත සහිත ඇඳුම් ඇඳීමෙන් වැළකී සිටිය යුතුය.
**- අන්‍යාගමික වත්පිළිවෙත්වලට අදාළ ඇඳුම්:** අනෙකුත් ආගම්වලටම ආවේ❑ක වූ හෝ එම ආගම් නිරූපණය කරන ඇඳුම් පැළඳුම් (උදාහරණ: කුරුස ලකුණ සහිත දෑ පූජක ඇඳුම්) ඇඳීමෙන් වැළකී සිටිය යුතුය.

# ඉස්ලාමයේ පවුල් ජීවිතය

## ඉස්ලාමය තුළ පවුලට හිමි ස්ථානය

ඉස්ලාම් දහම තුළ පවුලට හිමිවන්නේ මධ්‍යම මට්ටමේ ප්‍රධාන ස්ථානයකි. පවුල යනු යහපත් සහ සදාචාරාත්මක සමාජයක පදනම ලෙස සැලකේ. ආදරය, කරුණාව, සහයෝගය සහ සදාචාරාත්මක වටිනාකම් පෝෂණය වන්නේ පවුල තුළිනි. ඉස්ලාමය ශක්තිමත් පවුල් සබඳතා සහ ඥාති සබඳතා පවත්වා ගැනීම (සිලත් අර්-රහිම්) බෙහෙවින් දිරිමත් කරයි. පවුල් ව්‍යුහය තුළ අන්‍යෝන්‍ය



ගෞරවය, වගකීම සහ සමගිය පවත්වා ගැනීමේ වැදගත්කම අල්-කුර්ආනය සහ සුන්නාහ්ව (නබි වදන) අවධාරණය කරයි.

## ඉස්ලාමය තුළ කාන්තාවට හිමි ස්ථානය

**ඉස්ලාම් දහම කාන්තාවන් කෙරෙහි දක්වන ගෞරවය පිළිබඳ උදාහරණ:**

**1. ගෞරවනීය සහ සම්භාවනීය තත්ත්වය**
කාන්තාවන් බොහෝ විට දේපළ ලෙස සලකනු ලැබූ, මූලික අයිතිවාසිකම් අහිමි කර තිබූ සහ පිරිමින්ට වඩා අඩු අගයකින් සැලකූ යුගයක ඉස්ලාමය බිහි විය. අල්-කුර්ආනය සහ මුහම්මද් නබි ﷺ තුමාණන්ගේ ඉගැන්වීම් මගින් කාන්තාවගේ තත්ත්වය උසස් කරන ලද අතර, ඇයට ගෞරවය, අභිමානය සහ සමාන මනුෂ්‍යයෙකු ලෙස පූර්ණ පිළිගැනීමක් ලබා දුන්නේය.
ඉස්ලාමය කාන්තාවන් සමාජයේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය හවුල්කරුවන් ලෙස සලකන අතර, පිරිමින් මෙන්ම වන්දනාමාන සහ දැහැමි බව සම්බන්ධයෙන් ඔවුන්වද වගකීමට බැඳී සිටින පුද්ගලයන් ලෙස සලකයි.

**2. ආධ්‍යාත්මික සමානාත්මතාවය සහ සදාචාරාත්මක වගකීම**
මඉස්ලාම් දහමට අනුව, අල්ලාහ් ඉදිරියෙහි පිරිමින් සහ කාන්තාවන් ආධ්‍යාත්මිකව සමාන වේ. ඔවුන් තම ක්‍රියාවන්ට සමානව වගකිව යුතු අතර, ඔවුන්ට ප්‍රතිඵල/ප්‍රතිලාභ හිමිවන්නේ ඔවුන්ගේ භක්තිමත්භාවය මත පදනම්ව මිස ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය මත නොවේ. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:
**නියතව මුස්ලිම් වන පිරිමින්, මුස්ලිම් වන ගැහැණුන්, විශ්වාසවන්තයින් වන පිරිමින්, විශ්වාසවන්තයින් වන ගැහැණුන්, ........... අල්ලාහ් සමාවද ඉමහත් කුලියද පිළියෙල කර තබා ඇත්තේය.** (33:35)

**විශ්වාසය**, වන්දනාමාන කිරීම, සදාචාරාත්මක බැඳීම් හෝ මරණින් මතු ජීවිතයේදී ලැබෙන දඬුවම් සහ ප්‍රතිඵල සම්බන්ධයෙන් පිරිමියෙකු සහ කාන්තාවක අතර කිසිදු වෙනසක් නොමැත.

**3. ඉස්ලාමය පිරිමින් සහ කාන්තාවන් අතර සමානාත්මතාවය ස්ථාපිත කරයි (මෙය අනිවාර්යයෙන්ම සෑම අතින්ම අනන්‍ය වීමක් නොවේ). එය ඔවුන්ගේ ස්වභාවික වෙනස්කම්වලට ගැලපෙන පරිදි සාධාරණ සහ යුක්තිසහගත අයුරින් සකස් කර ඇත. පවුල සහ සමාජය තුළ**

**දෙපාර්ශවයටම එකිනෙකාට අනුපූරක වන භූමිකාවන් පවරා ඇත. කාන්තාවන්ට දේපළ අයිති කර ගැනීමට, ව්‍යාපාර පවත්වාගෙන යාමට සහ ගිවිසුම්වලට එළඹීමට අයිතියක් ඇත.**

**4. උරුමය සඳහා ඇති අයිතිය**

බොහෝ සංස්කෘතීන්වල කාන්තාවන්ට දේපළ උරුමය අහිමිව තිබූ වකවානුවක, ඉස්ලාමය ඔවුන්ට දේපළ උරුම කර ගැනීමේ අයිතිය ලබා දුන්නේය. මෙය එකල ලොව බොහෝ සංස්කෘතීන්වල අසන්නට පවා නොලැබුණු සංකල්පයකි. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

**දෙමාපියන් හා සමීප නෑයන් හැර ගිය දේහි පිරිමින්ටද කොටස් ඇත. දෙමාපියන් හා සමීප නෑයන් හැර ගිය දේහි ගැහැණුන්ටද කොටස් ඇත** (4:7)

- කාන්තාවකට දියණියක, මවක, බිරිඳක හෝ සහෝදරියක ලෙස දේපළ උරුම කර ගත හැකි අතර, ඇයගේ උරුමයේ කොටස අල්-කුර්ආනය තුළ පැහැදිලිව දක්වා ඇත.

- ඇතැම් අවස්ථාවලදී කාන්තාවකගේ කොටස පිරිමියෙකුගේ කොටසින් අඩක් වුවද, මෙයට හේතුව ඉස්ලාමීය නීතියට අනුව කාන්තාවකට මූල්‍යමය වගකීම් නොමැති වීමයි මන්ද යත් පවුල නඩත්තු කිරීමේ සම්පූර්ණ වගකීම පිරිමින්ට පැවරී ඇති බැවිනි.



**5- තම ස්වාමිපුරුෂයා තෝරා ගැනීමේ අයිතිය**

ඉස්ලාම් දහම කාන්තාවන්ට තමන් කැමති ස්වාමිපුරුෂයෙකු තෝරා ගැනීමේ අයිතිය සහ විවාහයෙන් පසුවද තමන්ගේ පිය පාර්ශවයේ වාසගම (තබා ගැනීමේ අයිතිය ලබා දෙයි. ඉස්ලාමයේදී කාන්තාවක් විවාහ වූ පසු ඇයගේ වාසගම ඇයගේ ස්වාමිපුරුෂයාගේ වාසගමට වෙනස් නොකරයි.

**6. පීඩාවලින් ආරක්ෂාව**

ඉස්ලාම් දහම කාන්තාවන්ට සිදු කරන ඕනෑම ආකාරයක පීඩාවක් අපයෝජනයක් හෝ අයහපත් සැලකීමක් සපුරා තහනම් කරයි. මුහම්මද් නබි ﷺ තුමාණන් තම භාර්යාවන් සමඟ ඉතා කරුණාවෙන් සහ මෘදු ලෙස කටයුතු කළ අතර එලෙසම කටයුතු කරන ලෙස අන් අයටද බලකර සිටියේය:

# ඉස්ලාමයේ අඹුසැමි අයිතිවාසිකම්

**මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවසුහ: මඹබ අතරින් වඩාත් උතුම් තැනැත්තා වන්නේ තම බිරිඳට හොඳින් සලකන තැනැත්තායි. (තිර්මිදි)**

විවාහය යනු ආදරය, කරුණාව සහ සහයෝගය මත ගොඩනැගුණු හවුල්කාරිත්වයකි. ඉස්ලාමය සාධාරණත්වය සහ සමබරතාවය අවධාරණය කරන අතර එහිදී ස්වාමියා සහ බිරිඳ යන දෙදෙනාම තමන්ගේ භූමිකාවන් කරුණාව විශ්වාසය සහ දයාවෙන් යුතුව ඉටු කිරීමට උත්සාහ කරති.

**දෙමාපියන්ගේ අයිතිවාසිකම්**

**ඉස්ලාමය දෙමාපියන්ට කරුණාව දැක්වීම, ගරු කිරීම සහ කීකරුවීම අනිවාර්ය කර ඇත (විශේෂයෙන් ඔවුන් මහලු වියට පත් වූ විට). ඔවුන්ගේ උසස් තත්ත්වය සැලකෙන්නේ අල්ලාහ් ﷻ සහ ඔහුගේ දූතයාණන්ගේ අයිතිවාසිකම්වලට පමණක් දෙවැනි වන අයුරිනි. අල්-කුර්ආනයේ මෙසේ සඳහන් වේ: තවද මනුෂ්‍යයාට ඔහුගේ දෙමාපියන් (රැකබලා ගැනීම) පිළිබඳව අපි අණ කළෙමු...**
(31:14)
දෙමාපියන්ට සේවය කිරීම සහ ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම ජීවිත කාලය පුරාම පවතින යුතුකමකි. ඔවුන්ට අකීකරු වීම බරපතල පාපයක් ලෙස සැලකේ.

**දරුවන්ගේ අයිතිවාසිකම්**

ඉස්ලාමය තුළ දරුවන් යනු අල්ලාහ් විසින් ලබා දුන් භාරකාරත්වයකි ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ඇතුළත් වන්නේ:

- ජීවත් වීමේ අයිතිය, නමක් ලැබීමේ අයිතිය, පෙළපත සහ උරුමය සඳහා ඇති අයිතිය.
- ආදරය, රැකවරණය සහ නිසි ඇති දැඩි කිරීම.
- අධ්‍යාපනය (ආගමික සහ ලෞකික) සහ සදාචාරාත්මක පුහුණුව.
- සහෝදර සහෝදරියන් අතර සාධාරණ සහ සමාන සැලකිල්ල.

මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවසූහ: මඔබ සැම දෙනාම එඩේරෙකු (භාරකරුවෙකු) වන අතර ඔබේ රැළ (භාරයේ සිටින්නන්) පිළිබඳව ඔබ වගකිව යුතුය.ම (බුහාරි සහ මුස්ලිම්)

ඉස්ලාමය වගකීම දකින්නේ බරක් ලෙස නොව උතුම් භූමිකාවක් ලෙසයි. මෙම හදීසයට අනුව වගකීමෙන් යුතුව කටයුතු කිරීම නායකත්වයේ එක් ආකාරයකි සෑම දෙමාපියෙකුම ගුරුවරයෙකුම හෝ නායකයෙකුම ප්‍රඥාවෙන් සාධාරණත්වයෙන් සහ ආදරයෙන් අන් අයව රැකබලා ගැනීමට අල්ලාහ් විසින් භාර දී ඇති පුද්ගලයන් වේ.

# මහ්රම්

මහ්රම් යන පදය මගින් අදහස් කරන්නේ, කාන්තාවකට රුධිර සබඳතාවයකින් හෝ කිරි මව් සබඳතාවයකින් (ළදරු වියේදී එකම මවකගෙන් කිරි බීමෙන් ඇතිවන සබඳතාවය) සම්බන්ධ වූ ඇයට විවාහ වීම තහනම් වූ ඕනෑම පිරිමියෙකුයි.පුද්ගලයෙකුගේ ප්‍රතිවිරුද්ධ ලිංගික සහෝදර දරුවන් (ස්වාමියාගේ හෝ බිරිඳගේ) සහෝදර සහෝදරියන් මහ්රම් ලෙස සලකනු නොලැබේ. මීට හේතුව ඉස්ලාමයේ සහෝදර දරුවන් අතර විවාහය අනුමත කර තිබීමයි. එමෙන්ම අඹුසැමියන් අතර දික්කසාදයක් සිදු වූ විට හෝ අයෙකු මියගිය විට තම කලත්‍රයාගේ ප්‍රතිවිරුද්ධ ලිංගික සහෝදරයා හෝ සහෝදරිය සමඟ විවාහ වීමට අවසර ඇත.එබැවින් එවැනි ඥාතීන් (උදාහරණ: සහෝදර දරුවන් සහ කලත්‍රයාගේ සහෝදර සහෝදරියන්) හමුවේ හිජාබය පැළඳීමේදී ඔවුන්ව සැලකිය යුත්තේ මහ්රම් නොවන අයෙකු හෝ ආගන්තුකයෙකු ලෙසටමය. දික්කසාදයකදී ස්වාමියා හෝ බිරිඳ ද මහ්රම් නොවන අයෙකු බවට පත්වේ.

# ඉස්ලාම් දහමේ විවාහය

## විවාහයේ වැදගත්කම



ඉස්ලාම් දහම තුළ විවාහය යනු ශුද්ධ වූ ගිවිසුමක් මෙන්ම වන්දනාමාන ක්‍රියාවකි. තම පාරිශුද්ධත්වය රැකගැනීමටත්, මානසික සැනසීම ලබාගැනීමටත්, පවුලක් ස්ථාපිත කිරීමටත් විවාහය මඟක් වන බැවින්, විවාහ වන ලෙසත් විවාහ වීමට බලාපොරොත්තු වන අයට එය පහසු කර දෙන ලෙසත් ඉස්ලාමය සිය අනුගාමිකයන්ට අණ කරයි. අල්ලාහ් අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: **ඔබලා බිරියන් හමුවෙහි සැණසීම ලැබීම පිණිස ඔහු ඔබලාගෙන්ම ඔබලා වෙනුවෙන් ඔවුන්ව මවා තබීමද තවද ඔහු, ඔබලා අතර කරුණාවද ආදරයද ඇති කර තිබීමද ඔහුගේ සාක්ෂීන්හි ඇති ඒවාය.** (30:21)

විවාහය අන්‍යෝන්‍ය එකඟතාවය මත පදනම් විය යුතු අතර, සහකරුවන් දෙදෙනාටම අදාළ අයිතිවාසිකම් සහ වගකීම් පවතී.



## විවාහයක වලංගුභාවය සඳහා අවශ්‍ය මූලික කොන්දේසි

ඉස්ලාමීය නීතියට (ෂරියා නීතියට) අනුව විවාහයක් වලංගු වීම සඳහා සපුරාලිය යුතු ප්‍රධාන කොන්දේසි පහත දැක්වේ.

**1- අඹුසැමියන් හඳුනා ගැනීම:**
මනාලයා, මනාලිය සහ සාක්ෂිකරුවන්ගේ නම් සහ විස්තර ඉතා පැහැදිලිව තිබිය යුතුය. (විවාහයට සම්බන්ධ වන සියලුම පාර්ශවයන් වැඩිහිටි සහ සිහිබුද්ධිය ඇති අය විය යුතුය.)

**2- දෙපාර්ශවයේ අනුමැතිය:**
විවාහය සඳහා පුරුෂයා සහ ස්ත්‍රිය යන දෙදෙනාගේම එකඟතාවය තිබිය යුතුය.

**3- කාන්තාවගේ භාරකරුගේ සහභාගීත්වය (වලී)** :
මෙය නබි ﷺ තුමාගේ ප්‍රකාශය මත පදනම් වේ. නීත්‍යානුකූල භාරකරුවෙකු නොමැතිව විවාහයක් නොමැත (මෙය ප්‍රධාන හදීස් ග්‍රන්ථ පහක වාර්තා වී ඇත.)

**4- සාක්ෂිකරුවන්ගේ පැමිණීම::**
**ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද, නබිතුමාගේ ﷺ හදීස් දේශනාවකට අනුව, විවාහ ගිවිසුම සාක්ෂිකරුවන් ඉදිරියේ සිදුවිය යුතුය: නීත්‍යානුකූල භාරකරුවෙකු සහ සාක්ෂිකරුවන් දෙදෙනෙකු නොමැතිව විවාහයක් නොමැත.**

5- දෑවැද්ද (මහර්)
මෙය මනාලයා විසින් මනාලියට ලබා දිය යුතු අනිවාර්ය විවාහ තෑග්ගකි. මෙය බොහෝ විට මුදල් හෝ මනාලයා සහ මනාලිය එකඟ වන වටිනාකමක් ඇති ඕනෑම දෙයක් (රන් ආභරණ, දේපල ආදිය) විය හැකිය.

## විවාහ වීමට තහනම් වන කාන්තාවන්

**පුරුෂයෙකුට පහත දැක්වෙන ප්‍රධාන කාණ්ඩ දෙකට අයත් කාන්තාවන් විවාහ කර ගැනීම තහනම් වේ:**

### 1 වන කාණ්ඩය: : ස්ථිරවම විවාහය තහනම් වූවන්:

**පහත සඳහන් කරුණු නිසා මොවුන් සමග විවාහ වීම සදාකාලිකවම තහනම් වේ:**

**A.** පවුලේ ඥාති සබඳතා:

1- මව, මිත්තණිය (ආච්චි) සහ ඉහළට යන සියලුම මිත්තණියන්..

**2- මව, මිත්තණිය (ආච්චි) සහ ඉහළට යන සියලුම මිත්තණියන්.**

**3- සහෝදරිය.**

4- සහෝදරියකගේ හෝ සහෝදරයෙකුගේ දියණිය (ලේලිය) හෝ මිනිබිරිය සහ ඔවුන්ගෙන් පැවත එන සියලුම මිනිබිරියන්.

**5- මවගේ සහ පියාගේ සහෝදරියන් (පුංචි අම්මා, ලොකු අම්මා සහ නැන්දා).**

**B- විශේෂිත හේතූන් (මව්කිරි දීම හෝ විවාහ සබඳතා වැනි):**

**1- පියාගේ බිරිඳ (කුඩම්මා) හෝ සීයාගේ බිරිඳ, සහ එලෙස ඉහළට යන පරම්පරාවල සීයාගේ බිරිඳන්.**

2- බිරිඳගේ මව (නැන්දම්මා) හෝ මිත්තණිය (ආච්චි) සහ එලෙස ඉහළට යන සියලුම මිත්තණියන්.

**3- බිරිඳගේ දියණිය (ඇයගේ පෙර විවාහයකින් ලැබුණු දියණියක් වුවද).**

**4- බිරිඳගේ පුත්‍රයා හෝ දියණිය හරහා ලැබෙන මිණිබිරියන්.**

**5-තමන්ගේ පුතාගේ බිරිඳ (ලේලි) හෝ මුණුබුරාගේ බිරිඳ.**

**II වන කාණ්ඩය: තාවකාලිකව විවාහ වීම තහනම් කාන්තාවන්**

ඇතැම් තාවකාලික තත්ත්වයන් හේතුවෙන් මෙම කාන්තාවන් විවාහ කර ගැනීම තහනම් වේ. එම තත්ත්වය පහව ගියහොත්, ඔවුන් සමග විවාහ වීම අනුමත වේ. කෙසේ වෙතත්, එම හේතුව පවතින අතරතුර එවැනි කාන්තාවක සමග විවාහ වීම තහනම් වේ.

මෙයට පහත අය ඇතුළත් වේ:

**1-සහෝදරියන් දෙදෙනෙකු:** එක් පිරිමියෙකුට සහෝදරියන් දෙදෙනෙකු එකම අවස්ථාවක විවාහ කරගෙන සිටිය නොහැක.

**2-බිරින්දෑවරුන් හතර දෙනෙකුට වඩා සිටීම:** (හතර දෙනෙකු සිටින විට පස්වැන්නියක් තාවකාලිකව තහනම් වේ).

**3-ඉද්දා කාල සීමාවේ පසුවන කාන්තාවන්:** දික්කසාද වීමෙන් හෝ වැන්දඹු වීමෙන් පසු පසුවිය යුතු නියමිත කාල සීමාව අවසන් වන තෙක්.

**4-අනාචාරයේ යෙදුණු කාන්තාවක්:** ඇය අවංකවම පසුතැවිලි වී (තව්බා කර) නිවැරදි වන තෙක්.

**5-තුන් වරක් දික්කසාද කළ කාන්තාවක්:** ඇය වෙනත් පුරුෂයෙකු විවාහ කරගෙන එම විවාහය අවසන් වන තෙක් (නැවත පළමු සැමියාට ඇයව විවාහ කර ගත නොහැක).

**6- ඉහ්රාම් තත්ත්වයේ පසුවන කාන්තාවක්**: හජ් හෝ උම්රා වන්දනාවේ යෙදී සිටින අතරතුර එම තත්ත්වයෙන් මිදෙන තෙක්.

**7-බහුදේවවාදී කාන්තාවන්:** මුස්ලිම් නොවන, එමෙන්ම මවේද හිමි ජනයාම නොවන කාන්තාවන්.

**8-මුස්ලිම් වහල් කාන්තාවක්**: (ඇතැම් නීතිමය කොන්දේසි යටතේ විවාහය තහනම් වන අවස්ථාවලදී).

## ඉස්ලාම් දහම තුළ දික්කසාදය




ඉස්ලාම් දහම තුළ දික්කසාදය අධෛර්යමත් කර ඇති නමුත්, සමගි කිරීමේ සියලු උත්සාහයන් අසාර්ථක වූ විට අවසාන විසඳුම ලෙස එයට අවසර දී ඇත. යුක්තිය ඉටු කිරීම සහ හානිය අවම කිරීම සහතික කිරීම සඳහා ඉස්ලාමය පැහැදිලි මාර්ගෝපදේශ සපයයි. එම ක්‍රියාවලියට පහත දෑ ඇතුළත් වේ:

- පවුලේ මැදිහත්වීම හෝ උපදේශනය හරහා සමගි වීමට උත්සාහ කිරීම.
- ඉද්දා (පොරොත්තු කාලය) නිරීක්ෂණය කිරීම.
- දික්කසාදය අතරතුර සහ ඉන් පසුව කරුණාවන්ත ලෙස සැලකීම. ශුද්ධ වූ කුර්ආනය මෙසේ සඳහන් කරයි: **එම දෙදෙනාම වෙන් වුයේ නම් අල්ලාහ් එක් එක්කෙනාවම තම ත්‍යාගශීලීභාවයෙන් (අනෙක් අය කෙරෙන්) අවශ්‍යතා නොමැත්තෙකු බවට පත්කරන්නේය.** (4:130)

## ආහාර සහ පාන වර්ග

**ඉස්ලාම් දහම තුළ ආහාර පාන පිළිබඳ පොදු රීතිය**

ඉස්ලාම් දහම තුළ ආහාර පාන පිළිබඳ පොදු රීතිය වන්නේ ශුද්ධ වූ කුර්ආනයෙහි හෝ සුන්නාවෙහි (නබි වදන්වල) විශේෂයෙන් තහනම් කර නොමැති සියලුම ආහාර සහ පාන වර්ග අනුමත බවයි. ශුද්ධ වූ කුර්ආනය මෙසේ සඳහන් කරයි: **මිනිසුනි ! පොළොවෙහි ඇති දේවලින් (අල්ලාහ් ﷻ විසින්) අනුමත කරනු ලැබූ පිරිසිදු දේම අනුභව කරන්න....”** (2:168). කෙසේ වෙතත් හානිකර අපිරිසිදු හෝ පාපය සමග සම්බන්ධ වූ ඕනෑම දෙයක් අකැප (හරාම්) ලෙස සැලකේ.



## අනුමත ආහාර (හලාල්)

- **ශාක සහ ගස්**: මත්පැන්, මත්ද්‍රව්‍ය සහ අනෙකුත් මත්කරන ද්‍රව්‍ය හැර අනෙකුත් සියලුම වර්ගයේ ශාක සහ ගස්වලින් ලැබෙන දෑ අනුමත වේ. නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වැනි, පුද්ගලයෙකුට තම මනස පාලනය කර ගැනීමට නොහැකි වන ඕනෑම දෙයක් තහනම් වේ.
- **ගෘහස්ත සතුන්**: බැටළුවන්, එළුවන්, ගවයන් සහ ඔටුවන් වැනි සතුන් අනුමත වේ.
- **පක්ෂීන්:** කුකුළන්, තාරාවන් සහ පරෙවියන් වැනි පක්ෂීන් අනුමත වේ.

- **මුහුදු ආහාර**: මුහුදු ආහාර අනුමත කර ඇත. මේ සම්බන්ධයෙන් නබි ﷺ තුමාණන් මෙසේ පවසා ඇත: එහි (මුහුදේ) ජලය පිරිසිදුය, එහි මියගිය සතුන් අනුමත වේ. (තිර්මිදි)

## තහනම් ආහාර සහ පාන වර්ග (හරාම්)

- මියගිය සතුන්: (ඉස්ලාමීය ක්‍රමයට ඝාතනය කිරීමට පෙර ඉබේම මියගිය සතුන්).
- ලේ
- ඌරන්
- මාංශ භක්ෂක සතුන්: සිංහයන්, ව්‍යාඝ්‍රයන් (කොටි), බළලුන් සහ බල්ලන් වැනි මස් අනුභව කරන සියලුම සතුන්.
- ගොදුරු අල්ලා ගන්නා නියපොතු සහිත පක්ෂීන්: උකුස්සන් සහ රාජාලියන් වැනි පක්ෂීන්.
- ඉස්ලාමීය ක්‍රමයට අනුව ඝාතනය නොකළ සතුන්.
- මත්පැන්, මත්ද්‍රව්‍ය සහ අනෙකුත් සියලුම ආකාරයේ මත්කරන ද්‍රව්‍ය.

### මධ්‍යසාර පානය පිළිබඳ ඉස්ලාමීය තීන්දුව

ඉස්ලාම් දහමට අනුව මධ්‍යසාර (මත්පැන්) පානය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් (හරාම්) වේ. මෙම නියෝගය ශුද්ධ වූ කුර්ආනයේ පැහැදිලි වැකි සහ මුහම්මද් නබිතුමාගේ ﷺ බොහෝ කියමන් (හදීස්) මත පදනම් වී ඇත.මධ්‍යසාර යනු ශරීරයට මෙන්ම ආත්මයට ද හානිකර වූ, අපවිත්‍ර දෙයක් ලෙස සැලකේ. මෙය ඉස්ලාමයේ ප්‍රධාන පාපයන්ගෙන් එකකි. මේ පිළිබඳව අල්ලාහ් ﷻ ශුද්ධ වූ කුර්ආනයේ මෙසේ පවසයි **විශ්වාස කළවුනිදෑ, මත් පැන්ද, සූදු සෙල්ලමද, (නැමදුම් කිරීම සඳහා) සිටවනු ලැබූ ඒවාද, නිමිති බලන ඊතලද පිළිකුල් කළ යුතු ෂෙයිතාන්ගේ ක්‍රියාවල ඇති ඒවාය. එහෙයින්, ඔබලා ජය ලැබීම පිණිස ඒවායින් වැළකී සිටින්න.** (5:90)
මුහම්මද් නබි ﷺ තුමා මධ්‍යසාරයේ ඇති භයානකකම අවධාරණය කරමින් මෙසේ පැවසීය: **"සෑම මත්ද්‍රව්‍යයක්ම කම්ර් (මධ්‍යසාර) වේ, සෑම කම්ර් වර්ගයක්ම හරාම් (තහනම්) වේ."** (මුස්ලිම් ග්‍රන්ථය) එතුමා තවදුරටත් මෙසේද පැවසීය: "යම් දෙයක් විශාල ප්‍රමාණයකින් පානය කිරීමෙන් මත් ගතියක් ඇති වේ නම්, එහි ස්වල්ප මාත්‍රයක් පවා තහනම් වේ." (අබු දාවුද් ග්‍රන්ථය)

මධ්‍යසාර සම්බන්ධව කටයුතු කරන පුද්ගලයින් දස දෙනෙකුට නබි ﷺ තුමා ශාප කළේය. ඒ අතර එය පානය කරන්නා, එය පිළිගන්වන්නා (බෙදාහරින්නා), එය විකුණන්නා, එය මිලදී ගන්නා සහ තවත් අය ඇතුළත් වේ

### මත්ද්‍රව්‍ය පිළිබඳ ඉස්ලාමීය තීන්දු

ඉස්ලාම් දහමට අනුව මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රධාන පාපයන්ගෙන් එකකි. එම මත්ද්‍රව්‍ය ශාක ආශ්‍රිත ඒවා වුවද, කෘතිමව නිෂ්පාදනය කළ ඒවා වුවද, ඒවා ආශ්වාස කිරීමෙන්, ගිල දැමීමෙන් හෝ එන්නත් කිරීමෙන් ශරීරගත කළද එම තහනම එකසේ අදාළ වේ. මීට හේතුව මත්ද්‍රව්‍ය මගින් පුද්ගලයෙකුගේ ශරීරයට, මනසට සහ ආත්මයට දැඩි හානි පමුණුවන බැවිනි. මත්ද්‍රව්‍ය භාවිතය නිසා පුද්ගලයාගේ ඇදහිල්ල (ඊමාන්) දුර්වල වන අතරම, එය අපරාධ, ප්‍රචණ්ඩත්වය සහ සමාජය පිරිහීමට ද මග

පාදයි. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: "**ඔබලාව ඔබලාම නොනසා ගන්න. නියතව අල්ලාහ් ඔබලා සමඟ අසම දයාවන්තයා ලෙස සිටියි.**" (4:29)

## ඉස්ලාමීය ක්‍රමයට සතුන් මැරීම

ගොඩබිම වසන සතුන් ආහාරයට ගැනීම සඳහා සුදුසු (හලාල්) වීමට නම්, ඔවුන් ඉස්ලාමීය මාර්ගෝපදේශයන්ට අනුව මරා තිබිය යුතුය:

- සතා මරන අවස්ථාවේදී අල්ලාහ් ﷻ ගේ නාමය (බිස්මිල්ලාහ්) මෙනෙහි කළ යුතුය.
- සතාගේ සිරුරෙන් ලේ සම්පූර්ණයෙන්ම පිට වීමට ඉඩ හැරිය යුතුය.
- සතාට අවම වේදනාවක් දැනෙන පරිදි මුවහත් පිහියකින් සත්වයා මැරිය යුතුය.
- මෙම කර්තව්‍යය සිදු කළ හැක්කේ සිහිබුද්ධිය ඇති, වගකිවයුතු මුස්ලිම්වරයෙකුට (හෝ ග්‍රන්ථයේ හිමිකරුවන් හෙවත් අහ්ලුල් කිතාබ්වරුන්ට) පමණි. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: "**ඔබලා අල්ලාහ්ගේ නම පවසනු නොලැබූ දේවලින් අනුභව නොකරන්න.....** (6:121)

## ඉස්ලාමයේ ආහාර පාන ගැනීමේ විනය (ආචාර විධි)

ඉස්ලාම් දහම ආහාර ගැනීමේදී සහ පානය කිරීමේදී අනුගමනය කළ යුතු යහපත් ගතිගුණ සහ සනීපාරක්ෂක පුරුදු උගන්වයි:

- ආහාර ගැනීමට පෙර සහ පසුව දෑත් සෝදන්න.
- බිස්මිල්ලාහ් (අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි) යනුවෙන් පවසා ආහාර ගැනීම ආරම්භ කරන්න.
- සෑම විටම ආහාර පාන ගැනීමේදී දකුණු අත භාවිතා කිරීමේ
- ආහාර අපතේ නොයවන්න සහ අධික ලෙස ආහාර ගැනීමෙන් වළකින්න.
- භාජනයේ මැදින් නොව, තමාට ඉදිරියෙන් ඇති කොටසින් ආහාර ගන්න.
- කිසිදු හේතුවක් නිසා ආහාරයට දොස් නොකියන්න.
- ආහාර ගෙන අවසන් වූ පසු අල්ලාහ්ට ස්තුතිවන්ත වන්න ( අල්හම්දුලිල්ලාහ් යැයි පවසන්න).
- අධික නාස්තියක් හෝ අනවශ්‍ය ලෙස සුඛෝපභෝගී වීමක් වන බැවින්, රන් හෝ රිදී භාජනවල (හෝ රන් ආලේපිත භාජනවල) ආහාර ගැනීමෙන් හෝ පානය කිරීමෙන් වළකින්න.

## ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු

### ඉස්ලාමීය දහමට අනුව ජීවනෝපාය උපයා ගැනීම

ඉස්ලාම් දහම මුස්ලිම්වරුන්ට අනුමත වූ සහ නීත්‍යානුකූල මාර්ගවලින් තම ජීවනෝපාය උපයා

ගැනීමට දිරිමත් කරයි. වෙහෙස මහන්සි වී වැඩ කරන සහ තමාගේම මුදල් උපයන පුද්ගලයන්ට ඉස්ලාමය ගරු කරයි. මුස්ලිම්වරුන් ඵලදායී, වගකිවයුතු සහ ස්වාධීන පුද්ගලයන් වීම අල්ලාහ්ගේ ﷻ අපේක්ෂාවයි. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: **සලාතය අවසන් කරනු ලැබුවේ නම්, "ඔබලා පොළොවෙහි විසිරී ගොස්, අල්ලාහ්ගේ දායාදයෙන් සොයාගන්න.** " (62:10)

මුහම්මද් නබි ﷺ තුමා මෙසේ පැවසීය:



**"තම දෑතින් වෙහෙස වී උපයා ගත් ආහාරයට වඩා උතුම් ආහාරයක් කිසිවෙකු මෙතෙක් අනුභව කර නොමැත. අල්ලාහ්ගේ දූතයෙකු වූ දාවූද් (අලෛහි) තුමාණන් පවා තම ජීවනෝපාය සඳහා තමාගේම ශ්‍රමයෙන් වැඩ කළහ." (සහීහ් අල්-බුහාරි)**

ඔහු මෙසේද පැවසීය.: **"යම් පුද්ගලයෙකු අන් අයගෙන් සිගමන් යදිනවාට වඩා, කැලයට ගොස් දර මිටියක් එකතු කර (එය විකුණා ජීවත් වීම) ඔහුට බෙහෙවින් උතුම් වේ." (සහීහ් අල්-බුහාරි)**

## ඉස්ලාමය තුළ සියලුම රැකියාවන්ට ගෞරවය හිමිවේ

ඉස්ලාම් දහම කිසිදු නීත්‍යානුකූල (හලාල්) රැකියාවක් පහත් කොට සලකන්නේ නැත. වෙළඳාම, කර්මාන්ත, ආයෝජන හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක වේවා, එම රැකියාව හලාල් (අනුමත) එකක් වන තාක් කල් එයට උපරිම ගෞරවය හිමිවේ. බොහෝ අල්ලාහ්ගේ දූතවරුන් (නබිවරුන්) සාමාන්‍ය රැකියාවල නිරත වී ඇත: මුහම්මද් නබි ﷺ තුමාණන්: එඬේරෙකු සහ වෙළෙන්දෙකු ලෙස කටයුතු කළහ. දාවූද් (අලෛහි) තුමාණන්: කම්මල්කරුවෙකු ලෙස කටයුතු කළහ.
සකරියා (අලෛහි) තුමාණන්: වඩුවෙකු ලෙස කටයුතු කළහ.

## ඉස්ලාමයේ අනුමත කර ඇති ගනුදෙනු වර්ග

ඉස්ලාම් දහමේ මූලික රීතිය වන්නේ සියලුම ව්‍යාපාරික සහ වෙළඳ ගනුදෙනු සඳහා අවසර ලබා දීමයි. මෙයට පහත සඳහන් දෑ ඇතුළත් වේ: භාණ්ඩ විකිණීම සහ මිලදී ගැනීම, සේවා සැපයීම: විවිධ වෘත්තීය හෝ ශ්‍රම සේවාවන් ලබා දීම සහ ඒ වෙනුවෙන් ගාස්තු අය කිරීම, දේපළ බදු දීම , ව්‍යාපාරික හවුල්කාරිත්වයන් ආයෝජනය සහ වෙළඳාම (පොළියෙන් තොරව සහ වංචාවෙන් තොරව සිදුකරන ඕනෑම ආයෝජනයක්.) අල්ලාහ් අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: **"අල්ලාහ් වෙළෙඳාම අනුමත කර පොලිය තහනම් කළේය."** (2:275)

එබැවින්, ඉස්ලාමීය සාරධර්මවලට අනුකූලව සිදුවන තාක් කල්, ඉස්ලාම් දහම ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පූර්ණ සහයෝගය ලබා දෙයි.

## ගනුදෙනු වලදී තහනම් පිළිවෙත්

බොහෝ ව්‍යාපාරික ගනුදෙනු සඳහා අවසර දී තිබුණද, මිනිසුන්ව හරාම් (තහනම් දේ) සහ අසාධාරණයෙන් ආරක්ෂා කිරීම සඳහා ඉස්ලාම් දහම ඇතැම් ක්‍රියාමාර්ග තහනම් කර ඇත.



**ඉස්ලාමය තුළ තහනම් කර ඇති ගනුදෙනු වර්ග:**

- මත්පැන්, ඌරු මස්, මළ සිරුරු (මියගිය සතුන්ගේ මස්) සහ මත්ද්‍රව්‍ය වැනි හරාම් (තහනම්) දෑ නිෂ්පාදනය කිරීම,

- රිබා (පොළිය හෝ අධික පොළිය) අමතර ගාස්තු අය කිරීමේ පදනම මත ණය ලබා දීමෙන් මුදල් ඉපයීම රිබා ලෙස හැඳින්වේ. මෙය ඉස්ලාම් දහම තුළ දැඩි ලෙස තහනම් කර ඇත. මීට හේතුව වන්නේ එය අසාධාරණයට මග පාදන අතර, පොහොසතුන් සහ දුප්පතුන් අතර පරතරය වැඩි කර සමාජීය හානියක් ඇති කරන බැවිනි අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: **විශ්වාස කළවුනි ඔබලා අල්ලාහ්ට බිය වන්න. ඔබලා විශ්වාසවන්තයින් නම්, පොලියෙහි ඉතිරිව තිබෙන දේ අත්හැර දමන්න.** (2:278)

නබි ﷺ තුමාණෝ මෙසේ පැවසූහ: පොළිය (රිබා) ලබා ගන්නා පුද්ගලයාට ද, එය ලබා දෙන පුද්ගලයාට ද, එය වාර්තා කරන (ලියන) පුද්ගලයාට ද සහ ඒ සඳහා සාක්ෂි දරන්නන්ට ද අල්ලාහ් ශාප කළේය. (සහීහ් මුස්ලිම්)

- **ගරර් (අවිනිශ්චිතභාවය හෝ රවටා ගැනීම)** පැහැදිලිව විස්තර කර නොමැති හෝ අවිනිශ්චිත ස්වභාවයක් සහිත යමක් විකිණීම මෙයට ඇතුළත් වේ.

- සූදුව (මයිසීර් හෝ කිමාර්) සූදුව යනු ඉස්ලාම් දහම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති තවත් එක් ක්‍රියාවකි. ලොතරැයි, ඔට්ටු ඇල්ලීම හෝ කැසිනෝ වැනි, වාසනාව හෝ අහඹු අවස්ථාවන් මත පදනම්ව මුදල් දිනා ගැනීම හෝ අහිමි කර ගැනීම සිදුවන සියලුම ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් වේ. අල්ලාහ් ﷻ අල් කුර්ආනයේ මෙසේ සඳහන් කරයි: **විශ්වාස කළවුනි මත් පැන්ද, සූදු සෙල්ලමද, (නැමදුම් කිරීම සඳහා) සිටවනු ලැබූ ඒවාද, නිමිති බලන ඊතලද පිළිකුල් කළ යුතු ෂෛතාන්ගේ ක්‍රියාවල ඇති ඒවාය. එහෙයින්, ඔබලා ජය ලැබීම පිණිස ඒවායින් වැළකී සිටින්න.** (5:90)

සූදුව (මිනිසා තුළ) ඇබ්බැහි වීමක් ඇති කරන අතර, පවුල් ජීවිත විනාශ කරයි. එමෙන්ම එය කිසිදු මහන්සියකින් තොරව ඇතැම් පුද්ගලයන් වෙත ධනය ගලා ඒමට සලස්වන අතර

තවත් පිරිසකට හානි පමුණුවයි. ඉස්ලාමය අනුමත කරන්නේ කැපවීම, මහන්සිය සහ අවංක වැඩ කිරීම තුළින් පමණක් මුදල් ඉපයීමයි.

- වංචා කිරීම හෝ බොරු කීම: උදාහරණයක් ලෙස අසත්‍ය ප්‍රචාරණය මගින් පාරිභෝගිකයා රැවටීම
- සොරකම් කිරීම හෝ අල්ලස් ලබා දීම සහ ලබා ගැනීම.

## අරාබි නියමයන්

| අරාබි වචනය | අර්ථය | අරාබි වචනය | අර්ථය |
|---|---|---|---|
| අමානහ් | විශ්වාසය | සිද්ක් | සත්‍යවාදී බව |
| අක්ලාක් | ආචාර විධි | සබ්ර් | ඉවසීම |
| ඍෘහ්මා | දයාව | තවද්දු | නිහතමානීකම |
| අෆුව් | සමාව දීම | අදල් | යුක්තිය |
| හයා | සංවරකම | කරම් | ත්‍යාගශීලී බව |
| සිහ්ර් | මැජික් | රිබා | පොළිය |
| සිනා | අනාචාරය | **වලි** | **භාරකරු** |
| මහර් | දෑවැද්ද | හරාම් | තහනම් දේ |
| **හලාල්** | **අනුමත කළ** | **කම්ර්** | මත්පැන් |
| කිමාර් | සූදුව | | |

**මෙම අරාබි වචන කටපාඩම් කර ගැනීමට උත්සාහ කරන්න.**

# අල්කුර්ආන් අක්ෂර පරිවර්තනය

## සූරා අල්-ෆාතිහා (ආරම්භය)

1. බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

بِسْمِ اللهِ الرَّحْمَـٰنِ الرَّحِيمِ

අපරිමිත දයාන්විත , අසමසම කරුණාන්විත , අල්ලාහ්ගේ නාමයෙනි.

2. අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්

الْـحَمْدُ لِلَّهِ رَبِّ الْعَالَمِينَ

සියලු ප්‍රශංසා සහ ස්තුතිය ලෝකයන්හි (මිනිසුන්, ජින්වරුන් සහ පවතින සියල්ලෙහි) අධිපති වන අල්ලාහ්ට හිමි වේ.

3. අර්-රහ්මානිර්-රහීම්.

الرَّحْمَٰنِ الرَّحِيمِ

අපරිමිත දයාන්විත, අසමසම කරුණාන්විත.

4. මාලිකි යව්මිද්දීන්

مَالِكِ يَوْمِ الدِّينِ

විනිශ්චය දිනයේ (එනම් නැවත නැගිටුවීමේ දිනයේ) එකම ස්වාමියා සහ එකම විනිසුරුවරයාණන්ය.

5. ඉයියාක නඃබුදු ව ඉයියාක නස්තඊන්

إِيَّاكَ نَعْبُدُ وَإِيَّاكَ نَسْتَعِينُ

අපි ඔබවම (පමණක්) නමදිමු, තවද අපි ඔබගෙන් ම (සෑම දෙයක් සඳහාම) උදව් පතමු.

6. ඉහ්දිනස් සිරාතල් මුස්තකීම්.

اهْدِنَا الصِّرَاطَ الْمُسْتَقِيمَ

අපට ඍජු මාවත පෙන්වනු මැනව.

7. සිරාතල්ලදීන අන්අම්ත අලෙයිහිම්, ගයිරිල් මග්දූබි අලෙයිහිම් වලාද් දාල්ලීන්.

صِرَاطَ الَّذِينَ أَنْعَمْتَ عَلَيْهِمْ غَيْرِ الْمَغْضُوبِ عَلَيْهِمْ وَلَا الضَّالِّينَ

එය ඔබගේ ආශිර්වාදය (වරප්‍රසාදය) ලත් අයගේ මාවතයි, කෝපයට ලක්වූවන්ගේ හෝ මුළාවූවන්ගේ මාවත නොවේ.

## සූරා අල්-ඉක්ලාස් ඒකදේවවාදය (පාරිශුද්ධත්වය) 112

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

අපරිමිත දයාන්විත , අසමසම කරුණාන්විත , අල්ලාහ්ගේ නාමයෙනි.

1. قُلْ هُوَ اللَّهُ أَحَدٌ

කුල් හුවල්ලාහු අහද්

පවසන්න: අල්ලාහ් ඒකීයය (එක්කෙනෙකි).

2. اللَّهُ الصَّمَدُ

අල්ලාහුස්-සමද්
අල්ලාහ් සියල්ලන්ගෙන් ස්වායත්ත වූ, සියලු සත්ත්වයන්ගේ අවශ්‍යතාවලදී පිහිට පතන (පරිපූර්ණ) ස්වාමියාය. (ඔහු ආහාර අනුභව කරන්නේවත්, පානය කරන්නේවත් නැත).

3. لَمْ يَلِدْ وَلَمْ يُولَدْ

ලම් යලිද් වලම් යූලද්

ඔහු (කිසිවෙකු) ජනිත කළේ නැත, ඔහු (කිසිවෙකුගෙන්) ජනිත වූයේද නැත.

4. وَلَمْ يَكُن لَّهُ كُفُوًا أَحَدٌ

වලම් යකුල්-ලහු කුෆුවන් අහද්

තවද උන්වහන්සේට සමාන වූ හෝ සැසඳිය හැකි කිසිවෙකු නොමැත.

## සූරා අල්-ෆලක් (අරුණෝදය) 113

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

අපරිමිත දයාන්විත , අසමසම කරුණාන්විත , අල්ලාහ්ගේ නාමයෙනි.

1. කුල් අඌදු බි රබ්බිල් ෆලක්

قُلْ أَعُوذُ بِرَبِّ الْفَلَقِ

පවසන්න: අරුණෝදයේ ස්වාමියා වන (අල්ලාහ්) ගෙන් මම ආරක්ෂාව පතමි.

2. මින් ශර්රි මා කලක්

مِن شَرِّ مَا خَلَقَ

උන්වහන්සේ මවා ඇති දේවල්හි ඇති නපුරෙන් (මම ආරක්ෂාව පතමි).

3. ව මින් ශර්රි ගාසිකින් ඉදා වකබ්

وَمِن شَرِّ غَاسِقٍ إِذَا وَقَبَ

තවද, ඝන අඳුර පැතිරෙන විට රාත්‍රියේ ඇති නපුරෙන්ද (එනම් සඳ බැස යන විට හෝ අඳුර පැමිණෙන විට ඇති වන නපුරෙන්ද මම ආරක්ෂාව පතමි).

4. ව මින් ශර්රින් නෆ්ෆාතාති ෆිල් උකද්

وَمِن شَرِّ النَّفَّاثَاتِ فِي الْعُقَدِ

තවද, (නූල්) ගැටවලට පිඹිමින් සූනියම් (ගුරුකම්) කරන්නන්ගේ නපුරෙන්ද (මම ආරක්ෂාව පතමි).

5 ව මින් ශර්රි හාසිදින් ඉදා හසද්

وَمِن شَرِّ حَاسِدٍ إِذَا حَسَدَ

තවද, ඊර්ෂ්‍යා කරන්නෙකු ඊර්ෂ්‍යා කරන විට ඔහුගේ නපුරෙන්ද (මම ආරක්ෂාව පතමි).

## සූරා අන්-නාස් (මිනිස් වර්ගයා) - 114

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්

අපරිමිත දයාන්විත , අසමසම කරුණාන්විත , අල්ලාහ්ගේ නාමයෙනි.

قُلْ أَعُوذُ بِرَبِّ النَّاسِ

1. කුල් අඌදු බි රබ්බින්-නාස්—
   පවසන්න: මිනිස් වර්ගයාගේ ස්වාමියා වන (අල්ලාහ්) ගෙන් මම ආරක්ෂාව පතමි

مَلِكِ النَّاسِ

**2. මලිකින්-නාස්**
(ඔහු) මිනිස් වර්ගයාගේ රජුය.

إِلَـٰهِ النَّاسِ

3. ඉලාහින්-නාස්— මිනිස් වර්ගයාගේ (සැබෑ වූ) දෙවියාය.

مِن شَرِّ الْوَسْوَاسِ الْخَنَّاسِ

4. මින් ශර්රිල් වස්වාසීල් කන්නාස්—
සැඟවී සිට (මිනිස් සිත්වල) නපුරු සැක සංකා ඇති කරන්නාගේ (එනම් අල්ලාහ්ව සිහිපත් කරන විට මගහැර යන සාතන්ගේ) නපුරෙන් (මම ආරක්ෂාව පතමි).

الَّذِي يُوَسْوِسُ فِي صُدُورِ النَّاسِ

5. අල්ලදී යුවස්විසු ෆී සුදූරින්-නාස්— ඔහු (එනම් සාතන්) මිනිසුන්ගේ හදවත් තුළ නපුරු සිතිවිලි ඇති කරයි.

مِنَ الْجِنَّةِ وَالنَّاسِ

6. මිනල් ජින්නති වන්නාස්—
(ඔහු) ජින්වරුන් අතරින් හෝ මිනිසුන් අතරින් විය හැකිය.

# මූලාශ්‍ර :


1- ශුද්ධ වූ කුර්ආනය

2- සුන්නාහ් ග්‍රන්ථ

3- නව මුස්ලිම් මාර්ගෝපදේශය: ජීවිතයේ සෑම අංශයකම නව මුස්ලිම්වරුන් සඳහා සරල රීති සහ වැදගත් ඉස්ලාමීය මාර්ගෝපදේශ (**The New Muslim Guide**) - ෆහ්ද් සලීම් බහම්මාම් විසින් රචිත, මොඩර්න් ගයිඩ් (දාරුස්සලාම්) මගින් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිතයි.

4- මගේ මාවත, ප්‍රයෝජනවත් මඟපෙන්වීම - මුස්ලිම්වරුන් සහ අලුතින් ඉස්ලාමය වැළඳගත් අය සඳහා ඉස්ලාමයේ මූලික කරුණු (**My Path The Beneficial Guide**) - **IPC**-කුවේට් (2013) මගින් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිතයි.

5-නව මුස්ලිම්වරයෙකු සඳහා මාර්ගෝපදේශයක් ( **Guide for the New Muslim**) - ජමාල් අල්-දින් එම්. සරබෝසෝ විසින් රචිතයි.

මෙම මාර්ගෝපදේශය ඉතා පැහැදිලිව සහ සහකම්පනයෙන් යුතුව ලියා ඇත්තේ, ඔබගේ ඇදහිල්ල විශ්වාසයෙන් හා භක්තියෙන් යුතුව පවත්වා ගැනීමට අවශ්‍ය මෙවලම් සහ අවබෝධය ඔබට ලබා දීමේ අරමුණිනි්ය. එය ඔබගේ මාවතට ආලෝකයක් මෙන්ම සැකය හෝ අභියෝගාත්මක අවස්ථාවලදී ශක්තියේ මූලාශ්‍රයක් වේවා

මෙහි ඇතුළත් වැදගත් මාතෘකා කිහිපයක්:

- ඉස්ලාමයේ කුළුණු සහ ඇදහිල්ලේ (ඊමාන්) කුළුණු පිළිබඳ හැඳින්වීමක්.
- මුහම්මද් නබිතුමාගේ ﷺ සංක්ෂිප්ත සහ අර්ථවත් චරිතාපදානයක්.
- විශ්වාසවන්තයෙකුගේ එදිනෙදා ජීවිතය හැඩගස්වන ඉස්ලාමීය සදාචාරය සහ වටිනාකම්.
- පවුල් සහ විවාහ සබඳතා පිළිබඳව සෑම මුස්ලිම්වරයෙකුම දැනගත යුතු කරුණු.
- ආහාර, ඇඳුම් පැළඳුම් සහ මූල්‍ය ගනුදෙනු වලදී හලාල් (අනුමත) සහ හරාම් (තහනම්) පිළිබඳ මාර්ගෝපදේශ.

# මින්හාජ්

## ඔබේ ගමන ඇරඹෙයි....

ඉස්ලාම් දහම තුළ තම නව ජීවිතය ආරම්භ
කරන අය සඳහා වන ප්‍රායෝගික
මාර්ගෝපදේශ පොතකි.

ලතීෆා නාසර් අල් සර්ද්